76 වන කාණ්ඩය
2 වන කලාපය

බදාදා
1968 ජනවාරි 10

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 169]

පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා [තී. 203] :

රසායන පෝර නොමිලයේ බෙදාදීම—යෝජනාව නිෂ්ප්‍රභ විය.

ට්‍රැක්ටර් හා ගොවි උපකරණ ලබාදීම.

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තී. 309]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 76
இல. 2

புதன்கிழமை
10 ஜனவரி 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 169]

தனி அங்கத்தினர் பிரேரணைகள் [ப. 203] :

இலவசமாக உரம் வழங்குதல்—பிரேரணை நிராகரிக்கப்பட்டது.

உழவு இயந்திரங்களும் கமத்தொழிற் கருவிகளும் வழங்குதல்

வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப. 309]

---

Volume 76
No. 2

Wednesday
10th January 1968

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [col. 169]

PRIVATE MEMBERS MOTIONS [col. 203] :

Issue of Free Fertilizers—Motion negatived.

Issue of Tractors and Agricultural Implements

WRITTEN ANSWERS TO QUESTIONS [col. 309]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය
## பிரதிநிதிகள் சபை
## House of Representatives

**1968 ජනවාරි 10 වන බදාදා**

புதன்கிழமை, 10 ஜனவரி 1968

*Wednesday, 10th January 1968*

---

**අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.**

*சபை, பி. ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.*

*The House met at 2 P.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] in the Chair.*

---

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
### சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
### PAPERS PRESENTED

(200 වැනි අධිකාරය වන) දුම්රිය ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ පනවන ලද ව්‍යවස්ථාවක් [ගරු හුරුල්ලේ]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
### வினாக்களுக்கு வாய்மூல விடைகள்
### ORAL ANSWERS TO QUESTIONS

**උඩුගම්පොල ගම් සභාවේ සභාපති: චෙක් පතක් වංචා කිරීම**

*உடுகம்பளை கிராமச் சங்கத் தலைவர்: காசோலை மோசடி*

**CHAIRMAN, UDAGAMPOLA V. C.: MISAPPROPRIATION OF CHEQUE**

1. එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා. (මිනුවන්ගොඩ) (ආචාර්ය එන්. එම්. පෙරේරා—යටියන්තොට—වෙනුවට)

(திரு. எம். பீ. டி சொய்ஸா சிறிவர்தன—மினுவாங்கொட—கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை—சார்பாக)

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda—on behalf of Dr. N. M. Perera—Yatiyantota)

පළාත් පාලන ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් සහ ප්‍රවෘත්ති සහ ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) උඩුගම්පොල කම්කාර්ය සභාවේ සභාපති නමින් මර්කන්ටයිල් බැංකුව වෙත නිකුත් කරන ලද රුපියල් 3,086 ක චෙක් පත (අංක වයි. 250330) ඇස්. ඇෆ්. ද සිල්වා මහතාගේ පුද්ගලික ගිණුමට බැර කරන ලද බව එතුමා දන්නවාද? (ආ) විදුලි බලය සැපයීම සඳහා සහ සිය නිවසට අළුතින් විදුලි බලය සැපයීමේ ගාස්තු වශයෙන් ලීලා ජයතිලක මහත්මිය විසින් මෙම මුදල ගෙවන ලද බව එතුමා දන්නවාද? (ඉ) පරීක්ෂණ කටයුතු සඳහා මෙම කාරණය අපරාධ පරීක්ෂණ අංශයට දැන් භාර දී ඇති බවත් එතුමා දන්නවාද? (ඊ) වංචාවක් සිදුවී ඇති බවට පිළිගත හැකි හේතූන් ඇති බවට දෙපාර්තමේන්තු නිලධාරීන් වාර්තා කර ඇති බැවින්, සභාපතිවරයාගේ වැඩ තහනම් කිරීමට ක්‍රියා කර නොමැත්තේ මන්ද?

*உள்ளூராட்சி அமைச்சரினதும் தகவல், ஒலிபரப்பு அமைச்சரினதும் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா: (அ) உடுகம்பளை கிராமச்சங்கத் தலைவருக்கு எழுதப்பட்ட ரூ. 3086/- க்கான மேக்கன்டைல் வங்கிக் காசோலை (இல. வை 250330), எஸ். எப். டி. சில்வாவின் தனிப்பட்ட கணக்கில் வரவு வைக்கப்பட்டதென்பதை அவர் அறிவாரா? (ஆ) இப்பணம் திருமதி லீலா ஜயத்திலக்கா வினால், தனது இல்லத்திற்கு மின்சார விநியோகத்திற்கும், புதிய மின்சாரத் தொடுப்புகளுக்குமெனக் கொடுக்கப்பட்டதென்பதை அவர் அறிவாரா? (இ) இவ்விடயம் இப்பொழுது விசாரணைக்கென குற்றப் புலன் விசாரணைத் திணைக்களத்திடம் ஒப்படைக்கப்பட்டிருக்கின்றதென்பதையும் அவர் அறிவாரா? (ஈ) திணைக்கள உத்தியோகத்தர்கள், மோசடிக் குற்றத்திற்கான தெட்டத்தெளிவான சான்றுகளிருப்பதாகத் தெரிவித்திருப்*

2——10081—793 (68/1)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.]

பதால், தலைவரை அவரது பதவியிலிருந்து இடைநிறுத்துவதற்கான நடவடிக்கையெதுவும் எடுக்கப்படாததேன் ?

asked the Parliamentary Secretary to the Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information and Broadcasting: (*a*) Is he aware that a cheque for Rs. 3,086 (No. Y 250330) drawn on the Mercantile Bank to the credit of the Chairman, Udagampola V. C., has been credited to the private account of S. F. de Silva ? (*b*) Is he aware that this money was paid by Mrs. Leela Jayatilleke as payment for the supply of electricity and new electricity connections to her home ? (*c*) Is he also aware that the matter has now been handed over to the C. I. D. for investigation ? (*d*) In view of that fact that the Departmental Officers have reported that there is a *prima facie* case of fraud, why has no action been taken to suspend the Chairman from his office ?

**විජයපාල මෙන්ඩිස් මයා. (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්—පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති සහ ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට)**

(*திரு. விஜயபால மெண்டிஸ்—அரசாங்கக் கட்டுவேலை, தபால் தந்திப் போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி—உள்ளூராட்சி அமைச்சரினதும், தகவல் ஒலி பரப்பு அமைச்சரினதும் பாராளுமன்றக் காரியதரிசி சார்பாக*)

(Mr. Wijayapala Mendis—Parliamentary Secretary to the Minister of Public Works, Posts and Telecommunications—on behalf of the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information and Broadcasting)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) ඔව්. (ඊ) සැක සහිත කපටකම හේතුකොටගෙන ගම්සභා පතිවරයකුගේ නිලය තාවකාලිකව තහනම් කිරීම සඳහා ගම්සභා ආඥාපනතේ ප්‍රතිපාදනයක් සකස්කර නැත. ඒ කෙසේ වෙතත්, විභාග කොට අවසන් වූ පසු ගම් සභා ආඥා පනත යටතේ සුදුසු ක්‍රියාමාර්ගයක් ගනු ලබනු ඇත.

## ට්‍රෑම් සේවයේ නියුක්ත වූ අයගේ විශ්‍රාම වැටුප්

*டிராம் சேவை ஊழியர் : இளைப்பாற்றிச் சம்பளம்*

TRAM SERVICE EMPLOYEES : PENSIONS

3. ද සොයිසා සිරිවර්ධන මයා. (ටී. බී. ඉලංගරත්න මයා.—කොලොන්නාව—වෙනුවට)

(*திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னாவ—சார்பாக*)

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. T. B. Ilangaratne—Kolonnawa)

පළාත් පාලන ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) කොළඹ නගර සභාවේ ට්‍රෑම් සේවයේ නියුක්තව සිටි විසි දෙනකුට ට්‍රොලි බස් සේවය නවතා දැමීම නිසා විශ්‍රාම වැටුප් දී තිබෙන බව එතුමා දන්නේද ? (ආ) විශ්‍රාම වැටුප් ගණන් ගැනීමේදී ඔවුන්ගේ ට්‍රෑම් සේවා කාලයෙන් තුනෙන් දෙකක් පමණක් ඇතුළත් කරන බව එතුමා දන්නේද ? (ඉ) විශ්‍රාම වැටුප් ගණන් ගැනීමේදී ඔවුන් ට්‍රෑම් සේවයේ නියුක්තව සිටි සම්පූර්ණ කාලය ඇතුළත් කෙරේද ? (ඊ) නොඑසේ නම්, ඒ මන්ද ?

உள்ளூராட்சி அமைச்சரினதும் தகவல், ஒலி பரப்பு அமைச்சரினதும் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா : (அ) கொழும்பு மாநகரசபையின் "டிரும்" சேவையில் கடமையாற்றிய இருபது பேருக்கு "ரொலி" பஸ் சேவை நிறுத்தப்பட்டதனால், இளைப்பாற்றிச் சம்பளம் வழங்கப்பட்டிருக்கின்றதென்பதை அவர் அறிவாரா ? (ஆ) இளைப்பாற்றிச் சம்பளத்தைக் கணக்கிடும்பொழுது அவர்களின் "டிரும்" சேவைக் காலத்தில் மூன்றில் இரண்டு பகுதியே சேர்த்துக் கொள்ளப்படுகின்றதென்பதை அவர் அறிவாரா ? (இ) இளைப்பாற்றிச் சம்பளத்தைக் கணக்கிடும்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

*பொழுது அவர்கள் "திரும்" சேவையிலீடு பட்டிருந்த சேவைக்காலம் முழுவதும் சேர்த்துக் கொள்ளப்படுமா? (ஈ) இன்றேல், ஏன்?*

asked the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information and Broadcasting: (*a*) Is he aware that twenty persons who were employed in the Tram Service of the Colombo Municipal Council have been retired on pension consequent on the Trolley Service being abolished? (*b*) Is he aware that only two-thirds of their Tram Service is taken into account in computing their pensions? (*c*) Is their entire period of service in the Tram Service taken into account in computing their pensions? (*d*) If not, why?

**විජයපාල මෙන්ඩිස් මයා. (පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට)**

*(திரு. விஜயபால மெண்டிஸ்—உள்ளூராட்சி அமைச்சரினதும், தகவல் ஒலிபரப்பு அமைச்சரினதும் பாராளுமன்றக் காரியதரிசி சார்பாக)*

(Mr. Wijayapala Mendis—on behalf of the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information and Broadcasting)

(අ) ඔව්. (ආ) පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් රෙගුලාසිවල 6 (2) වැනි වගන්තිය ප්‍රකාර විශ්‍රාම වැටුප් සඳහා ගණින් ගනු ලබන්නේ තාවකාලික සේවයෙන් තුනෙන් දෙකක් පමණක්ය. එවැනි විශ්‍රාම වැටුප් දුන් පසු 1957 තේ අංක 15 දරන මහනගර සභා (සංශෝධන) පනතේ 3 (අ) (1) සහ 11 දරන වගන්ති හා එක්වැ කියැවෙන මහනගර සභා ආඥා පනතේ 184 (1) වැනි වගන්තිය යටතේ තාවකාලික සේවාවෙහි ඉතිරි තුනෙන් එක සඳහා වෙනම විශ්‍රාම වැටුපක් දෙනු ලැබේ. ඈත්ත වශයෙන් සම්පූර්ණ කාල පරිච්ඡේදය මේ ප්‍රදාන දෙකෙන් පියැවේ. (ඉ) ඔව්. ඉහත සඳහන් (ආ) බලනු මැනවි. (ඊ) පැන නොනඟී.

වාචික පිළිතුරු

## ආදේශක දුම්රිය පෝටර්වරු

## புகைவண்டி பதிற் சுமைகாரர்

## SUBSTITUTE RAILWAY PORTERS

4. **බී. වයි. තුඩාවේ මයා.** (මාතර—ප්‍රින්ස් ගුණසේකර මයා.—හබරාදුව—වෙනුවට)

*(திரு. பி. வை. துடாவ—மாத்தறை—திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபருதுவ—சார்பாக)*

(Mr. B. Y. Tudawe—Matara—on behalf of Mr. Prins Gunasekera—Habaraduwa)

ප්‍රවාහණ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත ආදේශක පෝටර්වරුන් අන්තර්ග්‍රහණය කිරීමේදී බල පවත්වන රෙගුලාසි පනවා තිබෙනවාද? (ආ) නොඑසේ නම්, ඒ මන්ද? (ඉ) එම රෙගුලාසි පනවනුයේ කවදාද? (ඊ) මේ ආදේශකයින් අන්තර්ග්‍රහණය කිරීමේදී වයස් සීමාවක් නොතකා සේවය කළ කාල සීමාව අනුව ඔවුන් බඳවා ගැනීම වඩා සාධාරණ නොවේදැයි එතුමා සලකා බලනවාද? (උ) වයස් සීමාවක් පැනවීම නිසා යම් හෙයකින් දැනට සිටින ආදේශකයින් විශාල සංඛ්‍යාවකට රක්ෂා නැතිව ගිය හොත් ඔවුනට වෙනත් රැකියා ලබා දීමට හෝ වන්දි ගෙවීමට එතුමා සූදානම්ද?

*போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) இலங்கைப் புகைவண்டிச் சேவையில் கடமையாற்றும் பதில் சுமைகாரர்களை இச் சேவையில் இணைத்துக்கொள்ளும் விதிகள் இயற்றப்பட்டுள்ளனவா? (ஆ) இன்றேல், ஏன்? (இ) அத்தகைய விதிகள் எப்பொழுது கொண்டுவரப்பட்டன? (ஈ) இப்பதில் ஊழியர்களைச் சேர்த்துக் கொள்ளும்பொழுது வயதெல்லையைக் கவனியாது, சேவைசெய்த காலத்திற்கிணங்க அவர்களைச் சேர்த்துக் கொள்வது நியாயமான நடவடிக்கையாகுமென்பதைப்பற்றி அவர் கவனஞ் செலுத்துவாரா? (உ) வயதெல்லையைக் கொண்டு வருவதன் மூலம், ஒருவேளை தற்பொழுது சேவை புரியும் பதில் ஊழியர்கள் பெருந்தொகையானோர் வேலையிழந்தால், அவர்களுக்கு வேறு தொழில் தேடிக் கொடுப்பதற்கு அல்லது நட்டஈடு வழங்குவதற்கு அவர் தயாராயிருக்கிறாரா?*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

[තුඩාවේ මයා.]

asked the Minister of Communications: (a) Have regulations governing the absorption of substitute porters employed in the Railway Department been brought into force? (b) If not, why? (c) When will these regulations be brought into force? (d) Will he consider whether it would not be more equitable to absorb these substitutes on the basis of their period of service, without enforcing an age limit? (e) If an age limit is enforced and it so happens that a large number of the present substitutes thereby lose employment is he prepared to either provide alternative employment for them or to pay compensation to them?

**ගරු ඊ. එල්. බී. හුරුල්ලේ (ප්‍රවාහන ඇමති)**

*(கௌரவ ஈ. எல். பி. ஹுரூல்ல—போக்குவரத்து அமைச்சர்)*

(The Hon. E. L. B. Hurulle—Minister of Communications)

(අ) ඔව්. (ආ) ඉහත (අ) නිසා පැන නොනගී. (ඉ) ඉහත (අ) නිසා පැන නොනගී. (ඊ) නැත. (උ) ආදේශක පෝටර්වරුන්ගේ වයස් සීමාව අවුරුදු 30 දක්වා වැඩි කොට, දුම්රිය දෙපාර්තමේන්තුවේ පෝටර්වරුන්ගේ ශ්‍රේණියට නිරන්තර යෙන්ම, පුරප්පාඩු පහක් සඳහා එක ආදේශකයෙකු යන පදනම මත ආදේශකයින් අන්තර්ග්‍රහණය කර ඇති අතර, ඉතිරි පුරප්පාඩු රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටියක් මත සේවක දරුවන්ගෙන් හා රැකී රක්ෂා කාර්යාල මගින් පුරවා ඇත. ආදේශක පෝටර්වරුන් සම්බන්ධයෙන් මෙකී වයස් සීමාව අවුරුදු 35 තෙක් වැඩි කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට නිර්දේශ කිරීමට දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් ක්‍රියා කර ගෙන යනු ලැබේ. එම නිසා ආදේශක පෝටර්වරුන්ට වන්දි ගෙවීමේ හෝ විකල්ප රැකියා සෙවීමේ ප්‍රශ්නය පැන නොනගී.

වාචික පිළිතුරු

## සිංහල ලිපි ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම සඳහා රජය දරන වියදම

*சிங்களக் கடிதங்களை ஆங்கிலத்தில் மொழி பெயர்த்தற்கேற்படும் அரசாங்கச் செலவு*

## GOVERNMENT EXPENDITURE ON TRANSLATION OF SINHALA CORRESPONDENCE INTO ENGLISH

5. **ද සොයිසා සිරිවර්ධන මයා.** (ප්‍රින්ස් ගුණසේකර මයා. වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. பிறின்ஸ் குணசேக்கர சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Prins Gunasekera)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අංක 700 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ උප ලේඛනයේ උපදෙස් අනුව සිංහල ප්‍රවීණතාව ලැබ රු. 500 ප්‍රසාද දීමනාව ලැබූ ආදි ප්‍රවේශක නිලධාරීන්ට ලිපිගොනුවල තම රාජකාරි සටහන් ඉංග්‍රීසියෙන් පමණක් තැබීමට අවසර තිබේද? (ආ) රාජ්‍ය භාෂාව නොදත් මාණ්ඩලික නිලධාරීන්ගේ පහසුව තකා රජ බසින් ලැබෙන ලිපි හා පිටත යවන පිළිතුරු ලිපි ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම සඳහාත්, ඉංග්‍රීසියෙන් පමණක් රාජකාරි සටහන් ලිපිගොනුවල ලිවීම සඳහාත්, සිංහල ප්‍රවීණතාව ලැබ රුපියල් පන්සියයේ දීමනාව ලැබූ නිලධාරීන්ට අතිකාල දීමනා ගෙවීම අංක 700 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ උප ලේඛනයේ අන්තිම ඡේදයේ උපදෙස් අනුව නීත්‍යානුකූලද? (ඉ) මහා භාණ්ඩාගාරයේ පමණක් මෙලෙස ඉංග්‍රීසි පරිවර්තනය සැපයිය යුතු ආයතන අධ්‍යක්ෂවරුන් කී දෙනෙක් සිටින්ද? ලිපිකරුවන් කීදෙනෙක් සිටින්ද? (ඊ) මෙලෙස, 1966-67 වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරයේ පමණක් රාජ්‍ය භාෂාව නොදැනීම නිසා ඉංග්‍රීසි පරිවර්තන සැපයීම සඳහා ආයතන අධ්‍යක්ෂවරුන් උදෙසා කොපමණ මුදලක් අතිකාල දීමනා වශයෙන් වැය කරන ලද්දේද? සිංහල ප්‍රවීණතා නැති ලිපිකරුවන්ට ඉංග්‍රීසි පරිවර්තන සැපයීම සඳහා අතිකාල දීමනා වශයෙන් කොපමණ මුදලක් වැය කරන ලද්දේද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) 700 ஆம் இலக்கத் திறைசேரிச் சுற்று அறிக்கையின், உபபிரிவில் குறிப்பிட்டுள்ளபடி சிங்கள மொழித் தேர்ச்சிபெற்று ரூபா 500 நன்கொடையாகப் பெற்ற பழைய உத்தியோகத்தர்கள்,*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கடிதக் கோவைகளில் தமது கடமைக் குறிப்புகளை ஆங்கிலத்தில் மாத்திரம் எழுதிவைக்க அனுமதி உண்டா? (ஆ) அரசகரும மொழி தெரியாத பதவி உத்தியோகத்தர்களின் வசதிக்காக, அரசகருமமொழியில் கிடைக்கும் கடிதங்களையும், வெளியே அனுப்பப்படும் கடிதங்களையும் ஆங்கிலத்தில் மொழிபெயர்ப்பதற்காகவும், ஆங்கிலத்தில் மாத்திரம் கடமைக் குறிப்புகளை கடிதக்கோவையில் எழுதுவதற்காகவும் சிங்களத் தேர்ச்சிபெற்று, ரூபா 500 நல்லூதியமும் பெற்ற உத்தியோகத்தர்களுக்கு, மேலதிக நேரச் சம்பளம் வழங்குவது 700 ஆம் இலக்கத் திறைசேரிச் சுற்றறிக்கையின் உபபிரிவின் இறுதிப்பந்தியின் ஏற்பாடுகளுக்கிணங்க, சட்ட ரீதியாகுமா? (இ) திறைசேரியில் மாத்திரம் இவ்விதம் ஆங்கில மொழிபெயர்ப்புக்களை வழங்குகின்ற நிறுவன அதிகாரிகள் எத்தனை பேருள்ளனர்? (ஈ) இவ்விதமாக, 1966/67 ஆம் ஆண்டில், திறைசேரியில் மாத்திரம், அரசகரும மொழியை அறியாததன் காரணமாக, ஆங்கில மொழிபெயர்ப்புக்களை வழங்குவதற்காக நிறுவன அதிகாரிகளுக்கென எவ்வளவு பணம், மேலதிக நேரச் சம்பளத்திற்காகச் செலவு செய்யப்பட்டது? சிங்களத் தேர்ச்சிபெறாத எழுதுவினைஞர்களுக்கு ஆங்கில மொழிபெயர்ப்பை அளிப்பதற்காக, மேலதிக நேரச் சம்பளமாக எவ்வளவு பணம் செலவு செய்யப்பட்டது?

asked the Minister of Finance: (*a*) Have old-entrant officers who have acquired proficiency in Sinhala and thereby received the bonus of Rs. 500 in terms of the schedule to Treasury Circular No. 700, been permitted to make their official minutes in files in English only? (*b*) In terms of the last paragraph of the schedule to Treasury Circular No. 700, is it legal to pay overtime to officers who have acquired proficiency in Sinhala and received the bonus of Rs. 500, for translating into English for the benefit of staff-officers who do not know the official language the letters that are received in the official language and the reply-letters that are sent out, and for writing in English only their minutes in official files? (*c*) In the General Treasury alone how many Directors of Establishments are there who require English translations and also how many such clerks? (*d*) In the General Treasury alone what sum of money was expended as overtime payments during the year 1966-67 for providing English translations for the benefit of clerks who do not know the official language?

**එන්. විමලසේන මයා. (මුදල් ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

(திரு. என். விமலசேன—நிதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. N. Wimalasena—Parliamentary Secretary to the Minister of Finance)

(අ) නැත. (ආ) සාමාන්‍ය කාර්යාල වේලාවෙන් බැහැරව පරිවර්තන වැඩ කරන ලද, එමෙන්ම අතිකාල දීමනා ලැබීම සඳහා සුදුසුකම් ඇති නිළධාරීන්ට අතිකාල දීමනා ගෙවීම ආණ්ඩුවේ මුදල් රෙගුලාසිවලට අනුකූලවේ. (ඉ) (i) භාණ්ඩාගාරයේ සිටින්නේ එක් ආයතන අධ්‍යක්ෂවරයෙක් පමණකි. ඔහුට සිංහල ප්‍රවීණතාවය තිබෙන නිසා පරිවර්තන අවශ්‍යවන්නේ නැත. (ii) එවැනි ලිපිකරුවෝ 21 දෙනෙක් භාණ්ඩාගාරයේ සිටිත්. (ඊ) (i) ආයතන අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රයෝජනය සඳහා ඉංග්‍රීසි පරිවර්තන සැපයීම පිණිස භාණ්ඩාගාරය 1966/67 වර්ෂයේදී අතිකාල දීමනා වැයකර නැත. (ii) රාජ්‍ය භාෂාව නොදත් ලිපිකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ඉංග්‍රීසි පරිවර්තන සැපයීම සඳහා පමණක් අතිකාල දීමනා ලෙස වැය කරන මුදල් පිළිබඳව තොරතුරු වෙනම නොමැත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**හිඟුරලකන්ද මාතෘ නිවාසය සඳහා ජම්බෝලගහවත්ත ඉඩම රජයට ගැනීම**

இங்குரலகந்தை மகப்பேற்று மனைக்கு ஜம்போலகஹா வத்தையை உடைமையாக்கல்

**ACQUISITION OF JAMBOLAGAHAWATTE FOR HINGURALAKANDA MATERNITY HOME**

6. **ද සොයිසා සිරිවර්ධන මයා.** (ඩී. පී. ආර්. වීරසේකර මයා.—දෙහිඕවිට—වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—தெகியோவிற்ற—சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. D. P. R. Weerasekera—Dehiowita)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) හිඟුරලකන්ද මාතෘ නිවාසය තැනීමේදී එයට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය සඳහා ජම්බෝලගහ වත්ත කියන ඉඩම අයිතිකරුවන්ට රජය මුදල් ගෙවා ඉඩම අයත් කර ගෙන තිබේද? (ආ) මෙම ඉඩමේ කොටස් කරුවෙකු වන ඒ. ඩබ්ලිව්. අල්විස් නැමැත්තාද තම කොටසට රුපියල් 18.96 ක්, 1953.10.3 දින හා අංක 012839 දරන මුදල් ඇණවුම් පත අනුව තමාට ලැබිය යුතු මුදල් ප්‍රමාණය වශයෙන් ලබාගෙන තිබේද? (ඉ) මේ නැනැත්තා තම ඉඩම් කොටස මුදලට රජයට දුන්නා මිස ඉඩම පරිත්‍යාග නොකොට ඇති බැව් මේ අනුව එතුමා දන්නවාද?

*சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) இங்குரலகந்தை மகப்பேற்று மனையை நிறுவ, அதற்குத் தேவையான அளவு காணிக்காக ஜம்போலகஹாவத்தை என்ற காணியின் சொந்தக்காரர்களுக்கு அரசாங்கம் பணம் செலுத்திக் காணியை உடைமையாக்கிக்கொண்டுள்ளதா? (ஆ) அக்காணியின் உடைமையாளர்களில் ஒருவரான ஏ. டபிள்யு. அல்விஸ் என்பவரும் தமது பங்காகிய ரூபா 18.96 ஐ 3.10.1963 தேதிய 012839 ஆம் இலக்கக் காசுக்கட்டளை மூலம் பெற்றுக்கொண்டுள்ளாரா? (இ) அதனால், இவர் தன்னுடைய காணிப்பங்கை அரசாங்கத்துக்குப் பணத்திற்கு விற்றிருக்கிறுரே யன்றி, காணியைக் கொடையாக வழங்கவில்லை என்பதை அவர் அறிவாரா?*

asked the Minister of Health: (*a*) Has the Government acquired the land called Jambolagahawatte for the construction of the Hinguralakanda maternity home by purchasing it from the owners? (*b*) Has one A. W. Alwis, one of the co-owners of the land, too, received Rs. 18.96 being his share of the payment, by money order No. 012839 of 3.10.1963? (*c*) Is he aware, that in view of this, this person has sold his portion of the land to Government, and has not donated it?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (සෞඛ්‍ය ඇමති)**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன—சுகாதார அமைச்சர்)*

(The Hon. M. D. H. Jayawardena—Minister of Health)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) ඔව්.

**දොඩාවත්ත පාසලේ ගුරුවර ඩී. ජී. දයාවතී මිය.**

டீ. ஜீ. தயாவதி, ஆசிரியர், தொடாவத்தைப் பாடசாலை

**D. G. DAYAWATHIE, TEACHER, DODAWATTE SCHOOL**

7. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (පානදුර) වීරසේකර මයා. වෙනුවට)

*(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை—திரு. வீரசேக்கர சார்பாக)*

(Mr. Leslie Goonewardene—Panadura —on behalf of Mr. Weerasekera)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) දොඩාවත්ත පාසැල 1967.3.14 දින රජයට භාර ගත් නමුත් එහි සේවය කළ ඒ. ඇම්. ගුණසේකර, ඩී. ජී. දයාවතී, වී. කරුණාරත්න, කේ. ඩබ්ලිව්. ඩිංගිරි මැණිකේ නමැති ගුරු මණ්ඩලය එම පාසැල පවරා ගත් විට රජයේ සේවයට ඇතුළත් කළේද? (ආ) එසේ ඇතුළත් නොකළේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මන්ද? (ඉ) මේ ගුරු මණ්ඩලයේ අය ගෙන් තිදෙනෙක් පමණක් 1967 ජූලි මස 7 දින සිට රජයේ ගුරු සේවයට බඳවා ගෙන සිටිත්ද? (ඊ) එසේ බඳවා ගත්තේ කුමන වැඩ පිළිවෙලක් යටතේද? (උ) එහි සේවය කළ ඩී. ජී. දයාවතී නමැත්ති යට එම සේවය අහිමි වී ඇති නමුත් ඇයට අන් අයට මෙන් පත්වීමක් නුදුන්නේ මන්ද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) தொடாவத்தை பாடசாலை யை 14.3.1967 அன்று அரசாங்கம் பொறுப் பேற்றதெனினும் அங்கு சேவைசெய்த ஏ. எம். குணசேகர, டீ. ஜீ. தயாவதி, வீ. கருணா ரத்ன, கே. டபிள்யு. டிங்கிரி மெனிக்கே ஆகிய ஆசிரியர்களும் அப்பாடசாலையை அரசாங்கம் பொறுப்பேற்றபோது அரசாங்க சேவைக்கு சேர்த்துக்கொள்ளப்பட்டனரா? (ஆ) அவ் வாறு ஏன் சேர்த்துக்கொள்ளப்படவில்லை? (இ) இந்த ஆசிரியர்களில் மூவர் மாத்திரம் 1967 ஆம் ஆண்டு ஜுலை 7 ஆம் தேதி அர சாங்க ஆசிரியர் சேவையில் சேர்த்துக் கொள் ளப்பட்டுள்ளனரா? (ஈ) எந்த வேலைத்திட்டத் தின் அடிப்படையில் அவ்வாறு சேர்த்துக் கொள்ளப்பட்டனர்? (உ) அங்கு ஆசிரிய ராகச் சேவை செய்த டீ. ஜீ. தயாவதி என்ப வருக்கும் மற்றவர்களைப் போல் நியமனம் ஏன் வழங்கப்படவில்லை?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) Although the Dodawatte School was taken over by Government on 14.3.1967, were the tutorial staff attached to the school, namely, A. M. Gunasekera, D. G. Dayawathie, V. Karunaratne and K. W. Dingiri Menike, absorbed into Government service at the time of the takeover? (*b*) Why were they not absorbed? (*c*) Have only three members of the staff referred to above been recruited as Government teachers since July 7, 1967? (*d*) What was the scheme under which they were recruited? (*e*) Why was D. G. Dayawathie, who had worked as a teacher at this school, not given an appointment as was done in the case of the others?

**ගාමිණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. காமனி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

(*a*) No. Only Mr. A. M. Gunasekera, Mr. D. V. Karunaratne and Miss K. W. Dingirimenike were given appointments under the Government with effect from 9.7.1967. (*b*) According to the average attendance of the school only three teachers could be appointed. (*c*) Yes, with effect from 9.7.1967. (*d*) According to the average attendance in the second term of 1966 and the seniority of the teachers who served at the school. (*e*) Only three teachers could be appointed according to the average attendance. Mrs. D. G. Dayawathie joined the school last. Therefore, she has not been appointed.

## මාලිගාවත්තේ හදිසි නිවාස ක්‍රමය: ගෙවල් කුලී

*மாளிகாவத்தை அவசரகால வீடமைப்புத் திட்டம்: வாடகை*

## EMERGENCY HOUSING SCHEME, MALIGAWATTE: RENTS

8. **තුඩාවේ මයා.** (පී. ජී. බී. කෙනමන් මයා.—මැද කොළඹ තුන්වන මන්ත්‍රී—වෙනුවට)

*(திரு. துடாவ—திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி மூன்றும் அங்கத்தவர் சார்பாக)*

(Mr. Tudawe—on behalf of Mr. P. G. B. Keuneman—Third Colombo Central)

කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කොළඹ මාලිගා වත්තේ පිහිටි හදිසි අවසථා නිවාස යෝජනා ක්‍රමයේ තාවකාලික ලී ගෙවල් හයක් ඇති බවත් ඒවායේ පදිංචිකරුවන් ගෙන් රුපියල් විස්සක මාසික කුළියක් අයකරන බවත් එවැනිම අනෙක් නිවාස වල පදිංචිකරුවන්ගෙන් මාසික කුළිය වශයෙන් අයකරනු ලබන්නේ රුපියල් දහයක් පමණක් බවත් එතුමා දන්න වාද? (ආ) මෙයට හේතුව කුමක්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]
මෙම නිවාසවල කුළිය රුපියල් දහය දක්වා අඩුකිරීමට එතුමා කටයුතු කරන්නේ ද ? නැත්නම් ඒ මන් ද ?

*தொழில், தொழில்வசதி, வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா: (அ) கொழும்பு, மாளிகாவத்தை, அவசரகால வீடமைப்புத் திட்டத்தில் மரத்தால் நிறுவப்பட்ட ஆறு தற்காலிக வீடுகள் இருப்பதையும் அவற்றில் வாடகைக்கு வசிப்போரிடமிருந்து மாதமொன்றுக்கு 20 ரூபா வாடகை அறவிடப்படுவதையும், ஆனால் அதேநேரத்தில் அதே வகையான வேறு வீடுகளில் வசிப்போரிடமிருந்து மாதமொன்றுக்கு 10 ரூபா மாத்திரம் வாடகையாக அறவிடப்படுகிறதென்பதையும் அவர் அறிவாரா ? (ஆ) இதற்கான காரணம் என்ன ? (இ) இந்த வீடுகளுக்கான வாடகையை 10 ரூபாவாகக் குறைக்க அவர் நடவடிக்கை எடுப்பாரா ? இல்லையெனில், ஏன் ?*

asked the Minister of Labour, Employment and Housing: (*a*) Is he aware that there are six temporary wooden houses at the Emergency Housing Scheme, Maligawatte, Colombo, whose tenants are charged a rent of Rs. 20 a month, whereas tenants of other similar houses are charged only Rs. 10 a month as rent ? (*b*) What is the reason for this ? (c) Will he see that the rent of these houses is reduced to Rs. 10 a month ; and if not, why ?

**විජයපාල මෙන්ඩිස් මයා. (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති වෙනුවට)**

*(திரு. விஜயபால மெண்டிஸ்—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சர் சார்பாக)*

(Mr. Wijayapala Mendis—on behalf of the Minister of Labour, Employment and Housing)

(අ) නැත. මෙම යෝජනා ක්‍රමයේ ඇති තුන් වර්ගයකට අයත් නිවාසවල කුළිය මෙසේ ය: (i) වර්ග අඩි 292 ක්වූ කබුක් කලින් බඳින ලද නිවාසයකට රු. 20, (ii) වර්ග අඩි 238 ක්වූ තනි ලෑලි නිවාසයකට රු. 18.50, (iii) වර්ග අඩි 192 ක්වූ පේලි නිවාසවල ගෙයකට රු. 7.50. (ආ) පැන නොනගී. (ඉ) පැන නොනගී.

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වඩුවන්ට හා පෙදරේරුවන්ට අවශ්‍ය උපකරණ

*காணி அபிவிருத்திப் பகுதி : தச்சர்களுக்கும் மேசன் மாருக்கும் உபகரணங்கள்*

**LAND DEVELOPMENT DEPARTMENT : TOOLS FOR CARPENTERS AND MASONS**

9. **තුඩාවේ මයා.** (කෙනමන් මයා. වෙනුවට)

*(திரு. துடாவ—திரு. கெனமன் சார்பாக)*

(Mr. Tudawe—on behalf of Mr. Keuneman)

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වඩුවන්ට හා පෙදරේරුවන්ට අවශ්‍ය උපකරණ සපයා දීම හෝ එසේ නැති නම් සිය උපකරණ මිළ දී ගැනීම සඳහා වඩුවන්ට රු. 50 ක වාර්ෂික දීමනාවක් හා පෙදරේරුවන්ට රු. 15 ක වාර්ෂික දීමනාවක් ගෙවීම පිළිබඳ ව 1966 නොවැම්බර් 9 වන දින මැද කොළඹ තුන් වන මන්ත්‍රීට එතුමා විසින් දෙන ලද පිළිතුරට (හැන්සාඩ් වාර්තාවේ 70 වන කාණ්ඩලයේ අංක 13නේ 1761/2 වන තීරු) අමතර ව, පහත සඳහන් කරුණු එතුමා සඳහන් කරනවාද :—(i) භාණ්ඩාගාරයෙන් ලැබී ඇති පිළිතුර කුමක් ද? (ii) මේ කරුණු සම්බන්ධයෙන් දැනට පවතින තත්ත්වය කුමක් ද ?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா : காணி அபிவிருத்திப் பகுதித் தச்சர்களுக்கும், மேசன்மாருக்கும் அவசியமான உபகரணங்களை வழங்கவேண்டும் அன்றேல் அவர்கள் தமது உபகரணங்களை வாங்கிக்கொள்ளுதற்கான வருடாந்தப் படியாக முறையே தச்சர்களுக்கு 50 ரூபாவும், மேசன்மாருக்கு 15 ரூபாவும் வழங்கப்படவேண்டுமென்று கொழும்பு மத்தி மூன்றாவது உறுப்பினரின் வினாவுக்கு (ஹன்சாட் தொகுதி 70 : இல. 13, பக்கம் 176/2) 1966 நவம்பர் 9 ஆம் தேதியன்று அவர் அளித்த விடையைத் தொடர்ந்து— (i) திறைசேரியிலிருந்து என்ன பதில் வந்தது என்பதை அவர் தெரிவிப்பாரா ? (ii) இந்த விடயம் சம்பந்தமான தற்போதைய நிலைமை என்ன ?*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

asked the Minister of Land, Irrigation and Power—Further to his reply on 9th November, 1966 to the 3rd Member for Colombo Central (HANSARD Vol. 70, No. 13 Cols. 1761/2) regarding the Provision of the necessary tools to carpenters and masons of the Land Development Department or, alternatively the payment of an annual allowance of Rs. 50 to carpenters and Rs. 15 to masons to buy their own tools, will he state: (i) What reply has been received from the Treasury? (ii) What is the present position in regard to this matter?

සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. சீ. பீ. ஜே. செனெவிரத்ன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. C. P. J. Seneviratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)

(i) අංක 712 ඊ 214/1 සී.සී. හා 67.12.18 දින දරණ ලිපියෙන් වඩුවෙකුට වර්ෂයකට රු. 15 බැගින් ද පෙදරේරුවකුට වර්ෂයකට රු. 5 බැගින් ද මෙම මුදල් වර්ෂයේ සිට ආයුධ මිළ දී ගැනීම සඳහා දීමනාවක් ගෙවීම භාණ්ඩාගාරය අනුමත කර ඇත. තවද 66.11.9 දින මා දුන් පිළිතුරේ සඳහන් කළ පරිදි වඩුවෙකුට වර්ෂයකට රු. 12 ක දීමනාව ගෙවීම පසුගිය මුදල් වර්ෂ දෙක සඳහාද අනුමත කර ඇත. (ii) භාණ්ඩගාරයෙන් අනුමත කර ඇති පරිදි මෙම දීමනාව ගෙවීමට ක්‍රියා කරනු ලැබේ.

## පුත්තලම නගර සභාවේ විශේෂ කොමසාරිස්

### புத்தளம் நகரசபை விசேட ஆணையாளர்

### SPECIAL COMMISSIONER, URBAN COUNCIL, PUTTALAM

10. තුඩාවේ මයා. (කෙනමන් මයා. වෙනුවට)

(திரு. துடாவ—திரு. கெனமன் சார்பாக)

(Mr. Tudawe—on behalf of Mr. Keuneman)

පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පුත්තලම නගර සභාවේ කටයුතු පාලනය කරන විශේෂ කොමසාරිස්වරයා කවුද? හෙතෙම පුත්තලමේ පදිංචියව සිටියිද? (ආ) නොඑසේ නම්, මෙම කාර්යය සඳහා ඔහු පුත්තලමට යන්නේ කවර කාලසීමාවකට වරක් බැගින් ද? (ඉ) පුත්තලමේ පදිංචි, සුදුසු නිළධාරියකු මෙම කාර්යය සඳහා පත් කිරීම ගැන එතුමා සලකා බලන්නේද? නො එසේ නම් මන්ද?

உள்ளூராட்சி அமைச்சரினதும் தகவல், ஒலிபரப்பு அமைச்சரினதும் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா: (அ) புத்தளம் நகர சபையின் அலுவல்களை நிருவகிக்கும் விசேட ஆணையாளர் யார்? அவர் புத்தளத்தில் வசிக்கிறாரா? (ஆ) இல்லையெனில், அவர் தனது கடமையையாற்றுவதற்கு எத்தனை தடவைகள் புத்தளத்துக்குச் செல்கிறார்? (இ) இந்தக் கடமையைச் செய்வதற்கு புத்தளத்தில் வசிக்கும் ஒரு தகுதியான உத்தியோகத்தரை நியமிப்பதற்கு அவர் ஆலோசிப்பாரா? இல்லையெனில், ஏன்?

asked the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information and Broadcasting: (*a*) Who is the Special Commissioner who administers the affairs of the Urban Council, Puttalam, and does he reside in Puttalam? (*b*) If not, how often does he go to Puttalam for this work? (c) Will he consider appointing a suitable officer who resides in Puttalam to do this work and if not why?

**විජයපාල මෙන්ඩිස් මයා. (පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට)**

(திரு. விஜயபால மெண்டிஸ்—உள்ளூராட்சி அமைச்சரினதும், தகவல், ஒலிபரப்பு அமைச்சரினதும் பாராளுமன்றக் காரியதரிசி சார்பாக)

(Mr. Wijayapala Mendis—on behalf of the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information and Broadcasting)

(අ) පුත්තලම-හලාවත දිසාවේ පළාත් පාලන සහකාර කොමසාරිස් වන, ලංකා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයපාල මෙන්ඩිස් මයා.]
පරිපාලන සේවයේ ඇල්. ජී. ඊ. වික්‍රමසේකර මහතා. නැත. (ආ) සතියකට දෙවරක්. (ඉ) නැත. මෙම දිසාව භාරව කටයුතු කරන පළාත් පාලන සහකාර කොමසාරිස් විශේෂ කොමසාරිස් ලෙස කටයුතු කරන නිසා.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
විශේෂ කොමසාරිස්තුමා පුත්තලමේ හෝ හලාවත පදිංචි නැත්නම් පදිංචිව සිටින්නේ කොහේද? අනුරාධපුරයේ නොවේද?

**විජයපාල මෙන්ඩිස් මයා.**
*(திரு. விஜயபால மெண்டிஸ்)*
(Mr. Wijayapala Mendis)
ඒ ප්‍රශ්නයට පිළිතුරක් දෙන්නය කියා මම ඇමතිතුමාට කියන්නම්.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)
විශේෂ කොමසාරිස්තුමා පුත්තලම සහ හලාවත යන නගරවලින් හැතැප්ම 20 කට වඩා දුර වූ ස්ථානයක පදිංචිව සිටිනවා නම් නියමිත වේලාවට පැමිණීමට එය බාධාවක් වන නිසා ඊට වඩා කිට්ටු ස්ථානයක එතුමා පදිංචි කරවීම ගැන හෝ එසේ නැත්නම් ඊට වඩා කිට්ටු ස්ථානයක පදිංචිව සිටින කෙනකු කොමසාරිස් ධුරයට පත්කිරීම ගැන හෝ සැලකිල්ල යොමු කරන්නට පුළුවන්ද කියා දැන ගන්නට කැමතියි.

**විජයපාල මෙන්ඩිස් මයා.**
*(திரு. விஜயபால மெண்டிஸ்)*
(Mr. Wijayapala Mendis)
එය ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට භාජන වන හැටියට ඉදිරිපත් කරනවා.

**එම්. තෙන්නකෝන් මයා.** (නිකවැරටිය)
*(திரு. எம். தென்னக்கோன்—நிக்கவரட்டிய)*
(Mr. M. Tennakoon—Nikaweratiya)
ඇයි මේ නිලධාරී මහත්මයාට පුත්තලමේ ඉන්නට බැරි? මොකක්ද හේතුව? කරුණා කර ගරු ඇමතිතුමා ඒ ගැන සොයා බලනවාද?

**විජයපාල මෙන්ඩිස් මයා.**
*(திரு. விஜயபால மெண்டிஸ்)*
(Mr. Wijayapala Mendis)
ඒ ගැනත් සෝදිසි කර බලන්නැයි කියන්නම්.

### කළු/අරකාවිල පාසලට යන පාර

*கல/அறகாவில பாடசாலைக்குப் போகும் தெரு*

KL/ARAKAWILA SCHOOL : APPROACH ROAD

11. ද සොයිසා සිරිවර්ධන මයා. (රත්න සිරි වික්‍රමනායක මයා.—හොරණ—වෙනුවට)
*(திரு. டி சொய்சா சிறிவர்தன—திரு. ரத்ன ஸிரி விக்ரமநாயக்க—ஹொறன—சார்பாக)*
(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Ratnasiri Wickramanayaka—Horana)
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කළු/අරකාවිල පාසැලට යැමට අවශ්‍ය පාර තවම ලබාගෙන නැති බව එතුමා දන්නවාද? (ආ) මේ පාර ලබාගැනීමට අවශ්‍ය පියවරවල් නොපමාව ගන්නවාද?

*கல்வி, கலாசார அமைச்சரைக் கேட்ட வினா: (அ) கல/அறகாவில பாடசாலைக்குப் போவதற்குத் தேவையான தெருவை இன்னும் பெற்றுக்கொள்ளாமலிருப்பதை அவர் அறிவாரா? (ஆ) அந்தத் தெருவைப் பெற்றுக்கொள்ளத் தேவையான நடவடிக்கைகளைத் தாமதமின்றி அவர் எடுப்பாரா?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that the approach road to KL/Arakawila School has not been acquired so far? (*b*) Will he take the necessary steps early to acquire this road?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
(අ) ඔව්. (ආ) පාසැල් ඉඩමට ප්‍රවේශ මාර්ගයක් ලබාගැනීමට අවශ්‍ය පියවරවල් දැනටමත් ගෙන ඇත.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
මේ විදුහල ආරම්භ කරන ලද්දේ වර්ෂයේදීදැයි කියන්නට පුළුවන්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

එහෙම කියන්නට පුළුවන්කමක් නැහැ. කොයි වර්ෂයේදීදැයි එක පාරටම කියන්නට පුළුවන්කමක් මට නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

එහෙම නම්, මේ විදුහල රජයේ භාරයට ඇවිත් කොපමණ කල් ගත වී තිබේදැයි කියන්නට පුළුවන්ද?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

ඒකත් කියන්නට බැහැ.

## එල්. ජී. ඩී. දියෙස් මහතා, ග්‍රාම සේවක, නිල්ගල වසම, වෙල්ලස්ස

திரு. எல். ஜீ. டீ. தியெஸ், கிராம சேவகர், நில்கல வசம, வெல்லஸ

MR. L. G. D. DIAS, GRAMASEVAKA, NILGALA WASAMA, WELLASSA

12. **කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා.** (සොරනාතොට—රාජා වෙලේගම මයා.—මොනරාගල—වෙනුවට)
*(திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா—சொரணத்தோட்டை—திரு. ராஜா வெலேகம—மொனராகலை—சார்பாக)*
(Mr. K. Y. M. Wijeratne Banda—Soranatota—on behalf of Mr. Raja Welegama —Monaragala)

ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මොණරාගල දිසාපති විසින්, මොණරාගල දිස්ත්‍රික්කයේ වෙල්ලස්ස ප්‍රා. ආ. නි. කොට්ඨාසයේ නිල්ගල වසමේ ග්‍රාම සේවක ඇල්. ජී. ඩී. දියෙස් මහතාගේ වැඩ 1966 ජූලි 22 දින සිට තහනම් කර ඇති බව එතුමා දන්නවාද? (ආ) ඔහුගේ වැඩ තහනම් කිරීමට හේතුවූ චෝදනා මොනවාද? (ඉ) වැඩ තහනම් කර මාස දහතරක් ගතවන තුරුත් චෝදනා පත්‍රයක් ඉදිරිපත් නොකරන්නේ මන්ද? (ඊ) මොහුට විරුද්ධව චෝදනා නැත්නම් මොහු වහාම සේවයේ පිහිටුවීමටත්, තිබේ නම් ඒ පිළිබඳ පරීක්ෂණ පවත්වා ඉක්මණින් තීරණයක් දීමටත් එතුමා වග බලා ගන්නවාද?

*உள்நாட்டு விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) மொனராகலை மாவட்ட அதிபர் அவர்களினால் மொனராகலை மாவட்டத்தில் வெல்லஸ இறைவரி அதிபர் பிரிவில் உள்ள நில்கலவசத்தைச் சேர்ந்த கிராமசேவகர் திரு. எல். ஜீ. டீ. தியெஸ் அவர்களை 1966 ஆம் ஆண்டு ஜூலை 22 ஆம் தேதியிலிருந்து இடை நிறுத்தியிருப்பதை அவர் அறிவாரா? (ஆ) இவரை இடை நிறுத்துவதற்குக் காரணமாய் உள்ள குற்றச்சாட்டுக்கள் யாவை? (இ) வேலையினின்று இடைநிறுத்திப் பதினன்கு மாத காலமாகியும் குற்றச் சாட்டிதழ் தாக்கல் செய்யப்படாதது ஏன்? (ஈ) இவருக்கு எதிராகக் குற்றச்சாட்டுகள் இல்லையெனில் உடனே இவரை வேலையில் அமர்த்தவும், குற்றச்சாட்டுக்கள் இருப்பின், அவை சம்பந்தமாக விசாரணை நடத்தி விரைவில் தீர்ப்பு வழங்கவும் அவர் ஆவன செய்வாரா?*

asked the Minister of Home Affairs: (*a*) Is he aware that Mr. L. G. D. Dias, the Grama Sevaka of Nilgala Wasama in the Wellassa D. R. O's Division in the Moneragala district has been interdicted from 22nd July, 1966, by the Government Agent, Moneragala? (*b*) What are the grounds for his interdiction? (*c*) Why has a charge sheet not been served on him although 14 months have elapsed since the interdiction? (*d*) Will he ensure that he is reinstated immediately if there are no charges against him, or in the alternative, that the charges, if any, are inquired into and decided upon soon?

**ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති)**
*(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்)*
(The Hon. Dr. W. Dahanayake—Minister of Home Affairs)

(අ) ඔව්. (ආ) මහජනයාට හිරිහැර කිරීම ගැන ලැබී ඇති පැමිණිලි. (ඉ) මොහුගේ පත්වීම අවලංගු කර ඇත. (ඊ) ඉහත අනුව පැන නොනගී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

### ටී. ඩබ්ලිව්. ඩයස් මහතා, ලං.ග.ම. කොන්දොස්තර, බණ්ඩාරවෙල

### திரு. ரீ. டபிள்யூ. டயஸ், நடாத்துநர், இ.போ.ச., பண்டாரவளை

### MR. T. W. DIAS, CONDUCTOR, C. T. B., BANDARAWELA

13. විජේරත්න බණ්ඩා මයා. (රාජා වෙලේගම මයා. වෙනුවට)

(திரு. விஜேரத்ன பண்டா—திரு. ராஜா வெலேகம சார்பாக)

Mr. Wijeratne Banda—on behalf of Mr. Raja Welegama)

ජනසතු සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) ලං. ග. ම. බණ්ඩාරවෙල ඩිපෝව යටතේ ටී. ඩබ්ලිව්. ඩයස් නමැති බස් කොන්දොස්තර මහතෙකු සේවය කළ බවත්; (ii) 1966.7.7 වෙනි දින තුවක්කු වෙඩිල්ලක් වැදීම හේතු කොටගෙන ඔහු 1966 ඔක්තෝබර් 25 වෙනි දින සෞඛ්‍ය හේතුන් පිට විශ්‍රාම ගැන්වූ බවත්; (iii) වෛද්‍ය විශේෂඥයින්ගේ නිර්දේශය අනුව ඔහුට වෙනත් සැහැල්ලු රක්ෂාවක් දීම ගැන ලං. ග. ම. සළකා බැලීමට එකඟ වූ බවත්; (iv) මඩකලපු රජයේ මහරෝහලේ ශල්‍යකර්ම විශේෂඥ වෛද්‍යාචාර්ය ඇස්. සින්නතම්බි මහතා විසින් ඔහුට සැහැල්ලු වැඩ දීම සහ හය මාසය කට පසු කෘත්‍රිම කකුලක් සවි කිරීමෙන් පෙර කරන ලද රැකියාවම කිරීමට සුදුසු වගටත් නිර්දේශ කර ඇති බවත්; (v) මෙසේ තිබියදී ඔහුට මේ දක්වා කිසිම රක්ෂාවක් දී නොමැති බවත්; එතුමා දන්නවාද? (ආ) නිරෝගී දේහයක් ඇති ලාබාල වයස්කරුවකු වූ මොහුට යම්කිසි රක්ෂාවක් ලබාදීමට එතුමා ක්‍රියා කරනවාද?

தேசியமயச் சேவை அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) பண்டாரவளை இ. போ. ச. சாலையில் திரு. ரீ. டபிள்யு. டயஸ் என்பவர் பஸ் நடத்துநராகச் சேவை செய்தார் என்பதையும்; (ii) 7.7.1966 அன்று துப்பாக்கிக் குண்டொன்று தாக்கியதன் காரணமாக இவர் 1966 ஆம் ஆண்டு ஒக்டோபர் மாதம் 25 ஆம் தேதி மருத்துவ காரணங்களுக்காக இளைப்பாறினார் என்பதையும்; (iii) வைத்திய நிபுணர்களின் சிபார்சின்படி அவருக்கு வேறு இலகுவான வேலை வழங்குவதுபற்றி பரிசீலனை செய்ய இ.போ.ச. உடன்பட்டதென்பதையும் (iv) மட்டக்களப்பு அரசினர் மருத்துவமனையில் அறுவை மருத்துவ நிபுணராயுள்ள டொக்டர் எஸ். சின்னதம்பி அவர்களினால் மேற் குறிப்பிட்டவருக்கு இலேசான வேலை வழங்குமாறு தெரிவிக்கப்பட்டதையும் ஆறு மாதத்திற்குப் பின் செயற்கைக் கால் ஒன்றை பொருத்தியபின் முன் செய்த வேலையைச் செய்யத் தகுதி உள்ளவராக இருப்பதாகச் சிபார்சு செய்யப்பட்டிருப்பதையும்; (v) நிலைமை இவ்வாறு இருப்பினும், அவருக்கு இதுவரையிலும் எவ்வேலையும் அளிக்கப்படாமலிருப்பதையும் அவர் அறிவாரா? (ஆ) உடல் நலம் வாய்ந்த இளவயதினரான இவருக்கு ஏதாவதொரு வேலையைப் பெற்றுக் கொடுக்க அவர் நடவடிக்கை எடுப்பாரா?

asked the Minister of Nationalized Services: (*a*) Is he aware—(i) that one T. W. Dias, a bus conductor, was employed in the C. T. B. Depot, Bandarawela; (ii) that he was retired on medical grounds on 25th October, 1966, as a result of receiving a gun shot injury on 7.7.1966; (iii) that the C. T. B. agreed to consider giving him other employment carrying light work, as recommended by the medical specialist; (iv) that Dr. S. Sinnetamby, the Specialist Surgeon at the Batticaloa Government Hospital has recommended that he be given light work, and further that after a period of six months has elapsed and he is equipped with an artificial leg he would be fit for his previous post; and, (v) that in spite of the above he has not been given any employment so far? (*b*) Will he take action to have some employment given to this young and able-bodied person?

ජයසූරිය මයා. (ජනසතු සේවා ඇමති වෙනුවට)

(திரு. ஜயசூரிய—தேசியமய சேவை அமைச்சர் சார்பாக)

(Mr. Jayasuriya—on behalf of the Minister of Nationalised Services)

(*a*) (i) Yes. (ii) Yes. (iii) The C.T.B. has considered his case sympathetically and included his name in a waiting list in order to give him suitable alternative employment when available as recommended by the Board's Medical Officer. (iv) Dr. Sinnathambi has only recommended

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

light duty but has made no recommendation that Mr. Dias, when equipped with an artificial leg, would after six months be fit for the post he held previously. (v) Mr. Dias who is a resident of Wellawaya expected, in view of his disability, to be given employment in one of the Depots at Badulla, Bandarawela or Welimada but this could not be done immediately as there was no suitable vacancy in any of these depots. (b) Yes. Mr. Dias has been offered a post of office labourer in the Regional Manager's Office, Badulla from 1.1.1968.

### පී. ඒ. කරුණාරත්න මහතා, පස්සර ගම් සභාවේ ලිපිකරු : මරණ පාරිතෝෂිකය

திரு. பீ. எ. கருணாரத்ன, எழுதுவினைஞர், பசறை கி. ச: விதவைக்கு பணிக்கொடை

### MR, P. A. KARUNARATNE, CLERK, PASSARA V. C. : GRATUITY TO WIDOW

14. විජේරත්න බණ්ඩා මයා. (රාජා වෙලේගම මයා. වෙනුවට)

(திரு. விஜேரத்ன பண்டா—திரு. ராஜா வெலெகம சார்பாக)

(Mr. Wejeratne Banda—on behalf of Mr. Raja Welegama)

පළාත් පාලන ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ පස්සර ගම්සභාවේ ලිපිකරු පී. ඒ. කරුණාරත්න මහතා සේවයේ යෙදී සිටියදී මිය ගිය බවත් ; (ii) ඒ මහතාට ලැබිය යුතු මරණ පාරිතෝෂිකය මෙතෙක් ඔහුගේ වැන්දඹු භාර්යාවට ගෙවා නොමැති බවත් ; (iii) මේ ප්‍රමාදය නිසා ඔහුගේ බිරිඳත් දරුවන් සිව් දෙනාත් ඉතා අසරණ තත්ත්වයකට පත්ව ඇති බවත් එතුමා දන්නවාද ? (ආ) පළාත් පාලන කොමිෂන් සභාව වෙත ඉල්ලා ඇති සියලු ලියකියවිලි යවා අවුරුද්දක් පමණ ගත වී ඇතත් ප්‍රමාදය කුමක්ද ? (ඉ) මෙය වහාම ගෙවීමට එතුමා නියෝග කරනවාද ?

உள்ளூராட்சி அமைச்சரினதும் தகவல், ஒலிபரப்பு அமைச்சரினதும் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா: (அ) (i) பதுளை மாவட்டத்திலுள்ள பசறைக் கிராமச் சங்கத்தின் எழுதுவினைஞரான திரு. பீ. ஏ. கருணாரத்ன என்பவர் சேவையாற்றுகின்ற போதே காலமானார் என்பதையும், (ii) அவருடைய விதவைக்குக் கொடுபட வேண்டிய மரணப் பணிக்கொடைப் பணம் கொடுபடவில்லையென்பதையும் ; (iii) இத்தாமதத்தின் விளைவாக அவரின் விதவையும் நாலு பிள்ளைகளும் ஆதரிப்பாரற்ற அனாதைகளாக்கப்பட்டிருக்கின்றனரென்பதையும் அவர் அவறிரார? (ஆ) உள்ளூராட்சிச் சேவைக் குழுவினால் கேட்கப்பட்ட பத்திரங்களெல்லாம் சமர்ப்பிக்கப்பட்டு ஓராண்டு காலமாகியும், இன்னும் தாமதமேற்படுவதற்குக் காரணம் என்ன? (இ) இக்கொடைப் பணத்தை உடனடியாக வழங்கும்படி அவர் கட்டளையிடுவாரா?

asked the Parliamentary Secretary to the Minister of Local Government and Parliamentary Secretary to the Minister of Information and Broadcasting: (a) Is he aware: (i) that Mr. P. A. Karunaratne, a clerk of the Passara Village Council in the Badulla District, died while in service ; (ii) that the death gratuity due to him has so far not been paid to his widow ; and (iii) that as a result of this delay, his widow and four children have been rendered destitute? (b) Although one year has elapsed since all the papers asked for by the Local Government Service Commission were submitted, why is there a delay? (c) Will he order that this be paid immediately?

විජයපාල මෙන්ඩිස් මයා. (පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට)

(திரு. விஜயபால மெண்டிஸ்—உள்ளூராட்சி அமைச்சரதும், தகவல், ஒலிபரப்பு அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி சார்பாக)

(Mr. Wijayapala Mendis—on behalf of the Parliamentary Secretary to the minister of Local Government and Parliamentary Secretary to the Minister of Information and Broadcasting)

(අ) (i) නැත. කරුණාරත්න මහතා 66.4.1 වැනි දින තම සේවයෙන් විශ්‍රාම ගත්තේය. විශ්‍රාම ගැනීමට පසුව 66.5.5 වැනි දින ඔහු මළේය. (ii) නැත. ඔහුගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයපාල මෙන්ඩිස් මයා.]

වැන්දඹුවට 67.6.8 වැනි දින මරණ පාරිතෝෂිකයක් ගෙවනු ලැබීය. (3) පැන නොනගී. (ආ) සහ (ඉ) පැන නොනගී.

## ලං. ග. ම. ජී. පී. ජී. ධර්මසේන මහතා සහ තවත් අය

இ. போ. ச. திரு. ஜீ. பீ. ஜீ. தர்மசேனவும் ஏனையோரும்

MR. G. P. G. DHARMASENA AND OTHERS, C.T.B.

15. කේ. බී. රත්නායක මයා. (අනුරාධපුර—ඉලංගරත්න මයා.—වෙනුවට)

(திரு. கே. பி. ரத்ணயக்க—அனுராதபுரம்—திரு. இலங்கரத்ன சார்பாக)

(Mr. K. B. Ratnayake—Anuradhapura—on behalf of Mr. Ilangaratne)

ජනසතු සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පහත නම් සඳහන් ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයන්ගේ වැඩ 1966.1.8 දා උදේ 7.30 සිට තහනම් කරන ලද බව එතුමා දන්නේද? (1) ජී. පී. ජී. ධර්මසේන, කොන්දොස්තර, (2) කේ .කේ. අප්පුහාමි, චාජ්හෑන්ඩ් (3) වින්සන් රණසිංහ, රියැදුරු, (4) ආර්. ඩබ්ලිව්. ඩේවිඩ් රියැදුරු, (5) ඩී. ඒ. සයිමන් සිල්වා, රියැදුරු, (6) ඒ. ඒ. කුරේ කාර්මිකයා, (ආ) එසේ තිබියදී මෙම සේවකයින් එදින වැඩට නොපැමිණීයේ යයි සේවයෙන් පහකරන ලද බව එතුමා දන්නේද? (ඉ) මේ පරස්පර විරෝධි තීරණ දෙක සම්බන්ධව විභාගයක් පවත්වා එම සේවකයින්ට ආපසු වැඩ ලබා දෙන්නේද?

தேசியமயச் சேவை அமைச்சரைக் கேட்ட வினா: (அ) 1966 ஆம் ஆண்டு ஜனவரி 8 ஆந் தேதியன்று காலை 7.30 மணியிலிருந்து இ. போ. ச. வின் ஊழியர்களான—(1) ஜீ. பி. ஜீ. தர்மசேன, பஸ் நடத்துநர் (2) கே. கே. அப்புகாமி, பொறுப்பாளர் (3) வின்சன்ட் இரணசிங்க, சாரதி (4) ஆர். டபிள்யு. டேவிட், சாரதி (5) டீ. ஏ. சைமன் சில்வா சாரதி (6) ஏ. ஏ. கூரே, எந்திரப் பொறிஞர் ஆகியோர் வேலையினின்றும் நிறுத்தப்பட்டனர் என்பதை அறிவாரா? (ஆ) அன்று வேலைக்குச் போகாத காரணத்திற்காக இவர்கள் வேலையினின்றும் நீக்கப்பட்டுள்ளார்களென்பதை அவர் அறிவாரா? (இ) இவ்விதமுரண்பட்ட இரண்டு முடிவுகள்பற்றி விசாரணை நடத்தி, இவர்களுக்குத் திரும்பவும் அவர் வேலை வழங்குவாரா?

asked the Minister of Nationalized Services: (*a*) Is he aware that the following employees of the Ceylon Transport Board were interdicted from 7.30 a.m. on 8.1.1966: (1) G. P. G. Dharmasena, conductor, (2) K. K. Appuhamy, charge hand, (3) Vincent Ranasinghe, driver, (4) R. W. David, driver, (5) D. A. Simon Silva, driver, (6) A. A. Cooray, mechanic? (*b*) Is he aware that though they were interdicted, they have been dismissed from service for having not reported for work on the day? (*c*) Will he hold an inquiry into these two contradictory decisions and reinstate them?

ජයසූරිය මයා. (ජනසතු සේවා ඇමති වෙනුවට)

(திரு. ஜயசூரிய—தேசியமய சேவை அமைச்சர் சார்பாக)

(Mr. Jayasuriya—on behalf of the Minister of Nationalized Services)

(*a*) Yes. Out of those mentioned G. P. G. Dharmasena should read as G. P. G. Sirisena and A. A. Cooray as B. S. Cooray. (*b*) No. Their services have been terminated for intimidating other workers and preventing them from reporting for work. (*c*) Does not arise.

## වෛද්‍යාචාර්ය රත්වත්තේ මහතාට විරුද්ධව පැවරූ නඩුව: ඇපෑල

வைத்திய கலாநிதி றத்வத்தைக் கெதிரான வழக்கு

CASE AGAINST DR. RATWATTE: APPEAL

16. රාජා කුලතිලක මයා. (තෙල්දෙනිය)

(திரு. ராஜ குலத்திலக்க—தெல்தெனிய)

(Mr. Raja Kulatillake—Teldeniya)

අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) "කිසිම යුක්ති සහගත අධිකරණයකට පළමුවන විත්තිකරුට (වෛද්‍යාචාර්ය රත්වත්තේ මහතාට) මෙම අත්ලස දෙනු ලැබීය යන, පුපුරාජ්ගේ වාචික සාක්ෂිය පිළිගත නොහැක්කේය" යනුවෙන් කොළඹ දිස්ත්‍රික් විනිශ්චයකාරතුමා අංක බී/13 දරණ නඩුවේ සිය තීන්දුවෙන් ප්‍රකාශ කළේ ද? (ආ) "අප ඉදිරියෙහි රජයේ පාර්ශ්වයෙන් නඩුවට පෙනී සිටි ශ්‍රේෂන් මහතා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

යථා පරිද්දෙන්ම, පළමුවන විත්තිකරු (වෛද්‍යාචාර්ය රත්වත්තේ මහතා) නිදහස් කිරීමට විරුද්ධ අභියාචනය තරයේම ඉදිරියට ගෙනයාමට ඉදිරිපත් නොවීය" යනුවෙන් ඉහත සඳහන් නඩුවේ අභියාචනය නිෂ්ප්‍රභ කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රකාශ කළේ ද? (ඉ) නිදහස් කිරීමට විරුද්ධව තරයේම කරුණු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු නොවිනි නම් අභියාචනයක් ඉදිරිපත් කළේ මන් ද? (ඊ) නීතිය පිළිබඳ වැදගත් ප්‍රශ්නයක් මීට සම්බන්ධව තිබුණේ ද? එසේ නම් ඒ කුමක් ද? ඒ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව කුමක් වී ද? (උ) රජය තීරණාත්මක විධානයක් ලබා ගැනීමට බලාපොරොත්තු වූ නීතිය පිළිබඳ වැදගත් ප්‍රශ්නයක් සම්බන්ධ වූ අභියාචනයක් 1967 ජූලි 22 හා 23 දිනවල විනිශ්චයකාරතුමන් පස් දෙනකුගෙන් යුත් අධිකරණයක් ඉදිරියේ තර්ක කැරෙද්දී රජය වෙනුවෙන් පෙනී සිටියේ ආණ්ඩුවේ අධිනීතිඥවරයකු පමණක් බව එතුමා දන්නේ ද? (ඌ) රත්වත්තෙ නඩුවේ අභියාචනය සඳහා පෙනීසිටීමට සමත් නිළධාරියෙක් දෙපාර්තමේන්තුවේ නොසිටියේ ද?

*நீதியமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா: (அ) "முதலாவது எதிரி (வைத்திய கலாநிதி றத்வத்தை) க்கு இந்தக் கொடை வழங்கப்பட்டது என்று பாபுராஜ் அளித்த வாய்மூல சாட்சியத்தை எந்த நேரிய நீதிமன்றமும் ஏற்றுக்கொள்ளமுடியாது", என்று கொழும்பு மாவட்ட நீதிபதி பி/13 என்ற இலக்கமுள்ள வழக்கில் தமது தீர்ப்பிற் குறிப்பிட்டாரா? (ஆ) இந்த வழக்கின் மேன்முறையீட்டைத் தள்ளுபடி செய்த உயர் நீதிமன்றம், "வெகு ஒழுங்காக எமக்கு முன்னால் முடிக்குரிய வழக்கை வாதித்த திரு. கிறேசியன், முதலாம் எதிரி (வைத்திய கலாநிதி றத்வத்தை) யின் விடுதலைக்கெதிரான மேன்முறையீட்டை வற்புறுத்தவில்லை". என்று குறிப்பிட்டுள்ளதா? (இ) விடுதலைக்கெதிராக வற்புறுத்தும் எண்ணம் இருக்கவில்லையென்றால் ஏன் மேன்முறையீடு தாக்கல் செய்யப்பட்டது? (ஈ) முக்கியமான சட்டப் பிரச்சினை ஏதையாவது உள்ளடக்கியிருந்ததா, அங்ஙனமாயின் அது என்ன, அது சம்பந்தமாக உயர் நீதிமன்றத்தின் முடிவு என்ன? (உ) முடிக்குரிய தரப்பினர் ஒரு முக்கிய சட்டப் பிரச்சினைபற்றி அதிகாரபூர்வமான தீர்ப்புக்கோரிய மேன் முறையீடு நீதியரசர் ஐவரைக் கொண்ட மன்றத்தில் 1967 ஆம் ஆண்டு ஜூலை மாதம் 22 ஆம், 23 ஆம் தேதிகளில் வாதிக்கப்பட்டபோது முடிசார்பில் முடிக்குரிய வழக்கறிஞர் ஒருவர்மட்டுமே பிரதிநிதித்துவம் வகித்தாரென்பதை அவர் அறிவாரா? (ஊ) றத்வத்தை வழக்கில் மேன் முறையீட்டை வாதிப்பதற்குப் போதிய தகுதிவாய்ந்த உத்தியோகத்தர் எவரும் அத்திணைக்களத்திலிருக்கவில்லையா?*

asked the Parliamentary Secretary to the Minister of Justice: (*a*) Did the District Judge of Colombo in his judgment in case No. B|13 state: "No reasonable court can accept the oral testimony of Papuraj that this gratification was given to the 1st accused (Dr. Ratwatte)"? (*b*) Did the Supreme Court in dismissing the Appeal in the above case state: "Mr. Gratiaen who argued the Crown's case before us very properly did not seek to press the appeal against the acquittal of the first accused (Dr. Ratwatte)"? (*c*) If it was not intended to press against the acquital why was an Appeal filed? (*d*) Was any important question of law involved and if so, what was it and what was the Supreme Court's decision thereon? (*e*) Is he aware that when on July 22 and 23, 1967, an Appeal involving an important question of law on which an authoritative ruling was sought by the Crown, was argued before a Bench of five judges, the Crown was represented only by a Crown Counsel? (*f*) Was there no officer in the Department competent enough to argue the Appeal in the Ratwatte case?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම්. එච්. එම්. නයිනා මරික්කාර් මයා. (අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(ஜனாப் எம். எச். எம். நயினா மரிக்கார்—நீதி அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)

(Mr. M. H. M. Naina Marikar—Parliamentary Secretary to the Minister of Justice)

(*a*) Yes, but he did not examine the testimony of Abdul Kalam who gave evidence to the same effect as Papuraj. (*b*) Yes, the Supreme Court did so state but qualified the statement with the words "on the facts". (*c*) The appeal was filed with the intention of pressing it on the facts and on law. Mr. Gratiaen very properly refrained from pressing the appeal on the facts at the stage when the court indicated that it had arrived at a contrary view. The law involved in the appeal is indicated in the answer to the next succeeding question. (*d*) Yes—whether the acquittal of the accused at the close of the prosecution case, without calling for a defence, was not a violation of the provisions of Section 210 of the Criminal Procedure Code, having regard to (i) the evidence, oral and documentary, adduced by the prosecution and accepted by the District Judge, and (ii) the fact that the only question which the District Judge posed at the close of the prosecution case as "agitating" his mind, was answered by the prosecution. The Supreme Court on its interpretation of the District Judge's reasons decided that it was not. (*e*) Yes. This was an appeal in which the Attorney-General himself was to have appeared but which he was prevented from doing owing to illness. This fact having been brought to the notice of the Bench of five judges which had been specially constituted to hear this appeal, it was decided that the Crown Counsel who was the Attorney-General's junior in the case should argue the appeal to avoid the necessity and inconvenience of constituting another Bench of five judges to hear this appeal on a subsequent date. (*f*) There were,—but it is not the practice for such officers to argue an appeal where at the trial in the lower court the Crown was represented by either of the two Law Officers. The Solicitor-General could not argue the appeal as he had been consulted by the defence when he was practising in England.

එම්. තෙන්නකෝන් මයා.

(திரு. எம். தென்னக்கோன்)

(Mr. M. Tennakoon)

අතුරු ප්‍රශ්නයක් අහන්නට තිබෙනවා. මීට පෙර අවස්ථාවල, එංගලන්තයේ රාජාධිකරණයේ අභියාචනයක් විභාග වන අවස්ථාවලදී ලංකා රජයේ නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එහි ගොස් ලංකා රජය වෙනුවෙන් කරුණු ඉදිරිපත් කර තිබේද නැද්ද ?

ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)

(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

ඒක අදාළ නැති ප්‍රශ්නයක්.

එම්. තෙන්නකෝන් මයා.

(திரு. எம். தென்னக்கோன்)

(Mr. M. Tennakoon)

ඇයි නැත්තේ ? එංගලන්තයේ අභියාචනා විභාගවලට ලංකාවේ නීතිපති දෙපාතර්මේන්තුවේ නිලධාරීන් යැවීම එම දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පුරුද්දක් නොවන බවයි, ගරු අධිකරණ උප ඇමතිතුමාගේ පිළිතුරේ අන්තිම කොටසින් කියැවෙන්නේ.

ගරු ජේ. ආර්. ජයවර්ධන

(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)

(The Hon. J. R. Jayewardene)

This Supplementary Question does not relate to this matter at all.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන් තොට)**
*(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந் தோட்டை)*
(Dr. N. M. Perera—Yatiyantota)

Why not? The hon. Member is asking whether there have or have not been any cases where officers of the Attorney-General's Department have appeared before the Privy Council.

**නයිනා මරික්කාර් මයා.**
*(ஜனாப் நயினா மரிக்கார்)*
(Mr. Naina Marikar)

The main Question relates to an appeal in the Supreme Court of Ceylon, not in the Privy Council. Therefore the supplementary question is not altogether relevant.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The Question is in regard to an appeal in Ceylon and not in regard to an appeal to the Privy Council. Therefore the supplementary question does not arise.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

තවත් අතුරු ප්‍රශ්නයක් තිබෙනවා. රාජාධිකරණයේ අභියාචනා සඳහා යන්න ට නීතිපති දෙපාර්තමේන්තුවේ නිළධාරීන් ට පුළුවන් නම්, ලංකාවේ මහාධිකරණය රාජාධිකරණයට වඩා ලොකුද ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

නෑ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

එහෙම නම්, රාජාධිකරණය සම්බන්ධ යෙන් යොදන ප්‍රතිපත්තියම මේ අධිකරණ යටත් නොයොදන්නේ ඇයි ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

කාගෙන්ද අහන්නේ ?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

උත්තර දුන්නු එක්කෙනාගෙන් අහන්නේ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

They seem to be treating this as a joke.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

The question is a joke.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I do not think we should have any theoretical questions asked in this House. Shall we get down to the next item ?

## නොපැමිණීමේ අවසරය
## வராதிருக்க அனுமதி
## LEAVE OF ABSENCE

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

"1946 ලංකාණ්ඩුවේ ව්‍යවස්ථාවේ 24 (1) (ඊ) ඡේදය යටතේ නිවිතිගල මන්ත්‍රී ඕ. ඒජ්. හෙවිවි ආරච්චි මහතාට 1968 ජනවාරි මස 10 වන දින සිට මාස 3 ක් තුළ මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම් වලට නොපැමිණීමට අවසර දිය යුතුය."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කේ. බී. රත්නායක මයා.**
*(திரு. கே. பி. ரத்ணயக்க)*
(Mr. K. B. Ratnayake)

**විසින් ස්ථිර කරන ලදී.**

*அனுவதித்தார்.*

*Seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## රසායන පෝර නොමිලයේ බෙදදීම
### இலவசமாக உரம் வழங்குதல்
### ISSUE OF FREE FERTILIZERS

අ. භා. 2.18

**නීල් ද අල්විස් මයා.** (බද්දේගම)
*(திரு. நீல் டி அல்விஸ்—பத்தேகம)*
(Mr. Neal de Alwis—Baddegama)

ගරු කථානායකතුමනි, පසුගිය වර්ෂය තුළ පැවැත්වුණු අතුරු මැතිවරණවලදී ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් කරන ලද යම් යම් ප්‍රකාශයන් ප්‍රවෘත්තිපත්‍රවල පළ වී තිබුණ බව අප දැක්කා. වැඩි වශයෙන්ම ඒ ප්‍රකාශවලින් කියැවුණේ විරුද්ධ පක්ෂය ආණ්ඩුවේ ආහාර වගාව පිළිබඳ වැඩ පිළිවෙළට සහයෝගය නොදෙන බවයි. ඒ නිසයි ගරු කථානායකතුමනි, මා අද මේ ඉතාමත් වැදගත් යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ. මීට පෙරත් මා මෙවැනිම වැදගත් යෝජනාවක් ඉදිරිපත් කළා. එය මේ ගරු සභාව ඒකච්ඡන්දයෙන් පිළිගත්තා. මා ඒ යෝජනාව ඉදිරිපත් කළේ අපේ ගොවි මහත්වරුන්ට වුවමනා ණය මුදල් පහසුවෙන් ලබා දීම සම්බන්ධවයි. මේ ආණ්ඩුව පිහිටුවන්නට පෙර, ගොවි මහත්වරුන්ට වුවමනා ණය මුදල් සියයට 6 පොළියට විවිධ සේවා සමුපකාර සමිති මාර්ගයෙන් ලබා ගන්නට පුළුවන්කම තිබුණා. අද මේ ආණ්ඩුව පත්තර මාර්ගයෙනුත් ගුවන් විදුලියෙනුත් නොයෙක් විධියේ ප්‍රකාශයන් කරමින් ආහාර වගාව සම්බන්ධයෙන් ලොකු උනන්දුවක් දක්වන බව පෙන්වනවා. අපේ ගරු අගමැතිතුමා කැමරාවෙනුත් ඒ බව පෙන්වනවා. එහෙත්, අපේ ගොවි මහත්වරුන්ට මේ ආණ්ඩුව කොයි තරම් ආධාරයක් දෙනවාද කියනවා නම්, ඉස්සර ගොවීන්ට දුන් ණය මුදල් සඳහා අය කළ සියයට 6 පොළිය සියයට 12 දක්වා වැඩි කළා. පසුගිය මාසයේදී මා මේ ගරු සභාවට යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ යෝජනාව මේ ගරු සභාව ඒකච්ඡන්දයෙන් භාර ගත්තා. අද සියයට 12ක් කර තිබෙන මේ පොළිය පසුගිය ආණ්ඩුවේ ඒ වැඩ පිළිවෙළ අනුව වහාම සියයට 6 දක්වා පහළ බැස්විය යුතුය යනු ඒ යෝජනාවයි.

මේ ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කළ පුද්ගලයෙක් අද ඉන්නවා. පසුගිය මාසයේ පත්‍රවල ඕනෑම පිටුවක් පෙරළා බැලුවොත් අපේ අගමැතිතුමාත් අනිකුත් මන්ත්‍රීවරුත් ප්‍රකාශ කර තිබෙන දේ පෙනෙයි. "ප්‍රජාතන්ත්‍රවාදය බේරා ගත් පුද්ගලයකු සිටිනවා, ඒ තැනැත්තා ආරක්ෂා කර ගන්නට ඕනෑ, ඒ තැනැත්තා නාත්තන්ඩියේ මන්ත්‍රීවරයා හැටියට පත් කරන්නට ඕනෑ" ආදි වශයෙන් එතුමන්ලා නොයෙකුත් ප්‍රකාශ කර තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය ගැන විශ්වාස කරනවාය කියන මේ ආණ්ඩුවේ කෘෂිකර්ම ඇමතිතුමාගෙන් මා පළමුවෙන්ම ප්‍රශ්න කරන්නේ දුප්පත් ගොවි ජනතාවට අද ගෙවන්නට නියම කර තිබෙන මේ සියයට 12 පොළිය වහාම සියයට 6 කළ යුතුය කියා මේ ගරු සභාව ඒකච්ඡන්දයෙන් භාර ගත් ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්නේ කවදාද කියායි.

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)*
(Mr. T. B. Tennekoon—Dambulla)

කවදාවත් නැහැ.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

කවදාවත් නැහැ. මේ කාරණය සම්බන්ධව මා ප්‍රශ්නයකුත් යවා තිබෙනවා. හෙට අනිද්දා ඒ ප්‍රශ්නය මේ ගරු සභාවේදී මා අසනවා. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කළ පුද්ගලයා අද නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කළේ අද නාත්තන්ඩියේ මන්ත්‍රීතුමා වශයෙන් සිටින හියු ප්‍රනාන්දු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මහත්මයාය කියා පසුගිය දිනවල මේ රටේ විශාල ප්‍රචාරයක් ගෙන ගියා. නාත්තන්ඩියේ ගරු මන්ත්‍රීතුමාට මා විශේෂයෙන්ම මේ කාරණය ඉදිරිපත් කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය ගැන තමුන්නාන්සේලා තුළ විශ්වාසයක් තිබෙනවා නම් මේ ගරු සභාව ඒකච්ඡන්දයෙන් සම්මත කළ—ඒකට ඉංග්‍රීසියෙන් කියන්නෙ "the will of Parliament" කියායි—එම යෝජනාව ක්‍රියාත්මක කරන්නේ කවදාද? ඒක එසේ මෙසේ යෝජනාවක් නොවෙයි. ආහාර වගා කිරීම සම්බන්ධව, අපේ අස්වැන්න වැඩි කරන්නට වැඩ කරන්නේ කවුද? අපේ ගොවි මහත්වරුයි. නමුත් අද තිබෙන වැඩ පිළිවෙළ අනුව අපේ ගොවි මහත්වරු උනන්දු වෙනවාද? අද තිබෙන මේ වැඩ පිළිවෙලින් අපේ ගොවි මහත්වරුන්ට ප්‍රයෝජනයක් ලැබෙනවාද? අන්න ඒ ප්‍රශ්න උඩ තමයි මා වැදගත් යෝජනා දෙකක් ඉදිරිපත් කර තිබෙන්නෙ. පළමුවන යෝජනාව දැන් මා කියවන්නට අදහස් කරනවා:

"මෙරට ආහාර වගා කිරීමේ ව්‍යාපාරය දියුණු කිරීම් වස්"—[බාධා කිරීමක්]

තමුන්නාන්සේලාට වැඩිය සිංහල අප දන්නවා. තමුන්නාන්සේලා පණ්ඩිතවරුන් නොවෙයි. තමුන්නාන්සේලා ලෑස්ති නම් මේ ගරු සභාවේ වැඩ කටයුතු සිංහල භාෂාවෙන් ගෙන යන්නට, අපත් ලෑස්තියි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Why are you getting heated so early in the day?

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

I am not getting heated although we have more than one reason to get heated. During the last one month hon. Members of the Government went round saying: "There was as Speaker of this honourable House a wonderful man". That statement was made particularly by the Hon. Prime Minister. But we do not agree with that statement.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

What has that got to do with fertilizer?

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

They said that the very best Speaker of this august Assembly was some person whom they were backing at Nattandiya. But we do not agree, and we have to get heated when this type of thing is said.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

You could have got heated then. But why this delayed action?

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

In spite of the new plant that has been installed, this air conditioner does not work as well as it should.

කථානායකතුමනි, අපට විරුද්ධත්වය ප්‍රකාශ කරන්නට කරුණු කීපයක් තිබෙනවා. අපට වුවමනා කරන්නේ ආහාර වගා කර අස්වැන්න වැඩි කිරීමටයි. නමුත් මේ ආණ්ඩුව ජාවාරම්කාරයාට ඉඩ දෙනවා මිස අපේ ගොවි මහත්වරුන්ට තැනක් දෙන්නේ නැහැ. ගොවි මහත්වරුන්ට නියම තැන නොදී ප්‍රතිඵල ලැබෙන්නේ කොහොමද? එම නිසා මේ ආණ්ඩුව කරන විහිළුව මේ ගරු සභාව මාර්ගයෙන් රටට පෙන්වා දීමට විරුද්ධ පක්ෂයේ අපට යුතුකමක් තිබෙනවා.

නතර කළ තැන සිට මා දැන් යෝජනාව කියවනවා:

"—ආහාර නිෂ්පාදනයෙහි නිරතව සිටින සියලු දෙනාටම නොමිලයේ රසායන පෝර බෙදා දීම අත්‍යවශ්‍ය යයිද, තේ, රබර් හා පොල් වතු සම්බන්ධයෙන් ඒ හා සමාන යෝග්‍ය වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතු යයිද, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

රසායන පෝර නොමිලයේ බෙදා දීම

[නීල් ද අල්විස් මයා.]

මේ යෝජනාව වාගේම වැදගත් යෝජනාවක් මගේ නමින්ම ඊළඟට තිබෙනවා. එම යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ දෙවනුව නමුත්, මා දැන් එයත් කියවන්නට කැමැතියි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

We shall come to that later.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

I am not moving it now. I am only reading it now to—[*Interruption*].

එය කියවන්නට මට බලයක් තිබෙන්නට ඕනෑ. ඒ යෝජනාවත් මේ යෝජනාවට අදාළයි. [බාධා කිරීම්]

**ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති)**
*(கௌரவ எம். டீ. பண்டா—விவசாய, உணவு அமைச்சர்)*
(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

He is anticipating his own Motion.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The hon. Member is anticipating a Motion.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

I am not going to discuss it now. I am only reading it.—[*Interruption*]

මා ඒ ගැන සාකච්ඡා කරන්නේ නැහැ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

We give you the privilege of reading it again.

**නීල් ද අල්විස් මයා.**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Mr. Neal de Alwis)

Yes, Sir, the privilege of reading—that is all I ask. Sir, you are the most wonderful Speaker, the best Speaker, that this House ever had. The Hon. Prime Minister has made a certain statement which I referred to earlier. We differ. It may come from the Prime Minister but we also judge in these matters.

"—ට්‍රැක්ටර් හා ගොවි උපකරණ ලබා දීම,—ට්‍රැක්ටර් සහ සියලුම ගොවි උපකරණ"—[බාධා කිරීම්]

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

That has nothing to do with the Motion with regard to fertilizer.—[*Interruption*]. He is not going to speak on the second Motion, but is only reading it for the purpose of showing that—[*Interruption*].

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

——these two Motions hang together.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

මා මෙය පැහැදිලි වශයෙන් විස්තර කර දෙන්නට කැමැතියි. මේ යෝජනා දෙකම ඉතා වැදගත්. මා ඉදිරිපත් කරන්නේ 1 වැනි යෝජනාවයි. 2 වැනි යෝජනාවත් ඉතා වටිනා යෝජනාවක්. ට්‍රැක්ටර් සහ ගොවි උපකරණ ලබා දීම සම්බන්ධයෙන් අද මේ ආණ්ඩුව—

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Now the hon. Member is going into the facts of the second Motion. I cannot allow him to do that. Please finish with the first Motion and then take up the second one.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

ට්‍රැක්ටර් සහ සියලුම ගොවි උපකරණ රජයේ ප්‍රයෝජනය සඳහා, රජය මගින් ආනයන කළ යුතු අතර—

(i) එම ට්‍රැක්ටර්වල ක්ෂය පිරිවැය හා නඩත්තු පිරිවැය පමණක් ලැබෙන පරිදි සාධාරණ හා යුක්ති සහගත මිළකට එම ට්‍රැක්ටර් කෘෂිකාර්මිකයන්ට කුලියට දීමට; හා

(ii) ගොවි උපකරණ ගත් මිළට ලබා දීමට,

රජය විධිවිධාන යෙදිය යුතුයයි මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

මේ රජය ගෙන යන ආහාර වගා ව්‍යාපාරයෙන් ආහාර සුලභ වීමක් නම් අපට පෙනෙන්නේ නැහැ. මේ රජය බලයට පත් කිරීමට උදව් කළ ජාවාරම්කාරයන්ට සල්ලි හම්බ කර ගැනීමට වැඩ පිළිවෙළක් යොදන බවකුයි අපට නම් පෙනෙන්නේ. මීට පෙර පැවැති බණ්ඩාරනායක ආණ්ඩුවේ සිටි ඇමතිවරයෙක් එක්තරා යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ යෝජනාව මොකක්ද? ඒ යෝජනාව නම් රජය මගින් ගොවීන්ගෙන් මිළ දී ගන්නා වී වෙනුවෙන් ගෙවන මුදල රුපියල් දෙකකින් වැඩි කළ යුතු බවයි. වැඩියෙන් ගෙවන ඒ රුපියල් දෙක වෙනුවෙන් අපේ ගොවි මහතුන්ට රසායනික පෝර නැත්නම් උපකරණ ලබා දිය යුතු බවත් ඒ යෝජනාවේ වැඩිදුරටත් සඳහන් වුණා. සහතික මිළ රුපියල් දෙකකින් වැඩි කිරීම සම්බන්ධයෙන් වූ ඒ යෝජනාව නැත්නම් ඒ අදහස 1958 දී ඉදිරිපත් කළේ පිලිප් ගුණවර්ධන මහත්මයායි. රටට ඒ අදහස ඉදිරිපත් කළා වාගේම මේ ගරු සභාවටත් ඒ අදහස ඉදිරිපත් කළා. එහෙත් මේ හත් හවුල් ආණ්ඩුවේ ඇමතිවරයකු වුණායින් පසු එතුමාගේ ඒ පරණ අදහස්වලට මොනවා වුණාදැයි දන්නේ නැහැ. දැන් එතුමාගේ අදහස් මොනවාදැයි රටට ප්‍රකාශ කර නැහැ.

**ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. டி. செல்றன் ஜயசிங்க—கைத்தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

ඒ අදහස් දැනගන්නට තමුසෙ කුඩා වැඩියි. තමුසෙ ගෝලයා.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

ගුරුවරයා කාගේදෝ පය ළඟ වැටුණු බල්ලකු මෙන් සිටි බව ඊයේ පෙරේදා පත්‍රවල පළ වුණා. දැන් එයාගේ ප්‍රතිපත්තිය ඒකලු. එයාගේ ප්‍රතිපත්තිය කුමක්දැයි හොඳ කාටුන් එකකින් ඊයෙ පෙරේදා පෙන්වා දී තිබුණා. වීවල සහතික මිළ රුපියල් දෙකකින් වැඩි කළ යුතුයයි 1958 දී කී තැනැත්තා අද කට පියාගෙන ඉන්නවා. මා මෙම යෝජනාවෙන් ඉදිරිපත් කර තිබෙන්නේ ඒ වැඩ පිළිවෙළයි.

අපේ රටේ සිටින ගොවි මහතුන්ට තිබෙන ලොකුම අමාරුව මුදල් නොමැතිකමයි. කුඹුරුවල අස්වැන්න වැඩි කර ගැනීමට නම් අවශ්‍ය තරම් පෝර යොදවන්නට වුවමනායි. පෝර ලබා ගැනීමට ගොවියන්ට පහසුකම් සැලැසිය යුතුයි. ආහාර වගාව වැඩි කරන්නට පුළුවන් වන්නේ ඒ විධියටයි. ධනපති කොම්පැනිවලට නොව අවුරුදු ගණනාවක් තිස්සේ මෙම ව්‍යාපාරයෙහි යෙදුණු අපේ ගොවි මහතුන්ට නියම ආධාරයක් දිය යුතුයි. තම කුඹුරුවලට අවශ්‍ය තරම් පෝර ලබා ගැනීමට ගොවි මහතුන්ට පුළුවන් වුණොත් අස්වැන්න වැඩි කර ගැනීමට පුළුවන් වේවි.

අද ගොවියන්ට ආධාරයක් වශයෙන් කර ගෙන යන වැඩ පිළිවෙළ මොකක්ද? පසුගිය කාලයේ සමූපකාර සමිති මාර්ගයෙන් සියයට හයේ පොලියට ණය මුදල් ලබා ගන්නට ගොවියන්ට පුළුවන් වුණත්, මෙම ආණ්ඩුව ලෝක බැංකුවේ කීම පිට දැන් ණය මුදල් දෙන්නට කටයුතු කර තිබෙන්නේ සියයට දොළහක පොලියක් අය කරගෙනයි. පසුගිය වාරයේ ගොවියන් සියයට දොළහේ පොලියට ණය ලබාගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නීල් ද අල්විස් මයා.]

ගොවිතැන් කටයුතුවල යෙදුණා. ඒ අතර ඇති වූ ගංවතුරෙන් ඔවුන්ගේ කුඹුරු හානි වුණා. සියයට දොළහේ පොළියට ණය ලබා ගෙන ගොවිතැන් කළත් ඒ ගොවිතැන් කටයුතුවලින් ඔවුන්ට ප්‍රයෝජනයක් ලබන්නට බැරි වුණු අතර, සිදු වී තිබෙන්නේ නැවතත් සියයට දොළහේ පොළියට ණය ලබා ගන්නටයි. "අපි ණයට සල්ලි අරගෙන පෝර ගත්තා. කුඹුරුවල වැඩ නියම විධියට කළා. නමුත් ගංවතුර නිසා අස්වැන්න පාළු වුණා. දැන් ආයෙත් සියයට දොළහේ පොළියට ණය ලබා ගන්නටයි, සිදු වී තිබෙන්නේ. එතකොට පසුගිය අවුරුද්දේ පොළියත් එක්ක මුළු පොළිය සියයට විසිහතරක් වෙනවා නේද?" යනුවෙන් ඒ ගොවියන් දුක්මුසුව කියන දේ ආණ්ඩුව පැත්තේ සිටින අනෙක් උදවිය නොදනිතත් ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා නම් දන්නවා.

වගා කිරීම සඳහා යයි කියමින් ලොකු කොම්පැනිකාරයන්ට අක්කර අනූ දෙදාහක්, අනූ පන්දාහක් දුන්නා. ඒ කොම්පැනිකාරයන්ට නම් බැංකුවෙන් සියයට හයේ පොළියට ණය ලැබෙනවා. එහෙත් ගොවියන්ට ණය දෙන්නේ සියයට දොළහේ පොළියටයි. මෙහෙමද ගොවියන්ට උදව් කරන්නේ? පොළිය සියයට දොළහේ සිට සියයට හය දක්වා අඩු කළ යුතු යයි කියැවෙන යෝජනාව භාර ගත්තත් තවම එය ක්‍රියාත්මක නොකිරීම ප්‍රජාතන්ත්‍රවාදය අනුව කොතරම් කැතද? ප්‍රජාතන්ත්‍රවාදය ගැන නම් කොතෙකුත් කථා කරනවා. එහෙත් වැඩ කරන්නේ ඔය විධියටයි. ආණ්ඩුව කොතෙකුත් ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරමින් වැඩ කරගෙන යන්නේ මේ අන්දමට බව රටවැසියාට පෙන්වා දිය යුතුව තිබෙනවා.

පෝර ගෙන්වීම සඳහා අපේ විදේශ විනිමයෙන් මුදලක් වියදම් කරනවා. මම ඒ පිළිබඳ විස්තර ඉදිරිපත් කරන්නම්. පෝර ගෙන්වනවා වාගේම පිටරටින් හාල් ගෙන්වීම සඳහා විදේශ විනිමයෙන් කොටසක් වියදම් කරනවා. අපට වුවමනා කරන හාල් ටික සහ අනෙකුත් ආහාර වර්ග පිටරටින් ගෙන්වා ගැනීම සඳහා විදේශ විනිමයෙන් කොතරම් මුදලක් වියදම් කරනවාද, පෝර ගෙන්වා ගැනීම සඳහා කොතරම් මුදලක් වියදම් කරනවා දැයි අප කල්පනා කර බලන්නට ඕනෑ. ඒ ගැන කල්පනා කර බැලීමේදී පෝර ටික නොමිළයේ බෙදා දෙන්නට යෑමේදී අපට ලොකු පාඩුවක් සිදු වෙනවාදැයි පෙනී යනවා ඇති. ඇත්තෙන්ම ලොකු පාඩුවක් වෙනවාද? ඒ අන්දමට නියම විධියට පාඩුවක් වෙනවාද නැද්ද කියන ප්‍රශ්නය ගැන අද අපි කල්පනා කර බලන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුවේ ආහාර වගාව දියුණු කිරීමේ ව්‍යාපාරය ගැන වචනයක් දෙකක් කියන්නට ඕනෑ. තමුන්නාන්සේලාගේ ධනපති පත්තර මාර්ගයෙන්ම මේ සම්බන්ධව විස්තරයක් ඉදිරිපත් කර තිබෙනවා. "ඩේලි නිව්ස්" පත්තරයේ මෙන්න මෙහෙම කියා තිබෙනවා. මේ පත්තරය දෙපැත්තම ගන්න පත්තරයක්. ගරු ජේ. ආර්. ජයවර්ධන ඇමතිතුමාගේ පැත්තත් ගන්නවා; ගරු අගමැතිතුමාගේ පැත්තත් ගන්නවා. අපේ පැත්ත නම් ගන්නේ නැහැ. මෙහි තිබෙන "හෙඩ් ලයින්" එක මේකයි:

"Despite warnings by Agricultural Minister Lessees make slow progress."

අපේ ඇමතිතුමා නම් "වෝර්නිං" දෙනවා. රටට හෙන ගහලා යනවා. දවසින් දවසම ආර්ථික තත්ත්වය හීන වෙනවා.

"Only 19.6 per cent or 25,890 acres cultivated."

ආහාර වගාව පිණිස අක්කර 25,890 ක් දී ඇතත් එයින් 1/5 ක් වත් වගා කර නැහැ. එමෙන්ම ඒ ඉඩම් දී තිබෙන්නේ කොහෙන්ද? පොළොන්නරුව, බදුල්ල, වවුනියාව, මොනරාගල ආදී ප්‍රදේශවලින්. මේ පත්තරයේම සඳහන් කර තිබෙනවා ඒ ඉඩම් ගවයන්ට තණකොළ වැවීමටවත් සුදුසු නැත කියා. මේ ඉඩම් දුන්නාට පසුව නම් තමුන්නාන්සේලාටත් පෙනෙනවා මේවා තණ කොළ වැවීමටවත් නුසුදුසු ඉඩම්ය කියා. අක්කර විශාල ගණනක් පොළොන්නරුවෙන් දී ඇතත් ඒවායින් වගා කර තිබෙන්නේ අක්කර 225 යි. අක්කර 225 ක් වගා කරන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රසායන පෝර නොමිළයේ බෙදා දීම

මේ රජය ලක්ෂ 20 ක විදේශ විනිමය වියදම් කර තිබෙනවාය කියා ඉතාමත්ම කණගාටුවෙන් ප්‍රකාශ කරන්නට ඕනෑ. පුංචි ළමයින්ට කිරි ටික නැහැ. එමෙන්ම ගවයන් ඇති කිරීමට ඉතාම හොඳ පළාත පොළොන්නරුවයි කියා විශෙෂඥයිනුත් කියා තිබෙනවා. එය අවුරුදු ගණනකට පෙර මා විසිනුත් අසා තිබෙනවා. එහෙත් තමුන්නාන්සේලා පොළොන්නරුව ප්‍රදේශයෙන් අක්කර විශාල ගණනක් කොම්පැනිකාරයන්ට දී තිබෙනවා. ඒ අතරම විදේශ විනිමය ලක්ෂ 20 ක් දී තිබෙනවා. එහෙත් වගා කර තිබෙන්නේ අක්කර 225 යි කියා තමුන්නාන්සේලාගේම "ඩේලි නිවුස්" පත්තරය කියනවා. [බාධාකිරීමක්] මේවා තමුන්නාන්සේලාගේම පත්තරනේ. එහෙනම් මේවා වැරදියි කියා ඇමතිතුමා කියන්න.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

ඔය කියන්නේ වෙන කතාවක්. මේ ප්‍රශ්නයට අදාළ කතාවක් කියන්න.

**නීල් ද අස්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

මේවා මේකට අදාළයි. නොමිළයේ පෝර ටික දුන්නොත් විශාල අස්වැන්නක් ලබාගැනීමට ගොවීන්ට පුළුවන් වෙනවා. එහෙත් තමුන්නාන්සේලා ආධාර දෙන්නේ මැතිවරණ කාලයේ තමුන්නාන්සේලාට ආධාර කළ ජාවාරම්කාරයින්ටයි. [බාධාකිරීමක්] පෝර කන්නත් බැහැ. පෝරවලින් කසිප්පු හදන්නත් බැහැ. එහෙත් වගාවන්ට පෝර දැමූ විට එයින් විශාල ප්‍රතිඵල ලැබෙනවා. එහි හොරයක් කරන්නට බැහැ. ඒ ප්‍රතිපත්තිවලට අනුව තමුන්නාන්සේලා කල්පනා කරන්නට ඕනෑ. බදුල්ලේ අක්කර 8,500 යි. වගා කර තිබෙන්නේ අක්කර 1,996 යි. ඒ කියන්නේ සියයට 23 යි. ඒ සඳහා විදේශ විනිමය ලක්ෂ 33 ක් වියදම් කර තිබෙනවා. වවුනියාවේ අක්කර 6,500 යි. වගා කර තිබෙන්නේ සියයට 23 යි. වියදම් කොට තිබෙන විදේශ විනිමය ලක්ෂ 10 යි. [බාධාකිරීමක්] රට කාල: මොණරාගල—

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

පත්තරේ කියන්නේ බොරු. ඇයි ඒවා විශ්වාස කරන්නේ ?

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

සමහර විට දිව බොරු කිව්වත් ඒවා බොරු කියන්නේ නැති අවසථා තිබෙනවා. දැන් පත්තර කාරයන්ටත් තමුන්නාන්සේලාගේ පාලනය එපා වෙලා. තමුන්නාන්සේලාගේ පාලනය ඒ උදවියටත් හොඳ හැටියට පෙනුණු කාලයක් තිබුණා. දැන් නම් තමුන්නාන්සේලාගේ පාලනය එපා වෙලා. එම නිසයි මහජනතාවට පත්තර මාර්ගයෙන් දැන් ඇත්ත ප්‍රකාශ කරන බව පෙනෙන්නේ. ගරු ඇමතිතුමාගේ දැන ගැනීම සඳහා මා කියනවා, මොණරාගල තත්ත්වය පිළිබඳව. මොණරාගල අක්කර 7,590 ක් දී තිබෙනවා. වගා කර තිබෙන්නේ සියයට 15 යි. විදේශ විනිමය වියදම් කර තිබෙනවා, ලක්ෂ 8½ ක්. එතකොට අක්කර 25,890 න් වගා කර තිබෙන්නේ කොතරම් ප්‍රමාණයක්ද ?

මහජනතාවට මිරිස් වුවමනා කරනවා. ලුණු වුවමනා කරනවා. ලුණු සහ මිරිස් වගා කර තිබෙන්නේ සියයට 10 ක ප්‍රමාණයක පමණයි. අර්තාපල් නැතුවාට ඒ වෙනුවට වෙන මොනවා නමුත් අල වර්ගයක් සොයා ගත හැකියි. එහෙත් මිරිස් නැතුව බැහැ. අද අපි මිරිස් වල තත්ත්වය ගැන කල්පනා කර බලමු. මිරිස් රාත්තල රුපියල් 6 වුණා ; 7 වුණා ; 8 වුණා ; 9 වුණා ; දැන් 10 ටත් කිට්ටු වෙලා. අක්කරවලින් සියයට 5 ක වත් මිරිස් වගා කර නැහැ. ඒ, "ඩේලි නිව්ස්" පත්‍රයේ විස්තරවලිනුයි. ඊයේ "ඔබ්සර්වර්" පත්‍රයේත් විස්තර තිබුණා. ඒකේ තියෙන්නේ නිකම්ම විස්තරයක් නොවෙයි. තමුන්නාන්සේලාම පිට කරපු පත්‍රිකාවක විස්තරයක්. මීට ප්‍රථම ලංකාවේ දුප්පත් ගොවි ජනතාවට පමණක් සීමා කළ ඉඩම් පවා අද කොම්පැණිකාරයන්ට දී තිබෙනවා. මීට ප්‍රථම තිබුණු ආණ්ඩු මගින් ඒ ඉඩම්වල පාරවල් පවා සකස්කොට වාරිමාර්ග සැලැස්මවල් පවා උමා තිබුණා. අද එවැනි ඉඩම් පවා ධනපතියනට දී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නීල් ද අල්විස් මයා.]

තිබෙනවා. [බාධා කිරීමක්] රට විකුණලා. 1965, 1966 වර්ෂවල එසේ ක්‍රියා කිරීමෙන් තමුන්නාන්සේලාට ලැබී තිබෙන ප්‍රතිඵලය කුමක්ද? විදේශ විනිමය නැතෙයි කියනවා. මීට ප්‍රථම පැවති ආණ්ඩුව මගින් මේ රටට පිටරටින් ආහාර ගෙන්වීම සඳහා යම් කිසි මුදලක් වැය කළා නම් ඒ ප්‍රමාණයෙන් කෝටි 18 ක පමණ විදේශ විනිමයක් අඩු කරමිනුයි, මෙම ආහාර වගාවට බැස්සේ. අද අපට බඩු නැත්තේ එම ප්‍රශ්නය නිසයි. අපට වුවමනා ආහාර ගෙන්වීමට වැය කරන විදේශ විනිමයෙන් කෝටි 18 ක් අඩු කළා, ආහාර වගා කිරීම සඳහා. අද අපට අවශ්‍ය බඩු නැත්තේ එම හේතුව නිසයි. අවශ්‍ය බඩු ගෙන්වීම සඳහා මීට ප්‍රථම වැය කළ ප්‍රමාණය තමුන්නාන්සේලා වැය නොකරනවා නම් නිසියාකාර බඩු ලැබෙන්නේ කෙසේද? එහෙත් මේ අතරතුරේ තමුන්නාන්සේලාට කත් අදින පත්‍රකාරයන් අනික් පැත්තෙන් කියනවා "වරායේ බඩු නැව් තිබෙනවා; ඕනෑ තරම් බඩු ලැබෙනවා" යනුවෙන්. "කිරි ටික එනවා, ඒවා සමුපකාරයෙන් බෙදනවා; සී. ඩබ්ලිව්. ඊ. එකෙන් බෙදනවා" කියනවා. එහෙත් පෝලිම්, පෝලිම්, හැම තැනම පෝලිම්. කෙසේ වෙතත් දරුවන්ට වුවමනා ආහාර ටික ලැබෙන්නෙ නැති බව මේ ගරු සභාවට ඉතාමත් කරුණාවෙන් මතක් කරන්නට ඕනෑ. [බාධා කිරීමක්] කරුණාකර අහගෙන ඉන්න. තමුන්නාන්සේලාගේ දෙපාර්තමේන්තුවලින් සහ මධ්‍යම බැංකුවෙන් ලබා ගත් වාර්තාවල ගණන් මා මේ ඉදිරිපත් කරන්නෙ. තමුන්නාන්සේලා රට ගැන සලකනවා නම් තමුන්නාන්සෙලාගේ ආණ්ඩුව විසින් කරන වැරදි හරිගස්වන්නට ඕනෑ. "ඇත්ත" පත්‍රයක් අපට වුවමනා නැහැ.

**එම්. ඒ. ඩැනියෙල් මයා.** (හේවාහැට)
*(திரு. எம். ஏ. டனியல்—ஹெவாஹெற்ற)*
(Mr. M. A. Daniel—Hewaheta)
හරියට හරි. ඒක තමයි, අපත් කියන්නේ.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)
ගරු කථානායකතුමනි, 1963 දී මේ රටට වුවමනා පෝර ගෙන්වා ගැනීමට අපේ විදේශ විනිමය කෝටි 5.6 ක් පමණ වියදම් කර තිබෙනවා. 1964 අවුරුද්දේදී කෝටි 6.6 ක් පමණ වියදම් කර තිබෙනවා. 1965 අවුරුද්දේදී කෝටි 8.1 ක් පමණ වියදම් කර තිබෙනවා. මා මේ ගණන් සොයා ගත්තේ කස්ටම්ස් රිටර්න්ස් වාර්තාවලින්.

**ගරු හුරුල්ලේ**
*(கௌரவ ஹுருல்ல)*
(The Hon. Hurulle)
කෝටිද, ලක්ෂද?

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)
I know what I am talking about. I know what a ලක්ෂය is and I know what a කෝටිය is. If it is ලක්ෂ 5, then you are talking through your hat.

ගරු කථානායකතුමනි, මේ රටට පෝර ගෙන්වීමට කළ වියදම පිළිබඳව මා තමුන්නාන්සේට ගණන් ඉදිරිපත් කළේ ලක්ෂවලින් නොවෙයි, කෝටිවලින්. මේක විහිලුවක් නොවන බව මා ගමනාගමන ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි. එතුමා එතුමාගේ උතුරු මැද පළාතේ සිටින ගොවීන් ගැන උනන්දුවක් දක්වනවා නම් මේ කරුණුවලට ඇහුම්කන් දී ඒවා කැබිනට් එකට ඉදිරිපත් කරන්නට ඕනෑ. මෙතැනට ඇවිත් ඉස්සරහ පුටුවල වාඩි වී කයිවාරු ගහමින් ජාවාරම්කාරයන්ට උදව් කරනවා නම්, ඒ ගොවීන් ගැන තමුන්නාන්සේලා තුළ අවංක උනන්දුවක් නැති බවයි, පෙනෙන්නෙ.

1966 වර්ෂය පිළිබඳ විස්තර මට ලබා ගැනීමට බැරි වුණා, ඒ වාර්තාව පුස්තකාලයේ නැති නිසා. මුදල් ඇමතිතුමාගේ වාර්තාවකුත් තිබෙනවා. අප පෝරවලට මේ තරම් වියදම් කරනවා. අපේ රටේ දුප්පත් ජනතාවට දුන්න හාල් සේරු දෙක හාල් සේරුව කළ බව තමුන්නාන්සේලා දන්නවා.

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)
ඒ සේරුව දෙන්නෙ නිකම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

ඒ සේරුව නිකම් දෙන බව ඇත්තයි. ඉස්සර නම් හාල් සේරු දෙකම ශත 50 යි. අද හාල් සේරු දෙක 1.60 යි. මුදල් ඇමතිතුමා, ඒ කාරණය මතක් කරන්නට මට අවස්ථාව ලබා දීම ගැන මා සතුටු වෙනවා. නොමිළයේ දෙන හාල් සේරුව පිළිබඳවත් අපේ ගම්බද උදවිය දැන් හොඳ අවබෝධයක් ලබා ගෙන තිබෙනවා.

අවුරුදු පතා පෝරවලට වියදම් කළ මුදල් ප්‍රමාණය ඉදිරිපත් කළා. දැන් හාල් සේරුව නිකම් දෙන්නට පටන් ගැනීමෙන් පසු හාල් වෙනුවට වැය වන මුදල් ප්‍රමාණය අඩු වූ නිසා එයින් වූ වාසිය අයවැය ලේඛනයෙන් පෙනී යනවා. ඒ කාරණයත් මේ ගරු සභාව මගින් රටට සවිස්තරව පෙන්වා දෙන්නට ඕනෑ. රටවාසීන් ඒ කාරණයත් දැනගත යුතුයි. මෙන්න මෙහෙමයි තියෙන්නේ :

"It is anticipated, therefore, that for the current financial year the expenditure incurred on the net food subsidy will decrease by Rs. 150 million to Rs. 157 million. This will be offset to some extent, however, by supplementary provision on recurrent expenditure...."—[OFFICIAL REPORT, 25th July, 1967 ; Vol. 73, c. 27]

මෙහිදී පැන නඟින ප්‍රශ්නය මෙයයි : නොමිලයේ ගොවි මහතුන්ට පෝර ටික බෙදා දීමට ඒ ඉතිරි වන මුදල් ප්‍රමාණයෙන් බැරිද? එහෙම කරන්නට පුළුවන්කමක් නැද්ද? හාල් සේරුව නොමිලයේ දීමෙන් ආණ්ඩුවට ලොකු වාසියක් ලැබෙනවා. ඒ වාසිය යොදා පෝර ටික ගොවි මහතුන්ට නොමිලයේ බෙදා දුන්නොත් ආණ්ඩුවට සිදු වන පාඩුවක් නැහැ. ඒ වාගේම එයින් වී අස්වැන්න වැඩි කර ගන්නටත් පුළුවන් වෙනවා. එතකොට ජාවාරම් කාරයින්ටත් ඉඩක් නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

You are getting more and more to your right and now you are not in your seat.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේ විසින් වෙන් කරන ලද ආකාරයට මා වාඩි වන ආසනය තිබෙන්නේ දැන් මා සිටින ස්ථානයට මදක් එහායින් වුවත් මේ ශබ්ද විකාශන යන්ත්‍රය මගේ ආසනයෙන් මදක් ඈතින් තිබෙන නිසයි මා ටිකක් මගේ අසුනින් ඈතට ගියේ. එහෙත් මං නම් කවදාවත් දකුණට හැරෙන මන්ත්‍රීවරයෙක් නම් නොවෙයි. වාසියක් ලැබෙන හැටියට පෙනී ගියත් කවදාවත් දකුණට නම් හැරෙන්නේ නැහැ. එහෙම හැරෙන මන්ත්‍රීවරයෙක් නොවෙයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ටික ටික ඒ පැත්තට ලිස්සනවා.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

හාල් ප්‍රමාණය අඩු කිරීමෙන් ආණ්ඩුවට ලැබෙන වාසිය කොතෙක්දැයි මා මොහොතකට පෙර තමුන්නාන්සේට විස්තර සහිතව ගණන් ඉදිරිපත් කළා. ගොවි ජනතාවට පෝර බෙදා දීමෙන් වී අස්වැන්න වැඩි කර ගන්නට පුළුවනැයි මේ ආණ්ඩුව විශ්වාස කරනවා නම් ගොවිරාළට පෝර ටික නොමිලයේ දීම ඒ සම්බන්ධයෙන් කළ හැකි විශාල උදවුවක් හැටියට සලකන්නට පුළුවනි. අපරාධ වැඩ පිළිවෙළවලට මුදල් යොදවන්නේ නැතිව —ජාවාරම්කාරයන්ට ඉඩ නොදී—අනුදෙදාහක් කොම්පැණිකාරයන්ට විදේශ විනිමය නොදී, මේ ආණ්ඩුව නියම විධියට ඒ මුදල් යොදා නියම ප්‍රයෝජනයක් නොගන්නේ මන්ද? අද රටේ තිබෙන ලොකුම ප්‍රශ්නය ඒකයි.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

ගොවිරාළලා පෝර ටික කන්නට ගනු ඇතැයි බියක් තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

පෝර කියන වර්ගය කාටවත් කන්නට බැහැ. කසිප්පුකාරයින් පවා සීනිත් රාත් මිස කසිප්පු පෙරීමට පෝර පාවිච්චි කරන්නේ නැහැ. පෝරවලින් කසිප්පු හදන්නටත් බැහැ. ඒ කොයි හැටි වෙතත් අද රටේ තොටේ පාරේ කොහේ ගියත්, බස්රියේ, දුම්රියේ හෝ වෙනත් වාහනයක ගියත් හමුවන හැම දෙනාම පාගේ කථා කරන්නේ බඩු මිල වැඩි වීම ගැනයි. බඩු මිල වැඩි වෙනවා, වැඩි වෙනවා, වැඩි වෙනවා ආදී වශයෙන් කවුරු කවුරුත් කියනවා අහන්නට නිතර නිතර අපට ලැබෙනවා. ඊයේ පෙරේදා කසිප්පු කාරයෙක් මට මෙන්න මෙහෙම කිව්වා.

**ඩැනියෙල් මයා.**
*(திரு. டனியல்)*
(Mr. Daniel)

කසිප්පුකාරයෝද යාලුවෝ ?

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

ඔව්, ඒ අයත් අපේ රටේ ඉන්න උදවිය තමයි. ආහාරවල පමණක් නොවෙයි අපේ කසිප්පු බෝතලයේ මිලත් සීනි මිල වැඩි වීමත් එක්ක වැඩි වුණායයි ඒ උදවිය අපට කියනවා. කසිප්පු බෝතලේ මිලත් ශත තිහකින් වැඩි වෙලා තියෙනවාය කියනවා. ඒ උදවියත් ආණ්ඩුවට බණිනවා. හොඳ ලක්ෂණට බණිනවා. අනෙකුත් අය බණිනවාට වඩා ලක්ෂණට බණිනවා. මොකද, හොඳට " වියුන් " වෙලා නොවැයි බණින්නේ.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

රේඩියෝවෙන් විතරයි ආණ්ඩුවට බණින්නේ නැත්තේ.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

මේ කරුණු සියල්ලක්ම රටේ ඉන්න හැම දෙනාම අද දන්නවා. අප මහජන මන්ත්‍රීවරුන් වශයෙන් ඒ කරුණු ජනතාවට හොඳහැටි අවබෝධ කර දිය යුතුයි. පසුගිය අවුරුද්ද ඇතුළත තමුන්නාන්සේලා ජනතාවට අවශ්‍ය රතුළූණු ආදී ද්‍රව්‍ය ටික —ආණ්ඩුවේ ආධාරයකුත් ඇතිව—නියම මිළට ලබා දීමට කටයුතු කළා. පසුගිය ආණ්ඩුවත් ඒ විධියට කටයුතු කළා. ඒ ද්‍රව්‍ය ටික මේ ආණ්ඩුව ජනතාවට නියම මිළට ලබා දුන්නත් අනෙක් පැත්තෙන් සීනි, පිටි ආදී ද්‍රව්‍යවලින් විශාල ලාභයක් ගත්තා. ඒ පිළිබඳව ගණන් හිලවු ඇතිව විස්තරයක් තමුන්නාන්සේට ඉදිරිපත් කරන්නට මට පුළුවනි. හාල්, රතුළූණු ආදී ද්‍රව්‍ය සඳහා මේ ආණ්ඩුව යම් මුදලක් වියදම් කළා නම්, ඊට වඩා ලොකු ලාභයක් සීනි, පිටි ආදී ද්‍රව්‍යවලින් ආණ්ඩුව ලබා ගත් බව මා තමුන්නාන්සේට මතක් කරන්නට ඕනෑ. ආණ්ඩුවේ ආධාර ඇතිව දුන් හාල්, රතුළූණු ආදී ද්‍රව්‍ය වෙනුවෙන් කෝටි 45.9 ක් ආණ්ඩුවට වියදම් වී තිබෙනවා. එහෙත් අනෙක් පැත්තෙන් පිටිවලිනුත් සීනිවලිනුත් ආණ්ඩුව කෝටි 21.7 ක ලාභයක් ලබාගෙන තිබෙනවා. දැනට පළ වී තිබෙන ගණන් හිලවුවලින් මේ කරුණු හොඳට පැහැදිලි වෙනවා.

ආණ්ඩුවේ ආහාර වගා කිරීමේ ව්‍යාපාරයෙන් ප්‍රයෝජන ලබා ගන්නේ ජාවාරම්කාරයින් බව මා මීට පෙරත් තමුන්නාන්සේට මතක් කර තිබෙනවා. එය ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් පවා දන්න කරුණක්. එච් 4 වී වර්ගයේ අස්වැන්න වැඩි බව කියමින් ඒවාම වපුරණ ලෙස ආණ්ඩුව හැම විටම ගොවි ජනතාවට උපදෙස් දෙනවා. ඒ වී වර්ගය වපුරණ විට ඒවාට නිසි පෝර වුවමනා කරනවා. අද ඉස්කෝලවල ළමයින් යොදා කොයිතරම් කුඹුරු නෙළුවත්, එච් 4 වී වර්ගය වැපුරූ විට ඒවාට නිසි පෝර ටික දැම්මායින් පසු නෙලීමක් වුවමනා නැති බව කියැවෙන ආණ්ඩුවේ වාර්තා තිබෙනවා. බලාපොරොත්තු වන තරම් ප්‍රතිඵලයක්, නෙලීමෙන් ලැබෙන්නේ නැති බව ආණ්ඩුවේම විශේෂඥයකු කියා තිබෙන බව මා මේ ගරු සභාවේදීම මීට පෙරත් පෙන්වා දී තිබෙනවා.

මේ වී වර්ගය සම්බන්ධයෙන් තවත් ප්‍රශ්නයක් තිබෙනවා. මෙවායේ අස්වැන්න වැඩි වුණත් මේ වර්ගයේ ගොයම්, පැගීම අමාරුයි. ඒ අවස්ථාවේදී ගොවීන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්නට සිදු වන එකම දේ ගොයම් පැගීමට ට්‍රැක්ටරයක් ලබා ගැනීමයි. අද මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ අනුව එච් 4 වී වගා කරන ගොවීන්ට ගොයම් පාගන කාලයේදී නියම වේලාවට ට්‍රැක්ටරයක් ලබා ගන්නට බැරි වුණොත්, හදිසි වැසි වක් හේම ඇති වුණොත්, ඒ වී ටික කමතේම පැළ වෙනවා.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Now you are going on to the next Motion.

නීල් ද අල්විස් මයා.
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

No, the difficulties of the cultivators.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

That is true, but you have a definite Motion.

නීල් ද අල්විස් මයා.
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

The Motion is that you must give them the manure, the facilities and assistance in every way. I will deal with this more minutely when the next Motion comes up, but through this august Assembly I want the people to know the difficulties.

මා කථා කරන්නේ අපේ ගොවි මහත්වරුන්ට තිබෙන අමාරුකම් ගැනයි. යම් ගොවියකුට අවශ්‍ය ට්‍රැක්ටරයක් නියම වේලාවේදී ලබා ගන්නට ඔහුට බැරි වුණොත් වී ටික නාස්ති වී යනවා. යම් විධියකින් බද්දට, කුලියට ට්‍රැක්ටරයක් ලබා ගත්තොත්, ගොවියාගේ අස්වැන්න වැඩි වීමේ ප්‍රයෝජනය ලබා ගන්නේ ගොවියා නොව අර ට්‍රැක්ටර් සැපයූ ජාවාරම් කාරයායි.

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Will you please confine yourself to the Motion?

නීල් ද අල්විස් මයා.
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

තමුන්නාන්සේට මා නිතරම කීකරුයි.

පෝර ප්‍රශ්නය ගැන මා නැවතත් මතක් කරන්නට ඕනෑ. මේ ආණ්ඩුව ඇස් දෙක ඇර අවංකව බැලුවහොත් පෝර ටික ගොවි මහත්වරුන්ට නොමිලයේ බෙදා දීමේ ලාභය පෙනෙයි. අද මේ වියදම් කරන විදේශ විනිමය ප්‍රමාණයෙන් කොටසක් අපේ ආහාර වගාවට යෙදුවහොත් නියම ප්‍රතිඵලය ලබා ගන්නට පුළුවන් වෙනවා. නමුත් අප ආරම්භ කරන සෑම ව්‍යාපාරය කින්ම නියම ප්‍රතිඵල ලබා ගන්නට බැරි වී තිබෙන්නේ ජාවාරම්කාරයින් නිසයි. ජාවාරම්කාරයින් නැති කරන්නට තිබෙන එකම ක්‍රමය පෝර නොමිලයේ බෙදා දීම බව මා මතක් කරන්නට සතුටුයි. පෝර ටික නොමිලයේ දීමෙන් කවදාවත් පාඩුවක් වන්නේ නැහැ. පෝර කන්නට පුළුවන්ද? වගාව හැර වෙනත් වැඩකට පාවිච්චි කරන්නට පුළුවන්ද? බැහැ. පෝර පාවිච්චි කරන්නට පුළුවන් ගොවි තැනට පමණයි. එම නිසා මේ යෝජනාව අනුව නොමිලයේ පෝර බෙදා දීමෙන් විශාල ප්‍රතිඵලයක් ලබා ගන්නට පුළුවන් වන බව මතක් කරමින් මගේ කථාව මෙයින් අවසාන කරනවා.

අ. භා. 3.3

ජෝර්ජ් රාජපක්ෂ මයා. (මුල්කිරිගල)
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ—முல்கிரிகல)*
(Mr. George Rajapaksa—Mulkirigala)

ගරු කථානායකතුමනි, බද්දේගම ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ වැදගත් යෝජනාව මා සතුටින් ස්වීර කරනවා. මේ ගරු සභාවේ මැති ඇමතිවරුන් අතරින් එක්කෙනකුවත් මේ වැදගත් යෝජනාවට විරුද්ධ වේවිය කියා මා සිතන්නේ නැහැ. ගොවීන්ට නොමිලයේ පෝර බෙදා දිය යුතුය කියන මේ යෝජනාව ඒ කමතිකව සම්මත කරාවිය කියා මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]

කල්පනා කරනවා. ගරු ඇමතිතුමා මේ යෝජනාවට කැමතිද ? කැමති නම් තවදුරටත් විවාද කරන්නට වුවමනාවක් නැහැ. යෝජනාව සභාභිමුඛ කර ඒකමතිකව සම්මත කර ගන්නට පුළුවනි. මේ රටේ ගොවි ජනතාවට යහපතක් කරන්නටයි මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නෙ. නමුත් අපට පෙනෙන්නේ මේ රටේ ගොවීන්ට නොමිලයේ පෝර බෙදා දිය යුතුය කියන මේ යෝජනාවට ආණ්ඩුව අකැමැති බවයි. එම නිසා තමයි ආහාර හා කෘෂිකර්ම ඇමතිතුමා නිසොල්මන්ව සිටින්නෙ.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

නැහැ, නැහැ. මම කථා කරනවා.

ජෝර්ජ් රාජපක්ෂ මයා.
(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)
(Mr. George Rajapaksa)

අද පෞද්ගලික මන්ත්‍රීන්ගේ දිනයක්. මේ දිනය වෙන් කර තිබෙන්නේ රටේ තිබෙන වැදගත් ප්‍රශ්න සම්බන්ධව යෝජනා ඉදිරිපත් කර පෞද්ගලික මන්ත්‍රීන්ගේ අදහස් රටට ප්‍රකාශ කිරීමටයි. නමුත් ඇතැම් මන්ත්‍රීවරුන් යම් යම් තැන්වල එබිකම් පාමින් සුපුරුදු ලෙසට ගණපූරණය නැති කිරීමට උත්සාහයක් දරණ බව අපට පෙනෙනවා. එම නිසා ගණපූරණය නැති කරන්නට ක්‍රියා නොකර මේ විවාදය අවසාන වන තුරුවත් ගණපූරණය තබා ගැනීමට විරුද්ධ පක්ෂයට ආධාර කරන මෙන් මා මේ අවස්ථාවේදී ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමනි, අද රටේ සෑම තැනකදීම බස් රියේදීත්, දුම්රියේදීත් කඩ පොළේදීත්, ගුවන් විදුලියෙනුත් අපට ඇසෙන්නේ ආහාර වගා කරන්නය යන්නයි. ආහාර වගා කරන්නය කියා විශේෂයෙන්ම ගුවන් විදුලියෙන් නිතර දෙවේලේ විශාල ප්‍රචාරයක් ගෙන යනවා. පෙනෙන්නට නැති වුණාට රජයේ මැති ඇමතිවරුන් ආහාර වගා කිරීම සම්බන්ධව විශාල උත්සාහයකින් කටයුතු කරනවාය කියා වේදිකාවලදී කියනවා. එම නිසා

රසායන පෝර නොමිලයේ බෙදා දීම

මේ වැදගත් යෝජනාව ගැන රජයේ විශේෂ සැලකිල්ල යොමු විය යුතු බව මා මතක් කරනවා. එක් අතකින් රජය ආහාර වගා කිරීමේ ව්‍යාපාරයට විරුද්ධ පක්ෂයේ සහයෝගය ඉල්ලනවා. අනෙක් අතින් රජය චෝදනා කරනවා ආහාර වගා කිරීමේ ව්‍යාපාරය කඩාකප්පල් කරන්නට විරුද්ධ පක්ෂයේ ඇතැම් උදවිය කටයුතු කරනවාය කියා. රටට වුවමනා කරන ආහාර ද්‍රව්‍ය මේ රටේම වගා කරන්නට පුළුවන් නම් මේ රටේ ආහාර වගා කරනවාට විරුද්ධ වන, අවහිර කරන, කිසිම පුරවැසියකු සිටිනවාය කියා මා නම් සිතන්නේ නැහැ. ආහාර වගා කිරීම සම්බන්ධයෙන් අද රජය ගෙන යන ව්‍යාපාරය සම්බන්ධව විරුද්ධ පක්ෂය ඇතැම් අවස්ථාවලදී විවේචනය කරනවා. එසේ විවේචනය කරන්නේ රජය ඇතැම් අවස්ථාවලදී ක්‍රමවත් වැඩ පිළිවෙළකින් තොරව කටයුතු කරන නිසයි. මේ රටේ ගොවියන්ට නොමිලයේ පොහොර බෙදා දීමෙන් රජයට යහපතක් මිස අයහපතක් වන්නේ නැති බවත්, ඒ හේතුවෙන් ආහාර ප්‍රශ්නය බොහෝ දුරට විසඳෙන බවත්, රජයට මුදල් අතින්වත් පාඩුවක් සිදු වන්නේ නැති බවත්, සංඛ්‍යා ලේඛන මගින් කරුණු සහිතව බද්දේගම ගරු මන්ත්‍රීතුමා (නීල් ද අල්විස් මයා.) පෙන්නා දුන්නා.

රටක ගොවිතැන සරුසාර කිරීමට නම්, ආහාරයෙන් රටක් ස්වයම්පෝෂිත කිරීමට නම්, පළමුවෙන්ම කළ යුත්තේ ගොවියා කෙරෙහි විශ්වාසයක් තබන්නේ නැතිව දීමයි. මේ රජයේ ආහාර වගා ව්‍යාපාරය අප විවේචනය කරන්නේ, රජය ගොවීන් කෙරෙහි විශ්වාසයක් තබන්නේ නැතිව මේ රටේ ධනපති කොම්පැණිකාරයන් කෙරෙහි විශ්වාසය තබා ආහාර වගා කිරීමේ ව්‍යාපාරය ආරම්භ කළ නිසයි. අහිංසක ගොවීන් රජයේ ඉඩම් අක්කරයක් අනවසරයෙන් අල්ලාගෙන වගා කළ වහාම අද වන තුරුත් කෙරෙන්නේ ඔහු උසාවිය ඉදිරියට පමුණුවා දඩ ගැස්වීමයි. අනවසරයෙන් දුව දඬු කැපූ අහිංසකයකු වෙතොත් ඔහුට විරුද්ධව නඩු පවරා හිරගෙට යවනවා. එහෙත් ආහාර වගා කිරීමේ මුවාවෙන් කොම්පැණිකාරයන්ට, ධනේශ්වර පන්තියට, ලොකු ජාවාරම්කාරයන්ට අක්කර දහස් ගණනින් රජයේ ඉඩම් බෙදා දී තිබෙන බව රජය අද පිළිගන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ජීප් රථ දෙනවා.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)
ඔව්, ජීප් රථ දෙනවා; මිනිමෝක් රථ දෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
තමුන්නාන්සේලාටත් ලැබෙනවා.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)
අප නැතැයි කියන්නේ නැහැ. තමුන්නාන්සේලා දුන් නිසා අප ඒවා ප්‍රයෝජනයට ගන්නවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
පෝරමයේ සඳහන් කළේ මොන ආහාර වවනවා කියාද ?

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)
මොන පෝරමයේද ?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
පෝරමයේ සඳහන් කළ විධියට කටයුතු කරනවාද ?

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)
කටයුතු කරනවා. මා කිසිම පෝරමයක් පිරෙව්වේ නැහැ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
වංචා කරනවා.

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)
මා කිසිම පෝරමයක් පිරෙව්වේ නැහැ. මොකක්ද, වංචාව ? ආහාර ඇමතිතුමා අස්ථානයේ චෝදනා කරනවා. මා පෝරමයක් ඉදිරිපත් කළා නම් කරුණා කර එය මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න. මා ඉදිරිපත් කළේ ලියවිල්ලක් පමණයි. මගේ ශක්ති ප්‍රමාණයට සුළු වශයෙන් ආහාර වගාකරන බවයි, එහි සඳහන් කළේ. ඒ අනුව අප කටයුතු කරනවා. අපේ පළාතට ඇවිත් බලන ලෙස මා ආරාධනා කරනවා. මා තමුන්නාන්සේලාගේ ආහාර වගා කිරීමේ ව්‍යාපාරයට වැඩ කරන්නේ නැහැ. [බාධා කිරීම්] තමුන්නාන්සේලා ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් පැහැදිලිවම කියා තිබෙනවා, ධනපති කොම්පැණිකාරයන්ට ඉඩම් දීමේ ව්‍යාපාරය අසාර්ථක බව. [බාධා කිරීම්] දැන්වත් පිළිගන්නවා නම් හොඳයි. ඒ අයට සහන සලස්වා තිබෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
තමුන්නාන්සේලා වැනි හොරුන් ඉන්න බව අප දැන් දන්නවා. [බාධා කිරීම්]

**ජෝර්ජ් රාජපක්ෂ මයා.**
*(திரு. ஜோர்ஜ் ராஜபக்ஸ)*
(Mr. George Rajapaksa)
එහෙත් ගොවි ජනතාවට සහන සලසන්නේ නැති නිසයි, අප පැමිණිලි කරන්නේ.

ඒ කාලයේදී තමන්ට වුවමනා රසායනික පොහොර, ගොවි උපකරණ, ආදිය සියයට 6 යේ පොලියට ණයට ලබා ගන්නට ගොවියන්ට පහසුකම් සලසා තිබුණා. අප මේ රජයට දොස් පවරන්නේ ඒ තත්ත්වය එසේ තිබෙන්නට හරින්නේ නැතිව ගොවීන් පිට වැඩියෙන් බර පැටවීම ගැනයි. ඒ කාලයේ සියයට 6 ක පොලියකට ණය පහසුකම් සලසා තිබුණු ගොවියන්ට මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජෝර්ජ් රාජපක්ෂ මයා.]

කාලයේදී සියයට 12 ක පොළියක් ගෙවන්නට සිදු වීම පහසුවක් නොවෙයි, හිරිහැරයක්. එය කවුරුනුත් පිළිගන්නවා. ගොවීන්ට නොමිළයේ පොහොර බෙදා දුන්නාට රජයට පාඩුවක් වන්නේ නැහැ. බද්දේගම ගරු මන්ත්‍රීතුමා කීවා වාගේ, පොහොර අනුභව කරන්නට බැහැ. කොයි විධියෙන් හෝ මහ පොළොවටයි, පොහොර යෙදවෙන්නේ. ඒ හේතුවෙන් අස්වැන්න වැඩි වෙනවා. අස්වැන්න වැඩි කර ගැනීමට නම් වැඩි වැඩියෙන් රසායනික පොහොර පාවිච්චි කරන්නට ඕනෑ. ඒ නිසා හැකි තාක් දුරට ගොවීන්ට අත්‍යවශ්‍ය දේ—අඩු වශයෙන් පොහොරවත්—නොමිළයේ ලබා දුන්නොත් මීට වඩා අස්වැන්නක් ලබා ගන්නට පුළුවනි.

ගිය අවුරුද්දේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ පොහොර පාවිච්චි කිරීම දෙගුණයකින් වැඩි වුණු බව ගරු ඇමතිතුමා දන්නවා ඇති. ඒ නිසා ඒ ප්‍රදේශයෙන් වෙනදා නොලැබුණු අස්වැන්නක් ගොවීන්ට ලැබුණා. එහෙත්, බලාපොරොත්තු රහිතව ගංවතුර ආවාම, ඉඩෝරය නිසා කුඹුරු වේලී ගියාම ණයට ගත් පෝරවලින් ප්‍රයෝජනයක් ලබන්නට බැරි වෙනවා. දෙවැනි වතාවට ණය ගන්නට සිදු වන්නේත් සියයට දොළහේ පොළියටයි. අන්න ඒකයි, අමාරුව. එසේ හෙයින් පෝරවත් නොමිළයේ දෙන්නට ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටිනවා. පෝර නොමිළයේ දීමෙන් සිදු වන්නේ ගොවියන් වැඩි වැඩියෙන් කුඹුරුවලට පෝර යෙදීමයි. එවිට අස්වැන්න වැඩි වෙනවා. පෝර නොමිළයේ දීමෙන් වාසියක් මිස අවාසියක් නැති බව මා කියන්නේ ඒ නිසයි.

පෙර මෙන් නොව දැන් ගොවියන් පෝර යෙදීමට උනන්දුවක් දක්වනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව පවතිද්දී දැනට සිටින ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා, මෙම රටෙහි කරවල වර්ග තුනක් තිබෙන බවත්, තෝර, මෝර, පෝර යනු ඒවායේ නම් බවත් ප්‍රකාශ කළා. හැබැයි, මේ ආණ්ඩුව යටතේ තිබෙන්නේ පෝර කරවල විතරයි. ඒ පෝර කරවල ටිකවත් නොමිළයේ බෙදා දෙන්න. එයින් අස්වැන්න වැඩි වන බවට සැකයක් නැහැ.

ගුවන් විදුලියෙන් පමණක් ආහාර වගා කිරීම අමාරුයි. ආහාර වගා කිරීමේ ව්‍යාපාරය සම්බන්ධයෙන් බුද්ධිමත් කෙනකුට පිළිගත හැකි වන අන්දමේ කාරණා ගුවන් විදුලිය මඟින් ප්‍රචාරය කරනු ලබනවා නම් හොඳයි. එහෙත් දැන් සිදු වන්නේ ඊට හාත්පසින්ම වෙනස් දෙයක්. අද ගුවන් විදුලියෙන් ප්‍රචාරය වන කාරණා දෙස බැලුවාම මුළු ආහාර වගා ව්‍යාපාරයම විහිළුවට ලක් වෙනවා. ලූනු රාත්තල් දෙකකින් හොණ්ඩර හතරක අස්වැන්නක් ලැබුණු බව වැනි කිසිවකුට පිළිගන්නට පුළුවන්කමක් නැති දේවල් ගුවන් විදුලියෙන් ප්‍රචාරය කරන නිසා එයින් ප්‍රචාරය වන සත්‍ය කාරණා පවා විශ්වාස නොකරන තත්ත්වයට අද මහජනයා වැටී සිටිනවා. සත්‍ය සියයක් මධ්‍යයේ එක බොරුවක් කී විට අර සත්‍ය සියයත් බොරු යයි හිතන්නට මිනිසුන් පෙළඹීම ස්වභාවයක්. අපේ රටේ ජනතාව වගාවට උනන්දුයි. එහෙත් ආහාර වගා ව්‍යාපාරය සම්බන්ධයෙන් ගුවන් විදුලියෙන් ප්‍රචාරය වන බොරු නිසා මහජනයා ඊට කන් දෙන්නට කැමැති නැහැ. බොරු අසන්නට බැරි නිසා ඔවුන් ගුවන් විදුලියට කන් දෙන්නේ නැහැ.

මීට පෙරත් පෝර නොමිළයේ දී තිබෙනවා. උදාහරණයක් කියන්නම්. මා නියෝජනය කරන ප්‍රදේශයේ පැඟිරි වගාව ඉතාමත් පහත් තත්ත්වයට ඇද වැටුණු අවස්ථාවේදී පැඟිරි වෙනුවට අක්කර විසිපන්දාහක පොල් සිටු වීමට පසුගිය ආණ්ඩුව ආධාර දුන්නා. පොල් පැළ නොමිළයේ දුන්නා. පෝර නොමිළයේ දුන්නා. අවුරුද්දකට පොල් ගසකට ශත පණහ බැගින් දුන්නා. මේ නිසා පැඟිරි වතු පොල් වතු බවට පත් වීගෙන යනවා. අද ඒ ප්‍රදේශයේ විශාල පොල් වතු ඇති වී ගෙන යනවා. ඒ ජනතාව පෝර අහක දැම්මේ නැහැ. ඒවා විකුණා ගත්තේත් නැහැ. ඒවා පොල් වතුවලට යෙදෙව්වා. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අනාගතයේදී සාරවත් පොල් වගාවක් ඒ පළාතේ ඇති වෙනවා නිසැකයි. පැඟිරි වගාව දියුණු කරන්නට බැරි නිසයි, පොල් වගාව ඇති කෙළේ. පෝර නොමිළයේ බෙදා දීම වගාවේ දියුණුවට ආධාරයක් වෙනවා. ඒ නිසයි, පෝර නොමිළයේ බෙදා දෙන ලෙස අප ඉල්ලා සිටින්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විරුද්ධ පාර්ශ්වයේ සිටින අප ආහාර වගා ව්‍යාපාරයට විරුද්ධ බවට ආණ්ඩු පක්ෂය තුළ මතයක් තිබෙනවා. එහෙත් එය සම්පූර්ණයෙන්ම වැරදි මතයක්. අප නියෝජනය කරන ප්‍රදේශවල ආහාර වගා ව්‍යාපාරය සඳහා විරුද්ධව සිටින්නේ විරුද්ධ පාර්ශ්වයේ අය නොව එක්සත් ජාතික පක්ෂයේ අයමයි. රජයේ උදවියමයි. නියම තත්ත්වය ඒ ප්‍රදේශයේ ආණ්ඩුවේ නිලධාරීන්ගෙන්ම දැන ගන්නට පුළුවනි. පෝර සහ බිත්තර වී ණයට දීමට ආණ්ඩුව පියවර ගත් අවස්ථාවේදී ඊට විරුද්ධව ප්‍රචාරයන් ගෙන ගියේ ආණ්ඩු පක්ෂයේ උදවියමයි. ආණ්ඩුවෙන් දෙන බිත්තර වී හොඳ නැති බව ඒ අය ප්‍රකාශ කළා. පෝර ණයට වුවමනා නැති බවත් ඒ අය කීවා. මේ උදවිය කලින් කරගෙන ගියේ මොකක්ද? ඔවුන් පුරුද්දක් වශයෙන් ගොවියන්ට බිත්තර වී ණයට දී ඒ සඳහා සියයට පණහක පොළියක් අය කර ගැනීමේ සිරිතක් තිබුණා. ඒ නිසා සියයට 12 ශේ පොළියට හෝ ණයට බිත්තර වී දීමෙන් ඔවුන්ට පහරක් වදින නිසයි තමුන්නාන්සේලාගේ ව්‍යාපාරය කඩාකප්පල් කිරීමට ඒ අය ඉදිරිපත් වුණේ. එයට ප්‍රතිවිරුද්ධව අපි කටයුතු කළා. තමුන්නාන්සේලා කියන අන්දමට සියලුම ගොවීන් ණය ගත්තා. එහෙත් එසේ දෙන සහනය ප්‍රමාණවත් මදිය කියලයි අපි කියන්නේ.

ගරු කථානායකතුමනි, මේ යෝජනාව ආණ්ඩුවට අහිතකර එකක් නොවෙයි. මේ රට ආහාරවලින් ස්වයංපෝෂිත කරන්නට පුළුවන් නම් අපි සතුටු වෙනවා. එහෙත් ගොවියා කෙරෙහි විශ්වාසය තබන්නේ නැතිව, ගොවියාට වුවමනා කරන ගොවි උපකරණ, පොහොර ටික, බිත්තර වී ටික පහසු අන්දමකට දෙන්නේ නැත්නම්, තමුන්නාන්සේලාගේ බලාපොරොත්තුව කවදාවත් ඉටු වන්නේ නැහැ. සියයට 6ක්ව තිබුණු පොළිය සියයට 12ක් කිරීම සහනයක් නොවෙයි. බිත්තර වීවලටත් එම පොළියම ගැනීම සහනයක් නොවෙයි. ගොවියා ගන්න මුදල්වලට සියයට 12 ක පොළියක් අය කිරීම සහනයක් නොවෙයි. අද ගොවියාගේ තත්ත්වය එදාට වඩා නරක බව තමුන්නාන්සේලා පිළිගන්නට ඕනෑ. ධනේශ්වර පන්තියේ කොම්පැනිකාරයින් කෙරෙහිම විශ්වාසය නොතබා මේ රටේ ගොවි ජනතාව කෙරෙහිත් විශ්වාසය තබා ඔවුන්ට වැඩි වැඩියෙන් ණය පහසුකම් හා පෝර පහසුකම් ලබා දී මේ කටයුත්ත කරන්නට තමුන්නාන්සේලා සූදානම් වුණොත් බලාපොරොත්තු වන ඉක්මනටම නැතත් හැකි තරම් ඉක්මනින් බලාපොරොත්තුව සාර්ථක කර ගන්නට පුළුවන් වේය කියා හිතන්නට පුළුවන්. ඒ නිසා බද්දේගම ගරු මන්ත්‍රීතුමා (නීල් ද අල්විස් මයා.) විසින් ඉදිරිපත් කරන ලද මේ ඉතාමත්ම වැදගත් යෝජනාව රජය මගින් පිළිගන්නා ලෙස මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
*Question proposed.*

අ. භා. 3.19

තුඩාවේ මයා.
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු කථානායකතුමනි, බද්දේගම ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර තිබෙන්නේ ඉතාමත්ම කාලෝචිත යෝජනාවක්. මේ රට ආහාර අතින් ස්වයංපෝෂිත කිරීමට කටයුතු කරනවාය කියා රජය නිතරම කෑගහනවා. මේ ආණ්ඩුව ආහාර වගාකිරීමේ ව්‍යාපාරය යටතේ විශාල කොම්පැනිකාරයන්ට අක්කර 25,890 ක් බෙදා දී තිබෙනවාය කියා බද්දේගම ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවෙන් පැහැදිලි කර දුන්නා. එමෙන්ම ඒ ඉඩම්වලින් සියයට 20කට වඩා වගා කර නැත කියා "ඩේලි නිවුස්" පත්තරයේ පළ වී තිබුණාය කියලත් එතුමා සඳහන් කළා. එහෙත් කොම්පැනිකාරයන්ට දී ඇති මේ අක්කර 25,890 ක් වූ ඉඩම්වල තිබුණු විශාල ගස්—වටිනා දැව—කපා ගැනීමෙන් මේ කොම්පැනිකාරයින් ආණ්ඩුවට මෙන්ම මුළු රටටම විශාල පාඩුවක් කර තිබෙන බව එතුමාගේ කථාවෙන් නොකියැවුණු කරුණක්. මේ රටේ කැලෑ මේ රටේ ජාතිය සතු වටිනා වස්තුවක්. ඒවා විනාශ කර කොල්ලකෑමට මේ ආණ්ඩුවේ හිතවතුන්ට ඉඩ දී තිබෙනවා. එය ඉතාමත්ම අසාධාරණ අන්දමින් තමන්ගේ පන්තියට දෙන විශේෂ වරප්‍රසාදයක් හැටියට සඳහන් කිරීමට අපට සිදු වී තිබේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

නවා. මේ ධනේශ්වර කොම්පැනිකාරයින් ඒ ඉඩම්වල දැව කපාගෙන කිසිම වගාවක් නොකර අත්හැර දමා ඇති අතරම, එසේ කපාගත් දැවවල වටිනාකම ආණ්ඩුවට එළි දරව් නොකර ආදායම් බද්දෙන් මිදීමට මේ ධනපති කොම්පැනිකාරයින්ට ඉඩ දී තිබෙනවා. එය ආහාර වගාවේ නාමයෙන් රටට සිදු කර ඇති විශාල හානියක් බව මා කියනවා. එමෙන්ම ඒ අන්දමට ආදායම් බදු නොගෙවා වරදක් කරන මේ කොම්පැනිකාරයින්ට විරුද්ධව නීතිප්‍රකාර කට යුතු කිරීමට මේ රජය මැළි වන්නේ ඇයි කියා අහන්නටත් අපට සිදු වී තිබෙනවා.

ආහාර වගාව සඳහා ලබාගත් ජීප් රථ හා මිනිමෝක් රථ සිනමා ශාලා ළඟත් තම තමන්ගේ ළමයින් විද්‍යාලවලට එක් කර ගෙන යෑම සඳහා පාවිච්චි කර විද්‍යාල ළඟත් නතර කර තිබෙනවාය කියන එක මේ රජය පිළිගන්නවා ; ගරු ඇමතිතුමාත් එසේ කියා තිබෙනවා. ලක්ෂ ගණනක් විදේශ විනිමය වියදම් කර ගෙන්වූ එම වාහන වැරදි විධියට පාවිච්චි කරනවාය කියා ගරු ඇමතිතුමාම කියා තිබෙනවා. එතුමා කරපු මෝඩ ක්‍රියාව ගැන දැන් එතුමාට තේරුම් ගොස් තිබෙන බවයි, එයින් පෙනෙන්නේ. රට ස්වයංපෝෂිත කරන්නට කැමති ගොවීන්ට සහ රැකියා නැති තරුණයන්ට උදව් දී රටේ ආහාර වගාව දියුණු කරනවා වෙනුවට කොම්පැනි කාරයන්ට ආධාර අනුබල දීමේ තේරුම කුමක්ද? තමන්ගේ මැතිවරණ ව්‍යාපාර වලදී මුදල් ටිකක් දුන්නාය කියන පලියට ඒ උදවිය සතුටු කිරීම උදෙසා මෙසේ ඉඩම් පවරා දී කරන්නට ගිය මෝඩකම දැන් එතුමාට තේරුම් ගොස් තිබෙන නිසයි, මෙවැනි ප්‍රකාශයක් කර තිබෙන් නේ. මෙවැනි ප්‍රකාශයක් කිරීම පමණක් ප්‍රමාණවත් නැහැ. මෙම ඉඩම් පවරා දීමට මූලික වූ යම්කිසි ඇමතිවරයකු සිටිනවා නම් ඇත්ත වශයෙන්ම ඒ ඇමතිවරයා විසින් කළ යුතුව තිබෙන්නේ සිය ඇමති ධුර යෙන් ඉල්ලා අස් වීමයි. එක්තරා දුම්රිය ගැටුමක් සිදුවුණු අවස්ථාවේ ඉල්ලා අස් වන්නට තරම් ධෛර්යයක් ඉන්දියානු ආණ්ඩුවේ ඇමතිවරයකුට තිබුණොට මොක ද, මේ අන්දමින් මංකොල්ල කෑමට ධන පති ජාවාරම්කාරයන්ට ඉඩකඩ ලබා දුන් ඇමතිවරයාට තවම පිටකොන්ද පණ ඇවිත් නැහැ, තමන්ගේ ඇමති ධුරයෙන් ඉල්ලා අස් වන්නට.

ගරු කථානායකතුමනි, දොම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාර නායක මයා.) ප්‍රශ්නයක් ඇසූ අවස්ථාවේ දී අගමැතිතුමා හෝ වෙනත් ගරු ඇමති වරයෙක් පිළිගත්තා මේ ආණ්ඩුවේ උප ඇමතිවරුන් පවා ඉඩම් අරගෙන තිබෙන වය යන්න. වගා කිරීමේ මුවාවෙන් අක් කර සිය ගණන්—

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ඇමතිවරයකු සම්බන්ධයෙන් චෝදනා වක් කරන්නට ගරු මන්ත්‍රීතුමාට වුවමනා කරනවා නම් ඒ සඳහා වෙනම යෝජනා වක් ගෙනෙන්නට ඕනෑ. මේක පොහොර සම්බන්ධයෙන් බල පවත්නා යෝජනා වක්. එම නිසා ඒ ගැන කතා කරන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මේ අන්දමට කොම්පැනිකාරයන්ට ඉඩම් පවරා නොදී, ගොවිතැන් කිරීම සඳහා මෙම ඉඩම් නොමිලයේ ගොවි ජන තාවට බෙදා දී එමගින් රට ස්වයංපෝෂිත කරන්නට බැරිද? ආහාර වගා කිරීම ගැන කතා කරන විට ආහාර වගා කෙරෙන ඉඩ කඩම් පිළිබඳව කතා නොකර බැහැ. සම හර ඇමතිවරුන් තමන්ට දී තිබෙන ඉඩම්——

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

මේ ගැන මා ගරු මන්ත්‍රීතුමාට වරක් මතක් කළා. මා නැවත වරක් කියනවා. ප්‍රශ්නයට අදාළව කතා කරන ලෙස. ඔය අන්දමට කතා කරන්නට ගියොත් කවදා වත් ඉවර වෙන්නේ නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මා කියන්නේ මෙයයි: මෙම ප්‍රශ්න යේදී කිව්වා, එම ඉඩම් සම්පූර්ණයෙන්ම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආපසු ලබා ගන්න බව. එම වැරදි ක්‍රියාව ආණ්ඩුව විසින් පිළිගනු ලැබුවා. උප ඇමතිවරුන් අරගෙන තිබෙනවා නම් ඒවා සම්පූර්ණයෙන් ආපසු ගන්නා බව කිව්වා. ඒ විධියට දෙන්නේ නැති බව කිව්වා. එය කෙළින්ම ඉටු කර තිබෙනවාද යන්නයි, දැනගත යුතුව තිබෙන්නේ. අපට දැන ගන්නට ලැබී තිබෙන ආකාරයට නම් තවම එය ඉටු වී ඇත්තේ නැහැ. මහජනතාවට බෙදන්නට පෙර ඇමතිවරුන් බෙදා ගන්නා ලද ඉඩම් ආපසු දෙනවාය කියා තිබෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ඒ සම්බන්ධයෙන් කතා කරන්නට වුවමනා නම් වෙනම යෝජනාවක් ගෙනැවිත් කතා කරන්නට පුළුවනි. කරුණා කර මෙම යෝජනාව යටතේ එම කරුණු ඉදිරිපත් කරන්නට එපා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

හොඳමයි, ගරු කථානායකතුමනි, මේ ඉඩම් බෙදා දීම සම්බන්ධයෙන් මෙම ආණ්ඩුවට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්නට අප අදහස් කරනවා. එත කොට මෙම ඉඩම් බෙදා දුන් ආකාරය ගැන විස්තර කරන්නට පුළුවනි. විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් මා කියන්නට කැමතියි, මේ ආණ්ඩුවට විරුඩව අපි විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්නට කල්පනා කරන බව.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

එම යෝජනාව ගෙනෙන තුරු ඒ ගැන කතා කරන්නට බැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

වගා කිරීම සඳහා පොහොර යෙදීමේ ඇති අවශ්‍යතාව කුමක්ද යන්න බද්දේගම රු මන්ත්‍රීතුමා (නීල් ද අල්විස් මයා.) විසින් විස්තර කර දෙන්නට යෙදුණා. ඕනෑම වගාවක් දියුණු කරන්නට අවශ්‍ය මූලික දේ තමයි, පොහොර හා ජලය. ජලය අපට ලැබී තිබෙන ස්වාභාවික වස්තුවක්. මේ රට මැදින් පටන් ගෙන මුළු රට වටේම ගමන් කරන ගංගා අපට තිබෙනවා. පොහොර ලබා දෙනවා වාගේම එම ජලයත් නිසියාකාර ලබා දෙන්නට කටයුතු කිරීම මේ ආණ්ඩුවේ යුතුකමයි. ගංගා සංවර්ධනය නොකර කෙසේද, ගොවිතැන් දියුණු කරන්නේ ?

මා ඊයේ ඉදිරිපත් කරන ලද පෙත්සමක් ගැන මෙම අවස්ථාවේදී මට කල්පනා වෙනවා. පොල්අතුගඟ ප්‍රදේශයේ ගොවීන්ට ඇති අමාරුකම් ගැනයි, එම පෙත්සමෙහි සඳහන් වන්නේ. පොල්අතු ගඟින් නියම ප්‍රයෝජනය ලබා ගන්නට බැරිකම නිසා අක්කර දහස් ගණනක් පාලු වී යනවා. එක කන්නයයි, වගා කරන්නට පුළුවන්කම ලැබී තිබෙන්නේ. ඒ කන්නය වගා කරන්නෙත් අහස් දියෙන්. පොල් අතු ගඟ හරහා අවශ්‍ය අමුණු බැඳල, වේලි බැඳල කටයුතු කරනව නම් ඒ ප්‍රදේශයේ වී ගොවිතැන දියුණු කර ගන්නට පුළුවන්. ගරු කථානායකතුමනි, මා පෙන්වා දෙන්නෙ පෝර වගේම ගොවිතැනට ජලයත් අවශ්‍ය බවයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

මේ යෝජනාව ජලය ගැන නොවෙයි, තිබෙන්නෙ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු කථානායකතුමනි, නියම අන්දමට පෝර යෙදුවත් ජල ගැලීම් තිබෙනව නම් ඒ පෝර සේදී යනව නේද කියා තමුන්නාන්සේ ටිකක් කල්පනා කරල බලන්න. නිරන්තරයෙන් ජල ගැලීම් ඇති වෙනව නම් කොයිතරම් පෝර කුඹුරුවලට යෙදුවත් කුඹුරුවල අස්වැන්න වැඩිවෙයාවද ? ඒ නිසා මේක එකිනෙකට සම්බන්ධ ප්‍රශ්න දෙකක්. ඒ වුණත් මේ රටේ කුඹුරුවලට දැන් සෑහෙන ප්‍රමාණයක් පෝර යොදාගෙන යන බව මතක් කළයුතුයි.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රසායන පෝර නොමිළයේ බෙදා දීම

[තුඩාවේ මයා.]

දැන් ගොවියා වෙනදාට වඩා කුඹුරුවලට පෝර යෙදීමට කැමැත්තක් දක්වනව. එදා ගොවියාට වඩා අද ගොවියා දියුණුයි. එදා ගොවියා කල්පනා කළේ දෙවියන්ගේ ආශිර්වාදයෙන් අස්වැන්න වැඩි කර ගැනීමටයි. අද ගොවියා තේරුම් ගෙන තිබෙනව පෝර යෙදීමෙන්, හොඳ යන්ත්‍ර සූත්‍ර යොදා ගොවිතැන් කිරීමෙන්, පේළි ක්‍රමයට ගොයම් සිටුවීමෙන් අස්වැන්න වැඩි කර ගන්ට පුළුවන් බව. ඒ වුවමනාව ඉටු කර ගැනීමට ගොවියාට ආණ්ඩුව අත නොදීම තමයි අද තිබෙන බැරෑරුම් ප්‍රශ්නය. නිකම් රේඩියෝවෙන් කෑ ගැසුවට මදි. අද රේඩියෝව මිනිසුන්ගේ කණට යවුලක් වෙලා තිබෙනව. කණේ යවුල් අණිනවා යයි කියමනක් තිබෙනව. දැන් කනේ රේඩියෝ අණිනවා කියා අලුත් කියමනක් තිබෙනව. රේඩියෝ එකෙන් ආහාර වගා කරන්ට බැහැ. රේඩියෝ එකෙන් පෝර දුන්නට මදි. ගොවියා ළඟට ගිහින් ගොවියාට පෝර දෙන්ට ඕනෑ.

පෝර යෙදීමෙදි මේ රටේ තිබෙන ඉතා ලොකු දුර්වලකමක් මම මතක් කරන්ට කැමතියි. එක එක කුඹුරේ පසේ නියම තත්ත්වය ගැන අවබෝධයක් ඇති කර ගෙන ඒ පසේ අඩු පොර ද්‍රව්‍යය මොකක් දැයි තේරුම්ගෙන ඒ අනුව තමයි, විදේශීය රටවල් පෝර යෙදීම කරන්නෙ. එහෙත් අපේ රටේ තොග වශයෙන් පෝර යෙදීම කරනව. සමහරවිට පළාත් වශයෙන් පෝර යෙදීමේ කටයුතු කර ගෙන යනව. එකම පෝර වර්ගය කිසිම ඉවක් බවක් නැතිව දමාගෙන යනව. එක එක කුඹුරේ ඇති පෝර ගතිය ගැන කිසිම පර්යේෂණයක් නොකර පෝර යෙදීම කරගෙන යාමෙන් අපරාදෙ පෝර නාස්ති වන බව මා තමුන්නාන්සේට මතක් කරන්ට කැමතියි. පෝරවල අඩංගු එක්තරා ද්‍රව්‍යයක් පමණක් යෙදීමෙන් සෑහෙන අස්වැන්නක් ලබා ගන්ට පුළුවන් ඇතැම් කුඹුරු තිබෙනව. ඒ කුඹුරුවලට හැම ද්‍රව්‍යයක්ම මිශ්‍ර කර තිබෙන පෝර යෙදීම පෝර නාස්ති කිරීමක්. ඒ නිසා අපේ රටේ පෝර යෙදීමේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් ඉටු කළයුතු වැදගත් යුතුකමක් තමයි, සෑම දිස්ත්‍රික්කයකම කුඹුරුවල පස ගැන පරීක්ෂණයක් පැවැත්වීම. පස ගැන පර්යේෂණ පවත්වා පස්වල පවතින අඩුපාඩුකම් ගැන සොයා බලා ඒ අඩුපාඩුකම් සම්පූර්ණ කිරීමේ බලාපොරොත්තුවෙන් පොර යෙදීම සිදු කරනව නම් මීට වඩා අස්වැන්නක් ලබා ගන්ට පුළුවන් යයි මා කල්පනා කරනව. ඒ නිසා අපේ රටේ පස් පර්යේෂණ අංශය දියුණු කරන්ට ඕනෑ. සෑම දිස්ත්‍රික්කයකටම පස් පර්යේෂණ අංශයේ නිලධාරීන් යවා ඒ කුඹුරුවල පස පරීක්ෂා කරන්ට වහාම වැඩ පිළිවෙලක් යොදන්ට ඕනෑ. එහෙම කළොත් පෝර යෙදීමේ පවතින ආකුල ව්‍යාකුල තත්ත්වය මඟ හරවා පෝර ආරක්ෂා කරගෙන අවශ්‍ය ප්‍රමාණයට පෝර යෙදීමට කටයුතු සංවිධානය කරන්ට පුළුවන් බවයි මගේ විශ්වාසය. ඒ නිසා සෑම ගොවියෙකුටම නොමිළයේ පෝර ලබා දීම, මිනි මෝක් රථ ලබා දෙනවාට වඩා, ජීප් රථ ලබා දෙනවාට වඩා වැදගත්. මිනි මෝක් රථවලින් නිෂ්පාදනය වැඩි කරන්ට බැහැ. ජීප් රථවලින් නිෂ්පාදනය වැඩි කරන්ට බැහැ. පෝරවලින් තමයි, නිෂ්පාදනය වැඩි කර ගන්ට පුළුවන් වෙන්නෙ. ඒ නිසා මේ යෝජනාව ඉතා වැදගත් එකක්.

මේ යෝජනාවෙ දෙවෙනි අංශය තමයි තේ, රබර් හා පොල් වතු සම්බන්ධයෙනුත් ඒ හා සමාන වැඩ පිළිවෙලක් ඇති කරන්ට කියන එක. තේ රබර් පොල්වල තමයි අපේ රටේ ජාතික ආර්ථිකය රැඳී තිබෙන්නෙ. ඒ නිසා මේ වැවිලි ද්‍රව්‍ය තුන වැඩි වැඩියෙන් දියුණු කිරීමට කටයුතු කළ යුතුයි. විශේෂයෙන්ම රබර් පොල් වැවිලිවලට පෝර යෙදීමේ විශාල ව්‍යාපාරයක් අද ආරම්භ කිරීම අවශ්‍ය වෙලා තිබෙනව.

බොහෝ ප්‍රදේශවල අපේ විශාල පොල් වතු අයිතිකාරයන්ට නොවෙයි, සුළු පොල් වතු අයිතිකාරයින්ට පෝර දීමේ ක්‍රමයක් තිබෙනවා නම් ඇත්ත වශයෙන්ම ඔවුන් ඒ පෝර වතුවලට යොදනවාට කිසිම සැකයක් නැහැ. ඒ පෝර කාට හෝ විකුණනවා නම් ඒ පෝර ගන්න තැනැත්තන් කරන්නේ මේ වගේ යම්කිසි වැවිල්ලකට ඒ පෝර යොදා ගැනීමයි. ඒ නිසා පෝර හැකි තරම් බෙදා දීම මේ රටේ අස්වැන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැඩි කිරීම සඳහා කරන්නාවූ විශාල පරිත්‍යාගයක් බව සඳහන් කරන්නට කැමතියි. ආණ්ඩුවේ ගුවන් විදුලියෙන් සහ පත්‍රවලින් කරන මේ මුලා කිරීමේ වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම නවත්වා ගොවි ජනතාව ඉදිරියට ගොස් ගොවි ජනතාව සමග සාකච්ඡා කර ඔවුන්ට නොමිලයේ පොර දී ඔවුන්ට ආධාර මුදල් දී මේ රට ස්වයම්පෝෂිත කිරීමට කටයුතු කරන්නට ඕනෑ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

හාන්නට ට්‍රැක්ටරුත් නිකම් දෙන්නට ඕනෑ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඒකත් හොඳයි. තමුන්නාන්සේ වැඩ හුරුවටය කියා පැලැටි නෙළන්නට සැලැස්සුවාට කිසිම වැඩක් වෙන්නෙ නැහැ. වල් පැලැටි ටික නෙළුවොත් සේරම හරිය කියා තමුන්නාන්සේ කල්පනා කරනවා. බද්දේගම ගරු මන්ත්‍රීතුමා (නීල් ද අල්විස් මයා.) මේ කාරණය ගැන විශාල විස්තරයක් කළා. එතුමා ට්‍රැක්ටර් ගැනත් කිව්වා. එහෙත් ඒවා නොමිලයේ දෙන්නටය කියා එතුමා කිව්වෙ නැහැ. ප්‍රශ්නය මේකයි. තමුන්නාන්සේලා, තමුන්නාන්සේලාගේ හිතවතුන්ට ට්‍රැක්ටර් ගෙන්වන්නට ඉඩ දී තිබෙනවා. ට්‍රැක්ටර් ගෙන්වා වැඩි මිළට විකුණා ගොවින් සූරා කෑමට එන්. එම්. අප්පුහාමි මහත්මයාට ඉඩ දී තිබෙනවා. ට්‍රැක්ටර් රථයක් රුපියල් 8,000 කට වඩා වැඩි වන්නේ නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ට්‍රැක්ටර් ගැන කීම නවත්වා යෝජනාව යටතේ කථා කරන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

අධ්‍යාපන ඇමතිතුමාට මා මේ පිළිතුරක් දෙන්නෙ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

පිළිතුරු දෙන්නට වුවමනා නැහැ. පස්සෙ ගිහින් පිළිතුරු දෙන්න. මේ යෝජනාව ගැන පමණයි, දැන් කථා කරන්නට පුළුවන්.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු කථානායකතුමනි, ආහාර වගා කිරීමට ට්‍රැක්ටර් ඉතාම අවශ්‍යයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ඒ සම්බන්ධව යෝජනාවක් තිබෙනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

තමුන්නාන්සේ කියනවා නම් මා ඒ ගැන කථා කරන්නෙ නැහැ. දෙවනුව ඒ ගැන කථා කරන්නට තමුන්නාන්සේ මට ඉඩ දේය කියා මා බලාපොරොත්තු වෙනවා. [බාධා කිරීමක්] මේවා ගැන කථා කරන විට ආණ්ඩු පක්ෂයේ සමහර උදවියට උහුලාගෙන ඉන්නට අමාරුයි. කොල්ල කෑම් ගැන කථා කරන විට, දුප්පත් ගොවීන් සූරා කෑම ගැන කථා කරන විට, ජාවාරම්කාරයින් කරන මංකොල්ල ගැන කථා කරන විට ආණ්ඩු පක්ෂයට උහුලන්නට බොහොම අමාරුයි. මංකොල්ල කාරයන් ආරක්ෂා කරන, කොම්පැනිකාරයන් ආරක්ෂා කරන, ජාවාරම් කාරයන් ආරක්ෂා කරන ආණ්ඩුවක්, මේ හත් හවුල් ආණ්ඩුව. ඒ නිසා තමයි, මේ තරම් රිදෙන්නේ. ගොවීන් ආරක්ෂා කරන ආණ්ඩුවක් නම් ගොවීන්ට ආධාර කරන්නට ඕනෑ. [බාධා කිරීමක්] ඒ කව්ද කියා මා දන්නෙ නැහැ.

ගරු කථානායකතුමනි, බද්දේගම ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ඉතාමත්ම කාලෝචිත, ආණ්ඩුවේ විශේෂ සැලකිල්ල යොමු විය යුතු යෝජනාවක් බව ප්‍රකාශ කරමින් මගේ වචන සවල්පය අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රසායන පෝර නොමිලයේ බෙදා දීම

අ. භා. 3.36

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

ගරු කථානායකතුමනි, ආහාර නිෂ්පාදන යට ආධාර කිරීමක් වශයෙන් සලකා බද්දේගම ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කළා. එතුමාගේ කථාව මා හොඳින් අසාගෙන සිටියා. නාත්තන්ඩියේ අතුරු මැතිවරණ රැස්වීමක දී කළ කථාවක ඉතුරු කොටසක්වත් -පිළුණු වුණු අදහසක්වත්-මේ ගරු සභාවේදී එතුමා ඉදිරිපත් කරනවාද කියා මට එක් අවස්ථාවක කල්පනා වුණා. නාත්තන්ඩියේ මන්ත්‍රීතුමා ඒ ඒ කාලවලදී ප්‍රකාශ කළ අදහස් බද්දේගම ගරු මන්ත්‍රීතුමා විසින් මේ විවාදය යටතේ ප්‍රකාශ කරන්නට යෙදුණා. පෝර සම්බන්ධයෙන් ඉදිරිපත් කළ යෝජනාව යටතේ ඊට අදාළ දේවල් ගැනත් අදාළ නොවන දේවල් රාශියක් ගැනත් කථා කළා. යෝජනාව ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමාට වුවමනා වී තිබුණේ ඇත්ත වශයෙන්ම තමන්ගේ යෝජනාවට මේ ගරු සභාවෙහි අනුමතිය ලබා ගැනීමටද, එසේ නැත්නම් අනම් මනම් ප්‍රකාශ කරමින්, නොයෙක් විධියේ මතභේදවලට තුඩු දෙන දේවල් ඉදිරිපත් කරමින්, ඒ යෝජනාවට අදාළ වන දේත්, අදාළ නොවන දේත් කියමින් මේ ගරු සභාව සාමාන්‍යයෙන් ප්‍රචාරක කථාවක් කරන්නට තැනක් කර ගැනීමටදැයි එක්තරා විධියක සැකයක් මා තුළ ඇති වුණා.

විරුද්ධ පාර්ශ්වයේ මෙන්ම ආණ්ඩු පක්ෂයේත් සිටින ගරු මන්ත්‍රීතුමන්ලා හැම දෙනාම මේ රට ආහාර අතින් ස්වයම්පෝෂිත වනු දකින්නට කැමැතියි. ඊට විරුද්ධ වන කිසිවෙක් මෙහි ඇතැයි කාටවත් කියන්නට පුළුවන්කමක් නැහැ. අපත් එය පිළිගන්නවා. එහෙත් මෙම යෝජනාව ඉදිරිපත් කරමින්, නොමිලයේ පෝර දෙන්නැයි කියමින්, අපේ ගොවි ජනතාව කරගෙන යන ආහාර නිෂ්පාදන ව්‍යාපාරයට ආධාරයක් කරන්නට බලාපොරොත්තු වෙනවාද, එහෙම නැතිව දැනටමත් මේ රටේ එක්තරා ප්‍රමාණයකට හෝ කෙරීගෙන යන ආහාර නිෂ්පාදන ව්‍යාපාරයට ගොවීන් කෙරෙහි පවතින ධෛර්යය අඩු කරන්නට, ඒ උදවිය අධෛර්යමත් කරන්නට බලාපොරොත්තු වෙනවාදැයි සැකයක් මා තුළ ඇති වෙනවා. ඒ විධියේ සැකයක් මට ඇති වුණා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

නැහැ, පවිත්‍ර අදහසිනුයි එය ඉදිරිපත් කෙළේ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

ඒ කීම පිළිගත යුතුව තිබෙනවා. එහෙත් අදහස් කොයි තරම් පවිත්‍රදැයි කිය තොත්, යෝජනාව ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමාත් ඒ ගැන යම් යම් අදහස් ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීවරුනුත් නොමිලයේ පෝර දෙන්නැයි යෝජනා කළාම, ආහාර නිෂ්පාදනය කර මේ රට ස්වයංපෝෂිත කරන්නට මුළු රජයමත් උත්සාහ දරනවාය, ගොවීන්ට ආධාර අනුබල දෙනවාය, ගොවීන්ගේ විශ්වාසය දිනාගෙන වඩ වඩා ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කරන්නට වැඩ කටයුතු කරගෙන යනවාය කියන එකට යටින් මේ අදහසත් ඉදිරිපත් කළාම—ඒ අදහස ඉදිරිපත් නොකරනැයි කියන්නට පුළුවන්කමක් නැහැ—නොමිලයේ පෝර බෙදා දෙන්නැයි ඉදිරිපත් කළ යෝජනාවට ආණ්ඩුව ඉඩ දෙන්නේ නැතැයි රටට කිව්වොත් ජනතාව දැනට කරගෙන යන වැඩ ටික පවා කරගෙන යාමට අධෛර්යමත් වනු ඇද්දැයි යම් සැකයක් මා තුළ ඇති වෙනවා. එහෙම බලාපොරොත්තුවකින් වත්ද?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

නැහැ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

මගේ කල්පනාව වැරදි වෙන්නට පුළුවනි. "දී කිරට බළල් ලුත් සාක්කි" කියන කතාවක් තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
(திரு. துடாவ)
(Mr. Tudawe)
මොකක්ද ?

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டி. பண்டா)
(The Hon. M. D. Banda)
කීවට තේරෙන්නේ නැහැ. ගුවන් විදුලියෙන් කෙරෙන ප්‍රචාර ගැනත් මතක් කළා. ගොවිතැන් දියුණු කිරීමට වැඩි වශයෙන් උනන්දු කරවීම සඳහා ගුවන් විදුලියෙන් කරගෙන යන ප්‍රචාරයන් ගැන විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලා දන්නවා. ආහාර නිෂ්පාදනය ගැන කර ගෙන යන ප්‍රචාරයන් මහජනයාට—ගොවිජනයාට මෙන්ම සාමාන්‍ය ජනතාවට—එපා වෙලා තිබෙනවාදැයි එතුමන්ලා දන්නවා. ඕනෑවට වඩා ඒ ගැන ප්‍රචාරයක් කරන බවයි විරුද්ධ පාර්ශ්වය කියන්නේ. එය විහිලුවක් වෙලාලු. "වගාව සම්බන්ධයෙන් කෙරෙන ගුවන් විදුලි ප්‍රචාරය දැන් කොයි තරම් විහිළුවත් වෙලාද; එය කවුරුවත් විශ්වාස කරන්නේ නැහැ ; ආණ්ඩුව කරන්නේ මහා මෝඩ වැඩක්" ආදී වශයෙන් කියමින් තමුන්නාන්සේලා අප ගැන බොහෝම කණගාටු වෙනවා.

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)**
(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும், தகவல், ஒலிபரப்பு அமைச்சரும்)
(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)
ඒ අපට ආදරේට.

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டி. பண்டா)
(The Hon. M. D. Banda)
ඔව්, ගුවන් විදුලියෙන් කරන්නේ කිසිම ප්‍රයෝජනයක් නැති මෝඩ වැඩක් බව පෙන්වන්නට හදනවා. තමුන්නාන්සේලා අප කෙරෙහි දක්වන මේ ආදරය ගැන අප ටිකක් සැක සහිත වුණත් තමුන්නාන්සේලාට අප ස්තුතිවන්ත විය යුතුයි. මේ යෝජනාවෙන් ඉදිරිපත් කර තිබෙන අදහස් ඇත්ත වශයෙන් ම ගොවීන්ට ආධාර කිරීමේ පරමාර්ථයෙන් ම ගෙනා ඒවාද යන්න ගැන මා තුළ සැකයක් ඇති වී තිබෙනවා.

රජයේ ආහාර වගා කිරීමේ ව්‍යාපාරය හරි නොයන බවත්, සෑම තැනම කුඹුරු ගොවිතැන අඩපණ වී තිබෙන බවත්, ගුවන් විදුලියෙන් බොරු ප්‍රචාරයක් ගෙන යන බවත් විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් දැන් රට හැම තැනම කියාගෙන යනවා. මෙහි සත්‍යතාව දන්නේ එක් ජන කොටසක් පමණයි. එනම්, ඒ ඒ ප්‍රදේශවල ගොවිතැනෙහි යෙදී සිටින උදවියයි. මොන දිස්ත්‍රික්කයේ, මොන ප්‍රදේශයේ කුඹුරු ගොවිතැන කොයි විධියට කෙරෙනවාද, රතුළූණු, මිරිස්, අල, බතල ආදී දේ කොයිතරම් දුරට වගා කෙරෙනවා ද යන වග අපට වඩා හොඳින් දන්නේ ඒ ඒ ප්‍රදේශවල ඒ කටයුතුවල නියුක්තව සිටින ගොවියායි. නිතරම වාගේ පිටරටවලින් ගෙන්වා ගනිමින් තිබුණු සමහර ආහාර වර්ගත් දැන් මේ රටේ වගා කෙරෙන බව වෙළෙඳපොළ දිහා බලන විට තමුන්නාන්සේලාට පෙනෙනවා ඇතැයි මා විශ්වාස කරනවා. කුඹුරු ගොවිතැනේ හෝ වේවා, අනෙක් ගොඩ ගොවිතැනක හෝ වේවා අස්වැන්න වැඩි වී එයින් යම් ලාභයක් වාසියක් උපදිනවා නම් ඒවා යන්නේ ගොවියා අතටයි. ගොවියාගේ මහන්සියට අනුව යම් මිළ මුදලක් ඔවුන්ට ලැබෙනවා නම් කවුරු මොනවා කීවත් ඒක නැති කරන්නට බැහැ. ගොවීන්ට කිසිම ලාභයක් ලැබෙන්නේ නැතැයි තමුන්නාන්සේලා කිව්වත්, දැන් තිබෙන ප්‍රමාණයටත් වඩා විශාල මුදලක් ඔවුන්ට ලැබෙනවායයි අප කිව්වත්, කවුරුන් මොනවා කිව්වත්, තමන්ට ලැබෙන මිළ මුදලේ ප්‍රමාණය දන්නේ ගොවියායි. අද ආහාර නිෂ්පාදන ව්‍යාපාරය පවතින්නේ ගුවන් විදුලියෙන් එහාට මෙහාට පෙරළන්නට පුළුවන් තත්ත්වයක නො වෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රසායන පෝර නොමිළයේ බෙදා දීම

[ගරු එම්. ඩී. බණ්ඩා]

මේ යෝජනාවෙන් දක්වා තිබෙන අදහසේ හැටියට, කුඹුරු ගොවිතැනට හෝ වේවා, තේ, රබර්, පොල් ආදී වෙනත් වගා වලට හෝ වේවා පෝර යෙදීමේ අවශ්‍යතාව ගැන කිසිම තර්කයක් නැහැ. වගාවලට පෝර යෙදිය යුතු බව මේ රටේ පමණක් නොව ලෝකයේ ඕනෑම රටක කවුරුනුත් පිළිගනන්වා. එක් එක් වගාවලට පෝර යොදන ප්‍රමාණයේ හැටියට අස්වැන්න වැඩි වන බවත් අප කවුරුනුත් පිළිගන්නවා. ඉස්සර වාගේ නොව දැන් කුඹුරු ගොවියා පෙළට පැළ සිටුවීම ආදී ක්‍රම අනුගමනය කරන බවත් පස සකස් කිරීම ආදී කටයුතු කරන බවත් මාතර ගරු මන්ත්‍රීතුමාගේ (තුඩාවේ මයා.) කථාවෙන් කියැවුණා. ඉස්සරට වඩා දැන් ගොවීන්ට ඔවුන්ගේ කටයුතු ගැන අවබෝධයක් තිබෙන බවත් එතුමා කිව්වා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මා කිව්වේ, මේ ආණ්ඩුව පත් වුණාට පසුව පමණක් නොව ඊට බොහෝම පෙර සිටමත් ගොයම් පැළ සිටුවීම ආදී ක්‍රම තිබුණු බවයි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

ඔව්. ඒවා බොහෝම කල් සිටම තිබෙනවා. අවුරුදු 50 ක 60 ක පමණ කාලයක් තිස්සේ ඒවා කෙරෙනවා. සිංහළ රජ කාලයේත් සමහර තැන්වල ඒවා තිබුණු බව දැනගන්නට තිබෙනවා. මේක පටන් ගත්තෙ ඊයෙ-පෙරේදාය නැත්නම් අදය කියා මම කියන්නෙ නැහැ. ප්‍රශ්නය ඒක නොවෙයි. රක්ෂාව මොකක්දැයි ඇසුවාම "ගොවිතැන" යයි කීම සාමාන්‍ය ජනතාව හැමදාම කිව්ව දෙයක්. නොයෙක් නොයෙක් ප්‍රදේශවල ගොවීන් ඕනෑවට එපාවට පාරම්පරික පුරුද්දට අනුව කරගෙන ගිය, සමහරවිට පියා ගොවිතැන් කළ නිසා අපිත් ගොවිතැන් කළයුතු යයි ආඩම්බරයෙන් කරගෙන ගිය ගොවිතැන් දැන් ක්‍රමයෙන් ටිකක් අයින් වෙලා ක්‍රමානුකූලව පෝර ආදිය යොදමින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකිවන විධියේ ගොවිතැනක අද ගොවීන් යෙදී සිටින බවයි තමුන්නාන්සේ කිව්වෙ. ඒක හරි. ගරු මන්ත්‍රීතුමා විශේෂයෙන්ම මතක් කළේ මාතර ගැන වෙන්ට ඕනෑ. උතුරුමැද පළාත, වයඹ පළාත, ඌව පළාත, මහ නුවර දිස්ත්‍රික්කය, කෑගලු දිස්ත්‍රික්කය ආදී ප්‍රදේශවලත් ගිහින් බැලුවාම තත්ත්වය ඕකයි. දැන් හත්-අට අවුරුද්දකට නැත්නම් දහ-දොළොස් අවුරුද්දකට පෙර ඔය අන්දමට ඕනෑකමින් යම් තරමක් ගොවිතැන් කළාද, අද ඒ වගේ සිය ගුණයකින් ඒ ප්‍රමාණය වැඩි වෙලා තිබෙනව. අද අනුරාධපුර පළාතට ගියාම පෙනී යනව, පේළියට පැළ ඉන්දීම, රසායනික පෝර යෙදීම ආදිය බහුල වශයෙන් කෙරීගෙන යන බව. ඉස්සර ඔය මොකවත් නැහැ, එහෙන් මෙහෙන් හාල බටදල්ලවත් උදුරා දමන්නෙ නැතුව උඩින් නිකම් වී ටික ගහල දමනව. ඒ කාලයේ ජනගහනයත් අඩුයි. වැඩි ඕනෑකමක් කළේත් නැහැ. කුඹුරු හොඳට හාල හරිහැටි ඒ සීසෑම කළේ නැහැ. නිකම් එහෙන් මෙහෙන් වී ටිකක් ගහල පස්සෙ කපා ගත්ත. එහෙම කාලයක් තිබුණා. දැන් ලොකු වෙනසක් ඇති වී තිබෙන බව පෙනෙනව. දැන් ගොවීන් අතර ලොකු උනන්දුවක් පවතින බව රටේ කොයි පැත්තට ගියත් පෙනී යනව.

ශාස්ත්‍රානුකූලව ගොවිතැන් කිරීම ව්‍යාප්ත වීම මේ දියුණුවට ඒක හේතුවක් වශයෙන් අපට පිළිගන්ට පුළුවනි. අනික් අතින් ගොවියාට එයින් ලොකු ආදායමක් ලැබෙනව. මහන්සියෙන් කුඹුරු ගොවිතැන් කර හොඳ අස්වැන්නක් ලබා ගන්ට පුළුවන් වුණොත් පෙරට වඩා ලොකු ආදායමක් අද ගොවියාට ලැබෙනව. ඒ නිසා ඕනෑකමින් උත්සාහයෙන් සොයා බලමින් දැන් ගොවිතැන් කටයුතු කරගෙන යනව.

තමුන්නාන්සේලා හැම තැනම කියන දෙයක් තමයි, හාල් සේරු දෙකේ කථාව. ඉස්සර හාල් සේරු දෙක ලැබෙන කාලයේදී සමහර ගොවීන් තමන්ගේ කුඹුරුවල වුණත් ඕනෑකමින් වැඩ කළේ නැහැ. සමහරු ඒ හාල් ලබාගෙන කොටසක් විකුණා වෙනත් පාරිභෝගික ද්‍රව්‍ය ඒ ආදායමින් ලබා ගත්ත. මේ හාල් සේරු දෙකෙන් එකක් කැපීමෙන් එකක් සිද්ධ වුණා. සමහරවිට තමුන්නාන්සේලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල්පනා නොකළ දෙයක් සිද්ධ වුණා. මොකක්ද? කුඹුරු ගොවිතැන් කරන ගොවියාට එයින් විශාල ආදායමක් ලබා ගන්ට මාර්ගය පෑදීම එයින් ඇති වුණු ප්‍රතිඵලයක් හැටියට අපට කල්පනා කරන්ට පුළුවන්. ඒ සම්බන්ධයෙන් මාතර ගරු මන්ත්‍රීතුමා මොනවා කියයිද මම දන්නෙ නැහැ. සමහර උදවිය කියනව, මේ හාල් කැපීම නිසා තමයි, අද ඒ ගම්බද ප්‍රදේශවල ගොවීන් කුඹුරුවලට බැහැල විශාල ආදායමක් ලබා ගන්නෙ කියා. මේ රටේ නිෂ්පාදනය වැඩි වේගන යනවා නම් ඒකට එක හේතුවක් තමයි, තමන් නිෂ්පාදනය කරන වීවලට හොඳ මිලක් ලැබීම. රජයේ සහතික මිළ වී බුසලකට රුපියල් දොළහක්වයි පසුගිය කාලයේ තිබුණේ. හොඳවම අස්වැන්න තිබුන අවුරුද්දෙ සහතික මිළට වී අරගෙන ඒවා කොටා ලබා ගත්තෙ හාල් ටොන් ලක්ෂ 4 1/2 යි. ඒ වැඩියෙන්ම අස්වැන්න ලැබුණු අවුරුද්දෙයි. එහෙත් පසුගිය අවුරුද්දේ නිෂ්පාදනය පෙරට වඩා වැඩි වුණත් ආණ්ඩුවේ ගබඩාවට ආව වී ප්‍රමාණය ඊට වඩා අඩුයි. මක් නිසාද? තමන් විසින් නිෂ්පාදනය කරන ලද වී සහතික මිළට නොව ඊට වැඩි මිළකට පිටට විකුණා ගන්නට ගොවීනට පුළුවන් වූ නිසයි. ඒ ආදායම ලැබුණේ ගොවීන්ටයි. ගොවීන්ට රජයෙන් දෙන්නට පුළුවන් ආධාර දීගෙන යනවා. රුපියල් 12 ට තිබුණු සහතික මිළ අප රුපියල් 2 කින් වැඩි කළා. එතකොට බුසලකට ගෙවන සහතික මිළ රුපියල් 14 යි. වියදම ටිකක් වැඩි වෙන්නට පුළුවනි. නමුත් ආදායම ඊට වැඩි වෙනවා.

ගොවියා නිෂ්පාදනය කරන වීවලට, අල බතලවලට, මංඤොක්කාවලට සහ වෙනත් ධාන්‍ය වර්ග වලටත් ලූනු, මිරිස්වලටත් අද කෙදිනකවත් නොලැබුණු මිළක් ලැබෙනවා. ඒ අනුව අද ලංකාවේ සෑම ප්‍රදේශයකම ගොවීන් ඉතා උනන්දුවෙන් ඉදිරියට එන බව අපට පෙනෙනවා. ගොවියාට ලැබිය යුතු ආධාර ලැබෙන නිසාත් ඔහුගේ නිෂ්පාදනවලට සෑහෙන මිළක් ලැබෙන නිසාත් තමයි ගොවියාගේ ඒ උනන්දුව ඇතිවී තිබෙන්නෙ. නමුත් අපේ රටේ බොහෝ දෙනා එකම විධියේ අදහස් ප්‍රකාශ කරනවා. මන්ත්‍රීවරුන් සහ වෙනත් උදවිය රටේ නොයෙක් ස්ථානවලට ගිහින් වේදිකාවලට නැගී ගොවියාගේ දුක කියන්නට පටන් ගන්නවා. අපෝයි, මහන්සි වන තරමට ගොවියාට ආදායමක් නැහැ නේද, ගොවියා සෑමදාම සිටි තැනමයි, ගොවියාගේ ආදායම් තත්ත්වය පහළ බැස තිබෙනවා නේද, ගොවියාට කවදාවත් උසස් තත්ත්වයකට එන්නට විධියක් නැහැ නේද, ගොවියාගේ නිෂ්පාදනවලට නියම මිළක් ලැබෙන්නේ නැහැ නේද කියා ගොවියාගේ දුක කියන්නට පටන් ගන්නවා. ගොවි ජනතාවට ඔවුන් නිෂ්පාදනය කරන ද්‍රව්‍ය සෑහෙන මිළකට විකුණා ගන්නට පුළුවන් තත්ත්වයක් එන විට තමුන්නාන්සේලා අනිත් පැත්තෙන් පාරිභෝගිකයා ගැන කෑගසනවා. එතකොට පාරිභෝගිකයාගෙ පැත්තෙ. පාරිභෝගිකයා කොහොමද මේ තරම් මිළක් ගෙවන්නෙ? අරව නැහැ, මේව නැහැ, එළවලු මිළ ඉහළ නැගල ඔය ආදී වශයෙන් අනික් පැත්තෙන් පාරිභෝගිකයා ගැන කෑගසනවා.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)
දෙපැත්තෙන්ම වාසිය ගන්නවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ගොවියාට කියනවා ඔවුන්ට ලැබෙන ආදායම අඩුය කියා. ඊළඟට පාරිභෝගිකයා පැත්තට ගිහින් අසනවා අපොයි, මේ තරම් මිළක් පාරිභෝගිකයාට ගෙවන්නට පුළුවන්ද කියා. තේ, රබර්, පොල් පිටරට පටවා අප ආදායමක්, විදේශ විනිමයක් උපයා ගන්නවා. නමුත් ආහාර නිෂ්පාදනය කරන්නේ ඒ විධියට පිටරට පටවා විදේශීය විනිමය ආදායමක් උපයා ගන්නට නොවෙයි. තවම එවැනි තත්ත්වයක් නැහැ. එවැනි දෙයක් කවදා කරන්නට පුළුවන් වේවිද කියා මා දන්නේ නැහැ. නමුත් අපේ පරමාර්ථය පළමුවෙන් මේ රට ආහාරයෙන් ස්වයංපෝෂිත කිරීමයි. කෙදිනක හෝ ඒ පරමාර්ථය ඉෂ්ට කර ගන්නට පුළුවන් වේවිය කියා අප කල්පනා කරනවා. ගොවියාට ආධාර දී, ගොවියා කෙරෙහි විශ්වාසය තබා මේ රටේ වගා කළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]

හැකි ආහාර ද්‍රව්‍ය මේ රටේම වගා කරවීමයි අපේ පරමාර්ථය. මේ රටේ අප වී නිෂ්පාදනය කරන්නේ, ලූනු, මිරිස් නිෂ්පාදනය කරන්නේ ඒවා පිටරට යවා මුදලක් උපයා ගැනීමට නොවෙයි. එම නිසා ගොවියාගේ නිෂ්පාදනවලට නියම මිළක් ලැබෙන විට පාරිභෝගිකයා වශයෙන් සිටින අපම අනෙක් පැත්තෙන් ඇඟිල්ල දික් කර මිළ වැඩිය කියා කෑ ගැසීම යුතු නැහැ. කවුරුන් හෝ ඒ මුදල ගෙවිය යුතුයි. මේවා රජය මගින් මිළදී ගෙන පාඩුවට පාරිභෝගිකයාට දෙන්නය කියා තමුන්නාන්සේලා කියනවාද ? එවැනි දෙයක් කරන්නට අමාරුයි. මේ කටයුතු කරගෙන යන්නට අප ගොවියාට ආධාර කළා. ණය ක්‍රම ඇති කළා. ණය මුදල් දී ගෙන ආවා.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல். டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

සියයට 6 සියයට 12 කළා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

සියයට 12 නොවෙයි. ණය මුදල කලට වේලාවට, කාලසීමාව ඇතුළත නොගෙව්වොත් සියයට 12 යි. කාලසීමාව ඇතුළත ගෙව්වොත් සියයට 9 යි.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல். டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

සියයට 6 සියයට 9 කර තිබෙනවා නොවැ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

සියයට 6 සියයට 9 කරන්නට සිද්ධ වුණා. මට මතක හැටියට කෝටි හයක හතක මුදලක් ණය වශයෙන් කපා දැම්මා. අතීතයේදී ලබා ගන්නා ලද විශාල ණය ප්‍රමාණයක් ආපසු ලබා ගන්නට බැරි තත්වයක් ඇති වූ හෙයින් ඒවා කපා හරින්නට සිදු වුණා. නොයෙකුත් පටලැවිලි නිසා මෙසේ කරන්නට සිදු වුණා. ඉතින් එයින් ගොවියන්ට විශාල සහනයක් සැලසුණා. ලෝකයේ ණය දෙන කොයි රටකවත් ඔය තරම් අඩු පොළියට ණය දෙන්නේ නැහැ. රජය ගන්නා ණය මුදල්වල පොළිය සියයට හතර හමාරක් පමණ වෙනවා. ඒ ගන්නා ණය සමුපකාර සමිති මාර්ගයෙන් නැවත ගොවියන්ට ණයට දෙනවා. සියයට හතර හමාරේ පොළියට ගත් ණය මුදල් සියයට නවයේ පොළියට ගොවියන්ට දෙනවා. ණයතුරුස් ආදිය ගැන කල්පනා කර බලන විට මේ පොළිය සුළු දෙයක්.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல். டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

එක් වරක් කුඹුරු පාළු වුණාම පොළිය සියයට විසිහතරක් වෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

තමන් ගත් ණය නියමිත කාල සීමාවේදී ගෙවනවා නම් ඒ සඳහා ගෙවිය යුතු වන්නේ සියයට නවයක පොළියකුයි. නියමිත කාල සීමාවේදී නොගෙවනවා නම් සියයට දොළහක පොළියක් ගෙවන්නට සිදු වෙනවා. සියයට විසිහතරක පොළියක් අය කරනවා යයි කීමේ කිසිම තේරුමක් නැහැ. ගොවිතැන් කර ගන්නට ණය මුදල් ලැබෙන අතර සියලු දෙනාටම හාල් සේරුව බැගින් නොමිළයේ ලැබෙනවා. අස්වැන්න ලැබුණායින් පසුව ලබා ගන්නා ලද ණය මුදල් ආපසු ගෙවිය යුතුයි. එසේ නොගෙවතොත් මේ වැඩ කරගෙන යන්නේ කොහොමද ? ලබා ගත් ණය ආපසු නොගෙවතොත් නැවතත් පහසු ක්‍රමයට ගොවියන්ට ණය දෙන්නට බැරි වෙනවා. එවිට පාඩුව සිදු වන්නේ ඒ අයටමයි. දියුණුව බිඳ වැටෙන්නේ ඒ අයගේමයි. ලබා ගත් ණය ගෙවන්නට පුළුවන් තත්ත්වයක් පවතින විට ඒ ණය ආපසු ගෙවීය යුතුයි. පෝර ලබා ගැනීමට සී සෑමට පෙර දී දුන් ණය ප්‍රමාණයට වැඩි මුදලක් දැන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රසායන පෝර නොමිළයේ බෙදා දීම

ගොවියන්ට දෙනවා. අක්කරයක් සඳහා මේ තරම් ණය මුදලක් දෙනවා යයි අප නියම කර තිබෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The Sitting is suspended for half an hour. On resumption, the Hon. Deputy Speaker will take the Chair.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 4.30 ට නියෝජ්‍ය කථානායකතුමාගේ [ශ්‍රීමත් රසීක් ෆරීඩ්, ඕ.බී.ඊ.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

இதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. உப சபாநாயகர் [ஸ்ரீமான் ரஸீக் பரீத், ஓ.பி.ஈ.] தலைமை தாங்கினார்.

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed, MR. DEPUTY SPEAKER [SIR RAZIK FAREED, O.B.E.] in the Chair.*

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

නියෝජ්‍ය කථානායකතුමනි, තේ විවේකයට කලින් මා කථා කරමින් සිටියේ—ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද අදහස්වලට පිළිතුරු වශයෙන්—ණය පහසුකම් සම්බන්ධයෙනුයි. පොහොර, ණය පහසුකම් ආදී වශයෙන් ගොවීන්ට දෙන්නට පුළුවන් හැම සහනාධාරයක්ම පසුගිය අවුරුදු දෙක තුළ ලබා දීමට රජය විධිවිධාන සලසා තිබුණා. ඒ විතරක් නොවෙයි. අවුරුද්දෙන් අවුරුද්ද, කන්නයෙන් කන්නය තුළ කෙරෙන ගොවීන්ගේ නිෂ්පාදන සැලැස්මවලට සමුපකාර සමිති සහ ගොවි කාරක සභා සම්බන්ධ කරගෙන තිබෙනවා. පසුගිය අවුරුද්දේ සිට කෙරෙන්නේ රජය ඒ ඒ සැලැස්මවල් නිර්ණය කර ඒ අනුව කටයුතු කිරීමට ඒ ඒ ප්‍රදේශවලට භාර කිරීම නොවෙයි. ග්‍රාමීය මට්ටමේ සිට ගොවීන්, ගොවි කාරක සභා නියෝජිතයන්, විවිධ සේවා සමුපකාර සමිතිවල නිලධාරීන් හා සාමාජිකයන් සම්බන්ධ කරගෙන, කුඹුරු ගොවිතැන් කිරීම පිළිබඳ ඉලක්කයන් නිර්ණය කිරීමෙන් පසුව ඒ සැලැස්මවල් දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවලට ඒකාබද්ධ කර ඒ අනුව අවුරුදුපතා බලාපොරොත්තු වන සංවර්ධන ඉලක්කයන් අනුව ඒ ඒ දිස්ත්‍රික්කයන් සංසන්දනය කරමින් සාකච්ඡා ඇති කොට ඒ සැලැස්මවල් තමයි ක්‍රියාවේ යොදවන්නේ.

ඒ කාලවලදී රජයේ ප්‍රතිපත්ති හා නිලධාරීන් සහ ගොවීන් අතර පරතරයක් තිබුණා නම් ඒ පරතරය නැති කිරීම සඳහා දැන් කටයුතු කර ඇති බවයි, මා පෙන්වා දෙන්නට උත්සාහ කරන්නේ. ඒ පරතරය නැති කර, ඒ ඒ දිස්ත්‍රික්කවලට නැත්නම් ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශවලට අයත් ගම්වල ඉන්නා ගොවීන්ට නියම හැඟීමක් ඇති කරවීම උඩයි, මේ කටයුතු බොහෝ දුරට ගෙන යන්නේ. එම නිසා වීවලට නැත්නම් මිරිස්, ලූනු හෝ වෙනත් නිෂ්පාදන ද්‍රව්‍යවලට පෙරට වඩා සතුටුදායක මිලක් දැන් ගොවිජනතාවට ලැබෙනවා. ගොවීන් විසින් දැනගත යුතු නවීන උපදෙස් ඔවුන්ට ලබා දීමටත්, ඔවුන්ට හොඳ පුහුණුවක් ලබා දීමටත් දැන් හැම දිස්ත්‍රික්කවලම පුහුණු වීමේ පන්තිවලට ගොවිජනතාව සම්බන්ධ කරගෙන, සාකච්ඡා මඟින් ඔවුන්ගේ ප්‍රශ්න විසඳමින් අදහස් උදහස් හුවමාරු කර ගැනීමට බොහෝ දුරට කටයුතු සලස්වා තිබෙනවා. හැම ගමකම හා හැම දිස්ත්‍රික්කයකම සිටින හැම කෙනකුටම ඒ අන්දමේ උපදෙස් ලබා ගැනීමට අවස්ථාව නොලැබෙන්නටත් පුළුවන්. එහෙත් හැම ගමකම වාගේ නියෝජිතයින් වශයෙන් සිටින පිරිසටවත් ඒ අන්දමේ මූලික සාකච්ඡාවලට සහභාගි වී ගොවිතැන පිළිබඳව වත්පිළිවෙත් ගැන මනා අවබෝධයක් ඇති කර ගැනීමට දැන් අවස්ථාව යෙදී තිබෙනවා. ඒ අතරම හැම දිස්ත්‍රික්කයකම පාහේ අක්කර දෙතුන් සියයක් හෝ ඊට වැඩි කුඹුරු යායවල් විශේෂ කෘෂිකාර්මික කටයුතු සඳහා තෝරා ගත් ප්‍රදේශ හැටියට නියම කර ඒවා ඒකාබද්ධ කර ගොවි කර්මාන්තයට වුවමනා අන්දමින් අංග සම්පූර්ණ සේවාවක් ලබා දීමට අපි දැන් උත්සාහ දරනවා. අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමා (කේ. බී. රත්නායක මයා.) මේ අවස්ථාවේ මෙහි



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]
සිටියත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ එවැනි ව්‍යාපාර පවත්වාගෙන යන බවට එතුමා සාක්ෂි දරනවා ඇති. එමෙන්ම වෙනත් දිස්ත්‍රික්කවල ගරු මන්ත්‍රීවරු නුත් හුඟ දෙනෙක් මේ ගරු සභාවේ සිටිනවා. ඒ විධියේ ව්‍යාපාර කුරුණෑගල හා මාතර දිස්ත්‍රික්කවලත් තිබෙනවා. ඒ හේතුව නිසා දැන් ගොවීන් උනන්දුවක් දක්වනවාය කියන්නට තමුන්නාන්සේලාට පුළුවන් වී තිබෙනවා. ඒ උනන්දුව ඇති වන්නට හේතුවයි මා කීවේ.

**තුඩාවේ මයා.**
(திரு. துடாவ)
(Mr. Tudawe)
ගොවියා රටට ඇති ආදරය නිසා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
බොහෝම ලක්ෂණ උත්තරය. එය පිළිගන්නවා. එහෙත් මෙපමණ කලක් එවැනි ආදරයක් තිබුණේ නැද්ද කියා මා අහනවා. ගොවියා හැමදාමත් රටට ආදරෙයි. එමෙන්ම මෑත කාලයේදී ගොවියා නිපදවන දේවලට සෑහෙන මිලකුත් වෙන වෙන පහසුකමුත් ලැබෙන්නට පටන් ගත්තා. විශේෂයෙන්ම මෑතක සිට සෑහෙන මිලක් ලැබෙන බව මා කියන්නට ඕනෑ.

**නීල් ද අල්විස් මයා.**
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)
මිරිස් වවන්නන්ට රුපියල් 5 ගණනේ ගෙවන්නට පුළුවන්.

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
ඔව්. බද්දේගම මන්ත්‍රීතුමා මිරිස් වැවීම ගැන සඳහන් කළා. සලාක ක්‍රමයේ හැටිය ට එක පොතකට අවුන්ස 3 බැගින් පාරිභෝගිකයින්ට දෙනවා. තමන්ට ලැබෙන ප්‍රමාණය පිරිමහගෙන පාවිච්චි කළොත් ලැබෙන මිරිස් ටිකෙන් පිරිමහගන්නට පුළුවන්.

**නීල් ද අල්විස් මයා.**
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)
ඒකත් ක්‍රම ක්‍රමයෙන් අඩු කරන්නට යනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
එය අඩු කරන්නේ නැහැ. බය වෙන්න එපා. මිරිස් වුවමනා කරන ප්‍රමාණය නිපදවන්නට වූවාට පසුව වෙනත් ක්‍රමයක් යොදන්නට වේවි. එහෙත් සලාක ක්‍රමය අනුව රාත්තලක් රුපියල් 1.60 බැගින් මාස්පතා අවුන්ස 3 ක් පොතකට ලැබෙනනවා.

**නීල් ද අල්විස් මයා.**
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)
එයත් ක්‍රම ක්‍රමයෙන් නැති කරන්නට අදහසක් ආණ්ඩුවේ නැද්ද?

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
ආණ්ඩුවේ අදහස තමුන්නාන්සේ දන්නේ කොහොමද?

**නීල් ද අල්විස් මයා.**
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)
හොඳයි, නැද්ද කියන්න.

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
තමුන්නාන්සේට වුවමනා කරන්නේ එක්කෝ මා ලවා "එහෙම තමයි" කියවා ගන්නටයි. නැතිනම් "එහෙම නැහැ" කියවා ගන්නටයි. මා කීවේ අපේ මිරිස් පිළිබඳ තත්ත්වයයි. මීට අවුරුදු දෙකකට ඉහත අපි පිටරටින් මෙරටට මිරිස් ගෙන් වීම සඳහා කෝටි හතර හමාරක් වැය කළා, අවුරුද්දකට. ඒ කාලයේ මෙතරම් මිරිස් නිෂ්පාදනයක් තිබුණේ නැහැ. දැන් ක්‍රම ක්‍රමයෙන් මේ රටේ මිරිස් වගාව දියුණු වේගෙන එනවා. දැන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අක්කර විසි තිස් දහසක පමණ මිරිස් වැවී තිබෙනවා. [බාධා කිරීමක්] මිරිස් කෑමත් අඩු වන්නට පුළුවනි.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන (කර්මාන්ත හා ධීවර ඇමති)**

*(கௌரவ டீ. பி. ஆர். குணவர்தன—கைத்தொழில், கடற்றொழில் அமைச்சர்)*

(The Hon. D. P. R. Gunawardena—Minister of Industries and Fisheries)

ඒක හොඳයි.

**ගරු එම්. ඩී. බණ්ඩා**

*(கௌரவ எம். டீ. பண்டா)*

(The Hon. M. D. Banda)

පාරිභෝගිකයාට වුවමනා කරන සාමාන්‍ය මිරිස් කොටස රාත්තල රුපියල් 1.60 ගණනට ලැබෙනවා. ඒක නැතෙයි කියන්නට බැහැ. පාරිභෝගිකයන්ට එක පැත්තකින් එම සහනය සලසනවා. ඊට පිටස්තරවත් මිරිස් වුවමනා කරන උදවිය ගොවියාට මිලක් දීලා ඒ මිරිස් ප්‍රමාණය ලබා ගන්නට ඕනෑ. සමහරවිට ඒ මිරිස් රාත්තල රුපියල් 2.50, 3.00, 3.50, 4.00 යනාදී වශයෙන් මිල වන්නට පුළුවනි. තමුන්නාන්සේලා එක පැත්තකින් කිය නවා, සුළි සුළං තිබුණාය, ගංවතුර තිබු ණාය යනාදී වශයෙන්. ඒ තත්ත්වය උඩ පාලු වුණු සමහර ගොවිතැන් තිබෙන බව අප දන්නවා. එවැනි ඇතැම් ගොවිතැන් නැවතත් වගාකොට තිබෙන්නට පුළුවනි. එසේ නොවුණු සමහර ගොවිතැන්වලින් දැනටත් අස්වැන්න ලබා ගන්නට පුළු වන්කම තිබෙනවා. එවැනි තත්ත්වයක් පවතින අතරම පාරිභෝගිකයාට මා කී අන්දමේ පහසුකම් සැලසෙන බව මතක් කළ යුතුව තිබෙනවා. ඊට පිටස්තරව වුව මනා නම් ගොවීන් විසින් නිෂ්පාදනය කරන මිරිස් වැඩි මිලට ලබා ගන්නට සිදු වෙනවා. ඉන් පලක් ලැබෙනවා නම් ලැබෙන්නේ ගොවි ජනතාවටයි. ඒ මැද සිටින වෙළෙන්දන්ද සමහරවිට මෙයින් ප්‍රයෝජන ලබා ගන්නවා ඇති. එහෙත් ඉස්සර වාගේ පහසු මිලට වෙළෙන්දන්ට වුවත් දැන් මිරිස් ලබා ගැනීම අමාරුයි. ඊට හේතුව මිල ඕනෑතරම් ඉහල ගොස් තිබෙන නිසයි. හම්බන්තොට, අනුරාධ පුරය, කුරුණෑගල වැනි පලාත්වල පිහිටි නොයෙකුත් අන්දමේ වගාවන් අතර මිරිස් ලූණු යනාදිය වවා තිබෙනවා. ගිය වසරට වඩා මේ වසර තුල මිරිස් සහ ලූණු වගාව වැඩි වී තිබෙන බව කියන්නට පුළු වනි.

**නීල් ද අල්විස් මයා.**

*(திரு. நீல் டி அல்விஸ்)*

(Mr. Neal de Alwis)

එහෙත් කන්න ඇත්තේ නැහැ.

**ගරු එම්. ඩී. බණ්ඩා**

*(கௌரவ எம். டீ. பண்டா)*

(The Hon. M. D. Banda)

තමුන්නාන්සේලා මිරිස් නොකා සිටිනවායැයි මා සිතන්නේ නැහැ. තමුන් නාන්සේ මිරිස් සලාකයවත් හරියාකාර පාවිච්චි කරනවාද කියන්න මා දන්නේ නැහැ. සමහරවිට තමුන්නාන්සේට අවුන්ස 3 වුවත් වැඩි වන්නට පුළුවනි. මිරිස් පිළිබඳ තත්ත්වය ඒකයි.

ලූණු මිල පිළිබඳ තත්ත්වය හොඳයි. යාපනය වැනි ප්‍රදේශවලින් ලැබෙන්ට තිබුණු ලූණු කුනු වී යාම නිසා කරදර විඳින්නට සිදු වී තිබෙනවා. [බාධා කිරීම්] ඒක ගුවන් විදුලියෙන් අහන්න. ඒක මා කී දෙයක්ද? නැහැ. එහෙම ආවා නම් බොහොම හොඳයි.

**නීල් ද අල්විස් මයා.**

*(திரு. நீல் டி அல்விஸ்)*

(Mr. Neal de Alwis)

පව්ට පල් බොරු.

**ගරු එම්. ඩී. බණ්ඩා**

*(கௌரவ எம். டீ. பண்டா)*

(The Hon. M. D. Banda)

අස්වැන්න වැඩි වේගෙන එන විට බොහොම අමාරුයි.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

Shall we leave the question of chillies alone and get on to the question of fertilizer ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

I am referring to the question of chillies because the Debate ranged all over.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

This is a hot question. Let us discuss it.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

I shall get on to some other subject from this hot question.

අපේ ගරු මන්ත්‍රීතුමන්ලා පුද්ගලික අංශයට ඉඩම් දීමේ ප්‍රශ්නය ගැන නොයෙකුත් මත ප්‍රකාශ කළා. මේ පිළිබඳ රජය අගනුමනය කරන ප්‍රතිපත්තිය නොයෙකුත් අවස්ථාවලදී මෙම සභාව ඉදිරියෙහි ගෙනහැර පා තිබෙනවාය කියා මා සිතනවා. මේ රට ඇතුළතම වවා දියුණු කරන්නට පුළුවන් ආහාර වගී අප විසින්ම වවා දියුණු කර මේ රට ස්වයංපෝෂිත කළ යුතුය යන ප්‍රතිපත්තිය, මා හිතන පිළිවෙළට කව්රුත් අවිවාදයෙන් පිළිගන්නවා. ඒ සම්බන්ධයෙන් රජයත්, විරුද්ධ පාර්ශවයත්, මහජනයාත් අතර මත භේදයක් නැත කියා මා කල්පනා කරනවා. මේ රටේ දේශගුණය ගැන, පොළොව ගැන වතුර ප්‍රශ්නය ගැන සලකා මේ රටේ වගා කළ හැකි, මේ රටේ පාරිභෝගය සඳහා ගන්නට පුළුවන් ද්‍රව්‍ය මේ රටේම වවා දියුණු කිරීම ගැන අප කව්රුත් එකගයි. අපට ආහාර වුවමනා කරන්නේ අපේ රටේ ජනතාවගේ ප්‍රයෝජනයටයි. පිටරටින් ගෙන්වන ආහාර ප්‍රමාණයත්, මේ රටේ නිෂ්පාදනය කරන ආහාර ප්‍රමාණයත් ගණන් බලා අපට වුවමනා සම්පූර්ණ ආහාර ප්‍රමාණය කොපමණද කියා ගණන් බැලුවම අපට පෙනෙනවා, පිටරටින් ගෙන්විය යුතු ආහාර ප්‍රමාණය අවුරුදුපතා වැඩි වේගන එන බව.

මෙරට නිෂ්පාදනය පසුගිය අවුරුදු කීපය තුළ වැඩි වුන බව ඇත්තයි. එහෙත් වැඩි වන ජනගහනයත් සමග වැඩි වන පරතරය මැකෙන තරමට නිෂ්පාදනයක් නොවෙයි, ඇති වුණේ. අපේ රටේ නිෂ්පාදනය වන හාල්, මිරිස්, ලූනු කිරි ආහාර වගී ආදි වශයෙන් ඇති ද්‍රව්‍ය ගැන සලකන විට ඒ ද්‍රව්‍ය මේ රටේ නිෂ්පාදනය වන ප්‍රමාණයත්, ජනතාවට අවශ්‍ය ප්‍රමාණයත් අතර විශාල පරතරයක් තිබෙන බව පෙනෙනවා. ඒ පරතරය පිරිමසන්නේ පිටරටින් හාල්, මිරිස්, ලූනු, කිරි ආහාර වගී ආදිය ගෙන්වීමෙනුයි. මේ ගැන පරිස්සමින් බලන විට පෙනෙනවා, සිදු වන්නේ පිටරටින් ගෙන්වන බඩු ප්‍රමාණය අඩු වීම නොවන බව. එසේ අඩු වන්නට නම් අපේ රටේ නිෂ්පාදනය ඉක්මනින්ම වැඩි වන්නට ඕනෑ. එසේ නැත්නම් දැනට තිබෙන ජීවන තත්ත්වය ආරක්ෂා කර ගැනීමට පිටරටින් බඩු ගෙන්වීමට සිදු වෙනවා. ඒ ගැන හොඳින් පරීක්ෂා කර බැලූ විට පෙනෙනවා, අවුරුදු කීපයක් තුළ වී නිෂ්පාදනය තරමක් දුරට වැඩි වුණත් ඒ නිෂ්පාදන ප්‍රමාණය සෑහෙන්නෙ නැති බව. අනික් ද්‍රව්‍ය සම්බන්ධයෙන් බැලූවාම වැඩි නිෂ්පාදනයක් අපේ රටේ ඇති වී නැති බව පෙනෙනවා. ඒ ද්‍රව්‍ය පිළිබඳ පරතරය එන්ට එන්ටම පළල් වන බවක් මිස ක්‍රමයෙන් ගෙවී යන තත්ත්වයක් පෙනෙන්නට නැහැ. ඒ නිසා ආණ්ඩුව ආහාර වගාව පිළිබඳව විශේෂ උනන්දුවක් දක්වා, ගොවි ජනතාවට දෙන්නට පුළුවන් සෑම ආධාරයක්ම දී, සෑම උපදේශයක්ම දී, සම්බන්ධ කර ගන්නට පුළුවන් සෑම දේකටම ඔවුන් සම්බන්ධ කරගෙන කටයුතු කරගෙන යනවා. මෙසේ වැඩ කර ගෙන යන අතර, ගොවි ජනතාව අතින්ම මේ කටයුත්ත සම්පූර්ණ කර ගන්නට අපට පුළුවන් වෙයිද කියා අප කල්පනා කළා. එසේ නැත්නම් මේ ආහාර ප්‍රශ්නය විසඳීමට වත්කම් තිබෙන, මිළ මුදල් තිබෙන, දැනීම තිබෙන සමාජයේ වෙනත් කොටසුත් උපයෝගී කර ගත යුතුද යන ප්‍රශ්නය පැනනැංගා. අපට වුවමනා කරන්නේ රටේ ගොවි ජනතාව කෙරෙහි විශ්වාසය තබා ඒ අයට ආධාර දී වැඩි වැඩියෙන් ආහාර ද්‍රව්‍යයන් නිෂ්පාදනය කර දැනට පවතින පරතරය—ආහාර ද්‍රව්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සම්බන්ධයෙන් තිබෙන විශාල පරතරය—හැකි තාක් ඉක්මනින් අඩු කර පිටරට වලින් ගෙන්වනු ලබන ප්‍රමාණය අඩු කරන්නටයි. එය සාර්ථක කර ගන්නට නම් වෙනත් වගාවනුත් සම්බන්ධ කර ගන්නට ඕනෑ. ඒ වාගේම මිල මුදල් අතිනුත්, ඇනුම අතිනුත්, උනන්දුව අතිනුත් වැදගත් තැනක් ඇති උදව්යට ඒ සම්බන්ධයෙන් වගකීමක් දිය යුතු නොවේද යන්නයි ප්‍රශ්නය. ප්‍රශ්නය කොයි තරම් උග්‍රදැයි කිවොත් ආණ්ඩුව ඒ ගැන ඉක්මනින් සොයා බලා පැහැදිලි තීරණයක් ගත්තා. ඒ අයටත් අවස්ථාවක් දිය යුතුය යනුවෙන් ආණ්ඩුව කල්පනා කළා. එසේ කල්පනා කළ ආණ්ඩුව ඒ ඒ දිස්ත්‍රික්ක වලින් ඒ ගැන විපරම් කර බැලුවා. රටේ විශේෂ බදු ක්‍රම පිළිබඳ ආයතනය—ස්පෙෂල් ලීසස් බෝඩ්—තිබෙන්නේ ගරු මුදල් ඇමතිතුමා යටතේ නිසා ඒ කාරණයට ගරු මුදල් ඇමතිතුමාත් සම්බන්ධයි. මුදල් අමාත්‍යංශයත් ඊට සම්බන්ධයි. ඒ මගින් හැම දිස්ත්‍රික්කයෙන්ම විමසා බැලුවා. බද්දේගම ගරු මන්ත්‍රීතුමා (නීල් ද අල්විස් මයා.) "ඔබ්සර්වර්" පත්‍රයෙන් කරුණු උපුටා කියෙව්වා. එතුමා අපට මේ ගරු සභාවේදී යම් යම් කරුණු පෙන්නුම් කර දුන්නා. ගොවි ජනතාවගේ යහපත පිණිස ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව, වාරි මාර්ග දෙපාර්තමේන්තුව ඉඩම් කොමසාරිස්තුමාගේ දෙපාර්තමේන්තුව, දිසාපතිවරුන් ආදීන් සම්බන්ධ කරගෙන හැම දිස්ත්‍රික්කයක් තුළම වැඩ කටයුතු කරගෙන යනවා. ගොවි ජනතාවට පදිංචි වීමට තැන් සලසා දීමටත්, ගොවිතැන් වැඩ කටයුතු වඩා හොඳින් කරගෙන යෑමටත් උනන්දුවෙන් ක්‍රියා කරගෙන යනවා. ජනතාවට ආධාර කිරීමට කළ හැකි හැම දෙයක්ම කරගෙන යනවා. ඒ ඒ ප්‍රදේශවලට මායිම්වෙලා තිබුණු ඉඩම් සම්පූර්ණයෙන්ම ගොවීන්ගේ පදිංචිය සඳහා අයින් කළා. ඒ වැඩවලටමයි දැන් ඒ ඉඩම් වෙන්වෙලා තිබෙන්නේ. එතකොට ඉදිරියට අවුරුදු පහළොවක් විස්සක් යනතුරු අත දිග හැර වැඩ කරන්නට පුළුවනි. වඩ වඩාත් ආහාර නිෂ්පාදනය කරන්නට පුළුවන් වෙනවා. නිකම්ම කැලෑවක් නැත්නම් හිස් බිම් වශයෙන් තිබුණු ප්‍රදේශ බොහොමයක් පෞද්ගලික අංශයටත් දී තිබෙනවා. ඒ විධියෙන් ඉඩම් දුන්නේ පරීක්ෂණ කර අවසානයේදීයි. බදු ක්‍රමයේ හැටියට අවුරුදු 25කට බද්දට දී තිබෙනවා. ඒ කාලය තුළ ඒ ගත් ඉඩම් ප්‍රමාණය වගා කරන්නට ඕනෑ. ඒවායේ වගාවන් දියුණු කරන්නට ඕනෑ. රජයේ ආධාරයක් හැටියට ඒ ඉඩම් වගාවට මුදලින් යමක් දෙන්නේ නැහැ. හැබැයි, හරියාකාර කරුණු ඔප්පු කළාම එක්තරා ප්‍රමාණයක බදු සහනයක් ලැබෙනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

බද්දට ඉඩම් දෙන්නට පුළුවනි. ඒවායේ දැව ?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

වටිනා දැව අස් කර ගන්නවා. එය කැලෑ දෙපාර්තමේන්තුවට අයිති වැඩක්. බදු දෙන ඉඩම්වල වටිනා දැව අස් කර ගැනීම සම්පූර්ණයෙන් කැලෑ දෙපාර්තමේන්තුවේ සිරිතක්.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

දැනටමත් දැව ටික අරන් ඉවරයි, බදුකාරයෝ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

එහෙමනම් මුදලක් අය කර ගන්නට ඕනෑ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

අය කරගෙන නැහැ.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ** (අකුරැස්ස)
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ—அக்குரஸ்ஸ)*
(Dr. S. A. Wickremasinghe—Akuressa)

ගස් නැහැ. අරන් හිහිල්ලා ඉවරයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

ගොවියාට දිය හැකි හැම ආධාරයක්ම ලැබෙනවා. දැන් සමහර අය අප බලාපොරොත්තු වන හැටියට වගා දියුණු කරනවා. සමහර උදවිය තමුන්නාන්සේලා කියන හැටියට එසේ කරන්නේ නැහැ. එහෙ මෙහෙ පනිමින් නොයෙක් සටකපට කම් කරනවා.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

වැඩි කොටසක්.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

වැඩි කොටසක්ද මා දන්නේ නැහැ. වගා නොකරන පිරිස ගැන දැන් අප පරීක්ෂණ පවත්වාගෙන යනවා. වගා කිරීමට ඒ අයට එක්තරා කාල සීමාවක් දුන්නා. ඒත් වගා කර නැත්නම් ඔවුන්ට දුන් ඉඩම් ආපසු පවරා ගන්නට ඕනෑ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඒ අයට දුන් ජීප් රථත් ආපසු ගන්නට ඕනෑ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

තමුන්නාන්සේ ඒ කථාව මේ අවස්ථාවේදී කීම බොහොම හොඳයි. මුල්කිරිගල ගරු මන්ත්‍රීතුමාත් (ජෝර්ජ් රාජපක්ෂ මයා.) ජීප් රථයක් ලබා ගත්තා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඒවා අප දන්නේ නැහැ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

තමුන්නාන්සේ දන්නේ නැතිවාට මා දන්නවා. තමුන්නාන්සේ දැන ගත්තත් කියන්නේ නෑ. මේ ප්‍රශ්නය මතු කළ නිසයි මා මේ ගැන කථා කරන්නේ. ආහාර නිෂ්පාදන කටයුතු කරන්නට බලාපොරොත්තු වන බව කියා නොයෙක් කරුණු ඉදිරිපත් කොට මුල්කිරිගල ගරු මන්ත්‍රීතුමා මුල් කාලයේදීම ජීප් රථයක් ඉල්ලුවා. ආණ්ඩු පක්ෂයේ හෝ වේවා, විරුද්ධ පක්ෂයේ හෝ වේවා, මේ ගරු සභාවේ මන්ත්‍රීවරයකු ආහාර වගාව සම්බන්ධයෙන් තම අභිමතාර්ථය ප්‍රකාශ කළ විට අපගේ ප්‍රතිපත්ති අනුව එය අපේ සැලකිල්ලට භාජන වෙනවා. එවැනි කෙනකු අප වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ විට, වගා කිරීමට ඔහුට ඉඩම් තිබෙනවාද, වැඩ කිරීමේ පහසුකම් ආදිය තිබෙනවාද යනාදී කරුණු සොයා බැලීම සඳහා මෙම ඉල්ලුම්පත් දිසාපතිවරුන්ටත් වෙනත් අවශ්‍ය නිලධාරීන්ටත් යැවීමයි අපේ ප්‍රතිපත්තිය. ඒ ඉල්ලුම්කරුවාට ඒ ව්‍යාපාරය කරන්නට පුළුවන් බව දිසාපතිවරුන් විසින් රෙකමදාරු කළොත් පමණයි අපෙන් ඒ ඉල්ලුම් කරුවන්ට බලපත්‍රයක් ලැබෙන්නේ ආහාර වගාව සඳහා.

**එච්. එම්. නවරත්න මයා.** (මිනිපෙ)
*(திரு. எச். எம். நவரத்ன—மினிப்பே)*
(Mr. H. M. Navaratna—Minipe)

මිනිපේ වැනි ප්‍රදේශවල පාරවල් හොඳ නැහැ. එහෙත් ඒ ප්‍රදේශවල අයටත් ජීප් රථ දී තිබෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

ඊට හේතුත් මම කියන්නම්. ඒ ප්‍රදේශවල ආහාර වගාව සඳහා ඉඩම් දුන්නේ අනෙක් ප්‍රදේශවල වාගේ ගම් නියම්ගම් අසල නොවෙයි. ඒ වාගේම, ඒ ඉඩම් දී තිබෙන්නේ වාරිමාර්ග කටයුතු සඳහා ලකුණු කරන ලද ඉඩම් තිබෙන තැන්වල නොව එයින් ඈත ස්ථානවලයි. ඒ ප්‍රදේශවල පාරවල් හොඳ නෑ. යාම් ඊම් කිරීම ඉතාම අපහසුයි. කම්කරුවන් සොයා ගන්නට නෑ. ඒ ප්‍රදේශවල වැඩ කරන්නට පිට ප්‍රදේශවලින් කම්කරුවන් ගෙන යන්නට ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An Hon. Member)

ගම් ඇති කරන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

ගම් ඇති කිරීමේ ව්‍යාපාරයක් අපි කර ගෙන යනවා. දැන් අපි කරගෙන යන්නේ ඉන් පිටස්තර අතිරේක වැඩ කොටසක්. මා සඳහන් කළ මේ ප්‍රදේශවල ගම් නියම් ගම්වලින් ඈත කැලෑවල සමහරවිට හැතැප්ම 20, 25, 30, 40 යන්නට ඒ වැඩ කරන අයට සිදු වෙනවා. එවැනි පළාත්වල ජීප් රථයක් නැතිව යාම් ඊම් කරන්නට බැහැ. ලහි ලහියේ වැඩ කිරීමට බලා පොරොත්තු වන උදවියට සමහර විට ජීප් රථ පමණක් නොව වෙනත් යන්ත්‍රෝපකරණත් වුවමනා වෙනවා, කම්කරුවන් සිය ගණනින් සොයා ගන්නට ඒ ප්‍රදේශවල නැති නිසා. මේ පරමාර්ථ අනුවයි, මේ අදහස් උඩයි, ඒ ප්‍රදේශවලට ජීප් රථ දුන්නේ. සමහර අය ඒවායින් නියම විධියට ප්‍රයෝජන ගෙන තිබෙනවා. ඒ අය යම් කිසි වැඩ කොටසක් කර තිබෙන බව නැතැයි කියන්නට කාටවත් බැහැ. ඒ වාගේම, සමහර අය වැඩ කර නැති බවත් නෑ කියන්නට බැහැ.

මුල්කිරිගල ගරු මන්ත්‍රීතුමාත් ජීප් රථයක් අපෙන් ඉල්ලුවා. ඒක එතුමාට ලැබුණා. පසුව මේ පිළිබඳ ප්‍රශ්නයක් මතු වුණු නිසා මා ඒ ගැන පරීක්ෂා කර බැලුවා. යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වගා කටයුතු කිරීමේ අභිප්‍රාය ප්‍රකාශ කොට ඒ සඳහා ජීප් රථයක් ඉල්ලුවොත් ඒ ඉල්ලීම බාර ගෙන ජීප් රථයක් ලබා ගැනීමට අවසර දීම සාමාන්‍ය ප්‍රතිපත්තිය බවයි ඇමති කාර්යාලයෙන් මට කියා සිටියේ. දැන් ඒකට පිළිතුරක් දිය යුතුව තිබෙන්නෙ එතුමායි. තමන් ලබා ගත් ඒ වාහනය නියම අන්දමින් ගොවිතැන් කටයුතු සඳහා පාවිච්චි කළා ද? කොපමණ දුරට ආහාර වගාව දියුණු කළාද? යන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්ට ඕනෑ එතුමායි. එසේ නැතිව "තමුන්නාන්සේලා ලාමක විධියට මේක කරන්නට ගිය නිසා මම එයින් ප්‍රයෝජන ගත්තා" යයි ගරු මන්ත්‍රීවරයකු වශයෙන් එතුමා කියනව නම්, "තමුන්නාන්සේ මන්ත්‍රීවරයකු වශයෙන් ඒ කාරණා ප්‍රකාශ කළ නිසයි අපි ඒ උගුලේ වැටුණේ" කියා මා උත්තාහේට කිව්වොත් එතුමා මා සමග තරහ වෙන්ට වටින්නෙ නැහැ. වෙන කවුරුවත් එහෙම කිව්වොත් අපට ඒකට පිළිතුරු දෙන්ට පුළුවනි.

මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) කිව්ව කථාවේ සත්‍යයක් තිබෙනව. යම් යම් උදවිය මේ සහනයෙන් අයුතු ප්‍රයෝජන ගන්ට සට කපට වැඩ කළා මිසක් ආහාර නිෂ්පාදනයට තවම බැස්සෙ නැහැ. අපි ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරගෙන යනව. ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා, ආහාර නිෂ්පාදනයට වෑයමක් නොදරන උදවිය ඒ රථවාහන ආදියෙන් වෙන යම් ප්‍රයෝජන ගන්ට උත්සාහ කරන බව පෙනී ගියොත්, ඒකටත් අපි පිළියමක් යොදනව.

**තුඩාවේ මයා.**
(திரு. துடாவ)
(Mr. Tudawe)

වන්දි ගන්ට ඕනෑ. වටිනා ඇව, ජීප් රථ, මිනි මෝක් ගන්නට දඩ ගහන්ට ඕනෑ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

ඔව්, දඩ ගහන්න ඕනෑ. මේ අදහස් පට ලවා ගැනීම වැරදියි. මම මීට ප්‍රථම වාරයකත් මෙන්න මේ අදහස ප්‍රකාශ කළා. රට ස්වයංපෝෂිත කිරීමට ප්‍රධාන වශයෙන්ම සම්බන්ධ කර ගන්ට පුළුවන් ගොවි ජනතාවයි. ඒකෙ ප්‍රශ්නයක් නැහැ. තවත් පුළුවන් නම් ඊට පිටස්තරව මිළ මුදල් අතේ තිබෙන උදවියත් මේ ව්‍යාපාරයේ යොදවල රැකීරක්ෂා ප්‍රශ්නය තරමක් දුරටවත් විසඳමින් ආහාර ප්‍රශ්නයත් සෑහෙන ප්‍රමාණයකින් විසඳා ගන්ට පුළුවන්කමක් තිබෙනව නම් ඒ මාර්ගයෙනුත් මේ අවස්ථාවේදී ප්‍රයෝජන ගත යුතුයි කියන පරමාර්ථය අනුවයි, අපි ඒ පියවර ගත්තෙ. ඒ ව්‍යාපාරයෙන් දැන් යම් ආහාර ප්‍රමාණයක් ලැබෙනව. බලාපොරොත්තු වුණු තරම තවම ලැබුණෙ නැහැ. එහෙත් ගමනාගමන පහසුකම්, කැලෑ එළි කර ගැනීම්, ඇට බැට සොයා ගැනීම්, කම්කරු ජනතාව සොයා ගැනීම, ආදි ගැටලු ප්‍රශ්න නිරාකරණය වේගන යන විට ගොවිතැන සම්බන්ධයෙන් උනන්දුවෙන් කටයුතු කරන පිරි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]
සගෙන් තව අවුරුද්දකින් දෙකකින් යම් කිසි ප්‍රයෝජනවත් නිෂ්පාදන කොටසක් අපට ලැබෙයි කියා කල්පනා කරන්ට පුළුවන්කම තිබෙනව.

මේ රජයේ පමණක් නොව, මීට ප්‍රථම යෙන් පැවති හැම රජයකම වගේ ප්‍රති පත්තියව තිබුණෙ, ඉඩකඩම්වල හෝ වේවා, වෙනත් ව්‍යාපාරවල හෝ වේවා, කර්මාන්තශාලා ආදියේ හෝ වේවා, පෞද් ගලික අංශයේ අයිතිවාසිකම් පිළිගැනීමයි. සෑම රජයක්ම පෞද්ගලික අංශයේ අයිති වාසිකම පිළිගෙන තිබෙනව. අපි එයින් වෙනස් වෙලා නැහැ. මිශ්‍ර ආර්ථික පදනම කියන ප්‍රතිපත්තිය උඩයි, අපි ගමන් කරන්නෙ. සමහරවිට අපේ මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) ඒ ප්‍රතිපත් තියට එකඟ වෙනවදැයි මම දන්නෙ නැහැ. එහෙත් අපේ පානදුරේ මන්ත්‍රී තුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) ඉමි පැත්තේ සිට පසුගිය රජයට ආධාර දෙන කාලයේ පුද්ගලික අයිතිවාසිකම් මත රඳා පවතින ආර්ථික පදනම වෙනස් කරන්ට යෝජනාවක් හෝ අදහසක් ඉදිරිපත් කළාය කියා මම දන්නෙ නැහැ. අපේ බද්දේගම ගරු මන්ත්‍රීතුමාත් (නීල් ද අල්විස් මයා) එහෙමමයි. එතකොට පෞද් ගලික අංශයෙන් ප්‍රයෝජනයක් ගැනීමට අප බලාපොරොත්තු වෙනවා. හරියාකාරව ඒ අය කටයුතු කරන්නේ නැත්නම් අප ඒකට පිළියමක් යොදන්නට ඕනෑ. එය මේ රජයේ හෝ පසුගිය රජයේ හෝ ප්‍රති පත්තියට පටහැණි නොවන බව මා ප්‍රකාශ කරනවා.

ඉඩකඩම් පිළිබඳව හෝ වේවා, වෙන වෙන අයිතිවාසිකම් පිළිබඳව හෝ වේවා, පෞද්ගලික අයිතිවාසිකම් නොපිළිගන්නා සමාජ ධර්මයක් අනුගමනය කරන රුසියාව, චීනය, වැනි රටවල් තිබෙනවා. එවැනි රටවල පවා ඒ ආර්ථික දියුණුව ඇති කරගෙන ගිය කාලවලදී පෞද්ගලික අංශයේ පෞද්ගලික අයිතිවාසිකම් හිමි කරගෙන සිටි පුද්ගලයින්ගෙන් රටේ දියුණුවට වුවමනා කරන වැඩ කරවා ගත්තා.

Remember the New Economic Policy. For instance in countries like Russia and China, their whole political and social philosophy is such as not to encourage but to do away with private property rights. But even countries like those committed to such a philosophy made use of capitalistic organizations that were there for the development of their economy. Both those countries did it.—[*Interruption*]. They have done it.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
තමුන්නාන්සේලාත් රුසියාවේ ක්‍රම යටම කරන්නට යනවාද ?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
මගේ තර්කය මේකයි. මේ රජය මිශ්‍ර ආර්ථික පදනමක් පිළිගන්නවා. දැන් තමුන්නාන්සේලාත් පසුගිය රජයට ආධාර කරද්දී එය පිළිගත්තා. එම නිසා මෙය අමුතු දෙයක් නොවෙයි. පෞද්ගලික අංශයෙන් යම් කටයුත්තක් ඉෂ්ට කරවා ගන්නට පුළුවන්ය කියා බලාපොරොත්තු වක් ඇති කර ගැනීම වරදක් නොවේය කියන එකයි මා කියන්නෙ. යම් යම් උදවිය වැරදි අන්දමට කටයුතු කර තිබෙ නවා. බලාපොරොත්තු නොවූ සට කපට පිරිසක් මේකට රිංගා එහෙම ගැටයක් ගසා තිබෙනවා. අප ඒ ගැටය කපා හරින්නට ඕනෑ. අපේ රටට විදේශීය විනිමය හිඟ නිසාත්, රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමේ මාර්ගයක් වශයෙනුත්, මේ රටට වුවමනා කරන ආහාර ද්‍රව්‍ය මේ රටේම වගා කරන්නට අප කල්පනා කළා. ඒ අනුව මේ රටේ වගා දියුණු කර වහ වහා ලඟි ලඟියේ අපේ රට ආහාරවලින් ස්වයංපෝෂිත කරන්නට නම් ගොවි ජනතාවගෙන් කෙරෙන ඒ උසස්ම ක්‍රියාවට අතිරේක වශයෙන් ධන කොටස් තිබෙන යම් යම් අයගේ ධනය ඒ ඈත ප්‍රදේශවල තිබෙන ඉඩම් ආහාර වගාවට යට කරවීමට යොමු කළහොත් මැනැවැයි අප කල්පනා කළා. ඒ ඉඩම් සංවර්ධනය වන විට පාරවල් වැටෙයි. බොහෝ දෙනෙකුට රැකීරක්ෂා ලැබෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
සූරා කයි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ඒ විශාල ගොවි පොළවල යන්ත්‍රෝප කරණ පාවිච්චි කරමින් ගොවිතැන් කටයුතු කළහොත් ඒ යන්ත්‍රෝපකරණ මෙහෙයවීමට යොමු වන්නේ අන් කිසිවකු නොව මේ රටේ හැදෙන වැඩෙන අපේ තරුණ පරම්පරාවයි. ඒ අනුව ඒ ඉඩම් තිබෙන ප්‍රදේශවල බොහෝ දෙනෙකුට රැකීරක්ෂා ලැබේවියයි අපට කල්පනා කරන්නට පුළුවනි. යම් ගොවිපොළක ජීප් රථයක්, ට්‍රැක්ටර් යන්ත්‍රයක් බුල්ඩෝසර් යන්ත්‍රයක් පාවිච්චි කරනවාය කියමු. ඒවා පැදවීමේ නැත්නම් මෙහෙයවීමේ කාර්යය පැවරෙන්නේ අපේ රටේ තරුණයින්ටයි. ඒ වාගේම නළ මගින් ජලය සැපයීම, ගණන් හිලව් තැබීම, ආදී ඒ සෑම කටයුත්තක්ම පැවරෙන්නේ අපේ රටේ තරුණයන්ටයි. නොයෙක් රටවල කටයුතු කෙරෙන්නේ එහෙමයි. රුසියාවේත් එහෙමයි.

දැන් මේ රසායන පෝර පාවිච්චි කරනවා වාගේම නොයෙක් රටවල් ගොවිතැන් කට යුතු සම්බන්ධව විශාල වශයෙන් යන්ත්‍රෝප කරණ පාවිච්චි කරනවා. ජලය සැපයීමට, පොළව පෙරලීමට, සෑමට, අස්වැන්න නෙළා ගැනීමට, ආදී වශයෙන් නොයෙක් කටයුතුවලට යන්ත්‍රෝපකරණ පාවිච්චි කරනවා. නමුත් ඒ සෑම කාර්යයකටම යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන්නට අපට පුළුවන්කමක් නැහැ. ගොවීන්ගේ පහ සුවට ඔය ට්‍රැක්ටර් යන්ත්‍ර එහෙම වුව මනාය කියා තමුන්නාන්සේලා මේ කථා කරන්නේ යන්ත්‍රෝපකරණ ගැනයි. අප ඇති කළ මේ විශාල ගොවිපොළවල එක් තරා ප්‍රමාණයකට විශාල යන්ත්‍රෝපකරණ පාවිච්චි වෙනවා. ඒවාට වැය වන්නේ රජයේ මුදල් නොවෙයි. පෞද්ගලික මුදල්වලිනුයි ඒ යන්ත්‍රෝපකරණ අර ගෙන තිබෙන්නෙ. ඒ සියලුම යන්ත්‍රෝප කරණ මෙහෙයවීමේ කාර්යයට යොදන්නේ නැත්නම් එවායේ රැකීරක්ෂා වලට යොදන්නේ මේ රටේ සිටින තරුණයනුයි. එයින් පුහුණුවක් ලැබෙනවා. යන්ත්‍රෝප කරණ ක්‍රියා කරවීම හේතුකොටගෙන ගොවිතැන් කටයුතු සම්බන්ධයෙන් පුහුණුවක් ලැබෙන්නේ නැද්ද?

ගොවිතැන් කටයුතු සඳහා මේ ඉඩම් බෙදා දී ඇත්තේ ඉස්සර තේ වතු, රබර් වතු බෙදා දුන් ආකාරයට ස්ථිර අයිතිවාසි කම් පවරා නොවෙයි. අවුරුදු 25 ක කාල සීමාවකට පමණයි ඒවා පවරා තිබෙන්නේ. ඒ කාල සීමාව තුළ සැලකිය යුතු තරමින් ආහාර වගාව සම්බන්ධයෙන් වැඩ කොටසක් කෙරෙනවා. ඒ කාල සීමාව අවසානයේදී රජයට—ඒ කාලයේ තිබෙන කොයි රජයට වුණත්—පුළුවන්කම ලැබෙනවා, ඒ ඉඩම් ආපසු රජයට පවරා ගන්නට. ඒ කාලයේදී එම ඉඩම්වල කට යුතු කරන තරුණයන්ට හෝ වෙනත් අයට නැත්නම් සමූපකාර ක්‍රමයට ඒ ඉඩම් කැබලි බෙදා දෙන්නට, එතෙක් කොම්පැණිවලට තිබුණු අයිතිවාසිකම් වෙනස් කරන්නට රජය බලාපොරොත්තු වෙනවා. එවැනි බලාපොරොත්තු ඇතිවයි, රජයේ ආහාර වගා කිරීමේ ප්‍රතිපත්තිය අනුව පෞද්ගලික අංශයටත් අවස්ථාවක් සලසා දුන්නේ.

මේ යෝජනාවෙන් කියැවෙන්නේ පොහොර නොමිළයේ ලබා දෙන්න කියායි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
පොහොර නොමිළයේ දෙනවාද නැද්ද?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ඒක නොවැ, කියවා ගන්නට ඕනෑ කරන්නේ? මෙහි පසුබිම කල්පනා කරන්නේ නැහැ. අර ටික කියවා ගන්න වයි, ඕනෑ කරන්නේ.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)
කොහෙත්ම මගේ අදහසක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

වර්තමාන කර්මාන්ත ඇමතිතුමා කෘෂිකර්ම ඇමතිතුමා වශයෙන් සිටි කාලයේ හොඳ අදහසක් ඉදිරිපත් කළ බව විරුද්ධ පාර්ශවයේ ගරු මන්ත්‍රීවරුන්ගේ කථාවලින් කියැවුණා. ගොවීන්ට ගෙවන රුපියල් 12 න් රුපියල් 2 ක් තබාගෙන, ඒ මුදලට හරියන්න ගොවි උපකරණ, රසායනික පොහොර යනාදිය දීමයි ඒ යෝජනාවෙන් අදහස් කළේ. ඒ කාලයේදි ඒ යෝජනාවටවත් එකඟ වුණේ නැහැ නොවැ? එතුමාට පොහොර නිකම් දෙන්නට පුළුවන්කම තිබුණා නම් ඒ සඳහා එම දිනවලම එතුමා යෝජනාවක් ගෙනෙන්නට තිබුණා. එහෙත් පොහොර සම්පූර්ණයෙන්ම නොමිළයේ දීම මොන රජයකට වුණත් බොහොම අමාරු වැඩක්.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல். டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

නොමිළයේ දීම අවශ්‍යයි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

එක කාලයකට පමණක් නොමිළයේ පොහොර දුන්නා. ඒ මොකද කීවොත්, ඒ කාලයේ ගොවි ජනතාව රසායනික පොහොර පාවිච්චි කළේ නැහැ. "රසායනික පොහොර දැම්මොත් ඉඩමේ සරුසාරකම එතැනින් ඉවරයි, හැමදාමත් පොහොර දමන්නට වෙයි" යනුවෙන් මේ මෑතක් වන තුරුම ඔවුන් තුළ ලොකු බියක්, දුර්මතයක් තිබුණා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

දැන් ඒ බිය නැහැ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

කොළ පොහොර, ගොම පොහොර එහෙම නම් දමනවා. රසායනික පොහොර, ඇට කුඩු පොහොර—bone-meal—දමන්නේ නැහැ. පුරුදු කරීමක් වශයෙන් රජය ඒ කාලයේදී අවුරුදු දෙකක් තුනක් යන තුරු ගොවියන්ට පෝර නොමිළයේ දුන්නා. වර්තමාන අගමැතිතුමා කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් සිටි කාලයේදීයි, ඒ විධියට පෝර නොමිළයේ දුන්නේ. නොමිළයේ දෙන ලද නිසා සමහරුන් පෝර පාවිච්චි කළා. ඒ අතර තවත් සමහරුන් ඒවා පාවිච්චි නොකර ආපසු එවන්නට පටන් ගත්තා. කොම්පැණියෙන් පෝර යවනවා; නැවත කොම්පැණියටම පෝර ආපසු එනවා. මට කියන්නට වුවමනා මේකයි: පෝර භාවිතයක් නොතිබුණු කාලයේදී එය ගොවි ජනතාවට පුරුදු පුහුණු කිරීම සඳහා සමහර දිස්ත්‍රික්කවලට ඇට පෝර නොමිළයේ දුන්නත්, අද එවැනි තත්ත්වයක් නැහැ. අද හැම දෙනාම පෝර භාවිතයේ වටිනාකම දන්නවා.

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ**
*(டொக்டர் எஸ். ஏ. விக்ரமசிங்ஹ)*
(Dr. S. A. Wickremasinghe)

ගොවියාට සල්ලි නෑ, පෝර ගන්නට.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන**
*(கௌரவ டி. பீ. ஆர். குணவர்தன)*
(The Hon. D. P. R. Gunawardena)

රුපියල් දෙකකින් වී මිළ වැඩි කෙළේ ඒකටයි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

පෝර භාවිතය වැඩි කිරීම සඳහා නොමිළයේ පෝර දීමේ තත්ත්වයක් අද ඇති වන්නේ නැහැ. සමහර ගොවියන් නම් තවමත් පෝර පාවිච්චි නොකරනවා වන්නට පුළුවනි. එහෙත් එන්න එන්නම පෝර පාවිච්චි කිරීම වැඩි වන බව අප දන්නවා. කුඹුරු නෙළන්නට තිබෙන මේ මාස් කන්නයේදී සමහර ප්‍රදේශයන්හි කලින් යෙදූ ප්‍රමාණයට වඩා දෙගුණයක් පෝර යොදා ඇති අතර, තවත් සමහර ප්‍රදේශයන්හි තුන් ගුණයක් පෝර යොදා තිබෙනවා. ඒ අනුව බලන විට, පෝර පාවිච්චි කිරීමෙන් ප්‍රයෝජනයක් සැලසෙන බව අද ගොවි ජනතාව පිළිගෙන තිබෙන බව පෙනී යනවා. එන්න එන්නම පෝර පාවිච්චිය ව්‍යාප්ත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රසායන පෝර නොමිලයේ බෙදා දීම

වීගෙන යනවා. එහෙම නම් දැන් අපට දෙන්නට පුළුවන් සහනය කුමක්ද? පෝර නොමිලයේ දෙන්නට පුළුවන් නම් කුමන රජයක් වුණත් ඒවා නොමිලයේ නොදෙන්නට හේතුවක් නැහැ. නොමිලයේ පෝර දීමේ බර දරන්නට රජයට අමාරුයි. එහෙත් එක්තරා සහනයක් දිය හැකියි. පසුගිය රජයත් ඒ සහනය දුන්නා. මේ රජයත් ඒ සහනය දීගෙන එනවා.

ලංකාව පෝරවලට වුවමනා යම් යම් දේ ගෙන්වන්නේ විදේශවලින් බව තමුන්නාන්සේලා දන්නවා ඇති. තවම මේ රටේ පෝර නිෂ්පාදනය කරන්නේ නැහැ. පෝර කම්හලක් ආරම්භ කර ඇති අතර නව අවුරුදු එකහමාරකින් පමණ එහි වැඩ අවසන් කරන්නට බලාපොරොත්තු වෙනවා. දැන් එහි මූලික කොටස අවසානයි. තවමත් අප පෝරවලට වුවමනා යම් යම් කොටස් ගෙන්වන්නේ පිටරටිනුයි. එහෙම නම් ගොවි ජනතාවට දෙන්නට පුළුවන් සහනය සහ ආධාරය කුමක්ද? අත්පිට මුදල් ගෙවනවා නම් පෝරවල නියමිත මිළෙන් සියයට පණහක් අඩු කර මෙතෙක් කල් ගොවියන්ට පෝර සැපයුවා. ණයට පෝර දුන්නේ වටිනාකමින් තුනෙන් එකකට සරිලන ප්‍රමාණයක සහනයක් දෙමිනුයි. අත්පිට මුදලට නම් මිළෙන් භාගයක සහනයක් දුන්නා. ණයට නම් මිළෙන් තුනෙන් එකක සහනයක් දුන්නා. ඒ කාලයේදී පෝර ගත් අයගෙන් තුනෙන් දෙකක්ම පෝර ලබාගෙන තිබෙන්නේ අත්පිට මුදලටයි. ඊට හේතුව සියයට පණහක වාසියක් ලැබීමයි. තුනෙන් එකක් පමණයි, ණයට පෝර ලබාගෙන තිබෙන්නේ. මේ අතර පසුගිය වර්ෂයේදී ගොවියන්ට ණය පහසුකම් සලසා දෙද්දී ණයට දෙන පෝර සම්බන්ධයෙන්ද වටිනාකමෙන් භාගයක් අය කරන්නට පටන් ගත්තා. මේ අනුව දැන් ණයට ගත්තත්, අත්පිට මුදලට ගත්තත් වටිනාකමින් භාගයක සහනයක් ලැබෙනවා. ගෙවිය යුතු කාල සීමාව තුළ ණය මුදල් ගෙවනවා නම් ඒ සහනය ඒ විධියටම ලැබෙනවා. නියමිත කාල සීමාවට මාස නවයක් තිබෙනවා. ඒ මාස නවය තුළ ණය ගෙවනවා නම් ඊට අය කරන පොලිය සියයට නවයයි. ගොවිතැන් වාරයක් ඉවර වන්නට මාස නවයක් යන්නේ නැහැ. ඇත්තෙන්ම එක් කන්නකට ගත වන්නේ මාස පහමාරක් පමණයි. එහෙම නම් මාස නවයක් තුළදී ලබා ගත් ණය මුදල ගෙවන්නට පුළුවන් විය යුතුයි. ඒ විධියට ණය ගෙවනවා නම් මා මුලින් සඳහන් කළාක් මෙන් සියයට දොළහක පොලියක් ගෙවන්නට වුවමනා වන්නේ නැහැ. ගෙවන්නට සිදු වන්නේ සියයට නවයක පොලියක් පමණයි. පෝර ණයට ගන්න ගොවියන්ටද, අත්පිට මුදලට පෝර ගන්න ගොවියන්ට ලැබෙන සහනයම දීම ලොකු දෙයක් හැටියට සලකන්නට පුළුවනි. කලින් තිබුණාට වඩා දැන් ගොවි ජනතාවට පහසුකම් සලසා දී තිබෙන බව මෙයින්ම පෙනී යනවා ඇති. අනික් අතට 1964 නොවැම්බර් දෙසැම්බර් වන විට පෝර මිල නැංගා. 1964 ඔක්තෝබර්-නොවැම්බර්වල පැවති මිලට වඩා නොවැම්බර්-දෙසැම්බර්වල මිල වැඩි වූ නිසා ගොවීන්ට පෝර සඳහා ගෙවන්නට තිබුණු ගණනත් යම් ප්‍රමාණයකින් වැඩි කළා. ඒ වැඩි කිරීම ගැන මා තර්ක කරන්නේ නැහැ. ලෝක වෙළෙඳපොළේ පෝරවල මිල වැඩි වුවත් පෝර සඳහා ගොවීන්ට දුන් සියයට 50 හේ හා 1/3 කේ සහනය ඒ විධියටම දුන්නා. එහෙත් මිල නැංගා. එයට හේතුව පිටරටවල ඒ ඒ පෝර වර්ගවල මිල වැඩි වීමයි. කුඹුරුවලට යන පෝර එසේ වැඩිවූ මිල උඩම යන්නට ඕනෑය, එහි වෙනසක් කරන්න එපාය කියා ඒ සමගම අපි නියෝගයක් දුන්නා. තවමත් ඒ සහනය ඒ විධියටම ලැබෙනවා.

සමහර අය "පෙලට්" ගුලි පෝර ඉල්ලූ විට ඒවායේ මිල වැඩි වෙනවා. අත්හදාබැලීමක් වශයෙන් දැන් ඒ පෝර යොදාගෙන යනවා. පෝරවල මිළේ නියමය තිබෙන්නේ 1964 තිබුණු මිලමයි. එහෙත් 1964, 1965 සිටම පෝරවල මිල නගිනවා. ඒ ගණනටම දෙනවා නොවෙයි. තවමත් අපි ගොවි ජනතාවට බරක් දමා නැහැ. ඉදිරියටත් ඒ මිලටම දෙන්නට සිදුවේද කියා මා දන්නේ නැහැ. එහෙත් කලින් අත්පිට මුදලට ගන්නා විට දුන්නා වූ සියයට පණහේ සහනය තමයි ණයට පෝර ගත් අයටත් දුන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]

ගොවිණය ගැනත් ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. අඩු පොලියට ණය ලබාගත් බොහොම දෙනෙක් ඒවා පාවිච්චි කළේ කොහොමද? මගේ කථාවේ මුල් හරියේදීම ප්‍රකාශ කළ පරිදි වෙන රටවල් දෙස බලන විට මේ රටේ තිබෙන පොලිය සාධාරණ පොලියක් යයි කියන්නට පුළුවන්. එදා තිබුණු ක්‍රමයට අඩු පොලියට ගන්නා ගොවි ණය බොහොම දෙනෙක් ගොවිතැන සඳහා නොයොදා වෙන වෙන ජාවාරම්වලට යෙදුවා. සමහරෙක් ගම්වලින් නැත්නම් කඩවලින් ණයයට 10 යේ 12 හේ 15 හේ නැත්නම් 18 ටේ පොලියට අරගෙන තිබුණු ණය මේ ණය මුදල අරගෙන බේරුවා. එසේ කළේ මේ ණය මුදලේ පොලිය අඩු නිසයි. එසේ කළ විට ඒ ණය ගෙවන්නට ලැබෙන් නෙත් නැහැ; ගොවීනුත් අන්තරාවේ වැටෙනවා. ඒ අන්දමට ගොඩගැසුණු ණය තමයි කෝටි 6ක් පමණ රජයට අය වීමට තිබෙන්නේ. එසේ තිබියදී තමයි මේ අමුතු ණය ක්‍රමයක් ඇති කළේ. මේ ණය ක්‍රමය යටතේ රුපියල් කෝටි 7 කටත් වැඩි ප්‍රමාණයකට මහජන බැංකුව අනුමැතිය දී තිබෙන බව ලැබී තිබෙන සංඛ්‍යා ලේඛනවලින් පෙනෙනවා. මේ ණය දීමට කටයුතු පිළියෙළ කර තිබෙන්නේ මෙන්න මේ අන්දමටයි. සම්පූර්ණ මුදලම එකවර දෙන්නේ නැහැ. සීසෑමට දෙනවා; බිත්තර වීවලට දෙනවා; ඊළඟට පෝරවලට දෙනවා; පැළ සිටුවනවා නම් ඒ සඳහා දෙනවා. ඒ ක්‍රමයට අවස්ථාවල් අනුවයි ණය දෙන්නට කටයුතු පිළියෙළ කර තිබෙන්නේ. එක එක ප්‍රදේශවල මහජන බැංකු ශාඛාවලට ඉල්លුම් පත්‍ර ලැබී තිබෙන අන්දමට කෝටි 7 කටත් වැඩි ප්‍රමාණයක් සඳහා අනුමතය දී තිබෙනවා. ණය දීම සඳහා කෝටි හතක පමණ මුදලක් බැංකුවෙන් අනුමත කර තිබෙනවා. ඒ මෑලින් කෝටි තුනහමාරක් දැනුත් පිට වී ඉවරයි. වැඩ කටයුතු කෙරෙන කෙරෙන අන්දමටයි, එම ණය දීම කෙරෙන්නේ. මේ ඉටු කරන්නේ සමුපකාර සමිතිවල ඉල්ලීමක්. බැංකුවට එම ඉල්ලීම් ලැබුණාම එක්කෝ ඒ ගැන ප්‍රශ්න කරනවා. එහෙම නැති නම් එම ණය දෙනවා. එසේ නැති නම් ප්‍රතික්ෂේප කරනවා. ප්‍රතික්ෂේප වුණා නම් සමිති එකක දෙකක පමණයි. අනික් සමිතිවලට ණය දීම අනුමතයි. සමුපකාර සමිතියේ ගිණුමක් බැංකුවේ තියෙනවා. එම ගිණුමට ඒ මුදල දමනවා. එයින් පසු වැඩ කෙරෙන කෙරෙන ආකාරයට කොටස් වශයෙන් ණය මුදල දෙනවා. සමිතියේ ගිණුමේ තමයි, ණය මුදල තිබෙන්නේ. දැන් ඒ මුදල්වලින් බාගයක් පමණ ගොවීන් විසින් ලබාගෙන අවසානයි. තුන්වන සහ හතරවන කොටස් මීළඟට ලබා ගන්නවා ඇති.

කෝටි හතක මුදල ගැන මා සඳහන් කළා. ඒ පිළිබඳ විස්තර මා ළඟ තිබෙනවා. එක් එක් දිස්ත්‍රික්කයට අදාළ විස්තර වුවත් දෙන්නට පුළුවනි. එහෙත් මේක ගොවි ණය සම්බන්ධව සාකච්ඡා කරන අවස්ථාවක් නොවෙයි. ඉස්සර ලක්ෂ 4, 5, 6 වශයෙන් බෙදී ගිය දිස්ත්‍රික්කවලට ලක්ෂ 40, 50, 60 ගොස් තිබෙනවා. මගේ කල්පනාවේ හැටියට අනුරාධපුරයට ලක්ෂ 90ක්ද කොහේද ගොස් තිබෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමහර උදවිය ගොවි ණය ලබාගැනීමේදී සිදු වූ සිද්ධීන් පිළිබඳව අනුරාධපුරයේ ගරු මන්ත්‍රීතුමා (රත්නායක මයා.) වුවත් දන්නවා ඇති. [බාධා කිරීමක්] විස්තර කියන්න ගියොත් හුඟක් වෙලා ගත වේවි. [බාධා කිරීමක්] පෝර සම්බන්ධයෙන් පමණක් මගේ කථාව කරන්නට තිබුණ, තමුන්නාන්සේලාගේ කථාත් පෝරවලට පමණක් සීමා කළා නම්. තමුන්නාන්සේලා නොයෙකුත් කරුණු ගැන කථා කළ හෙයින් මා කෙසේද ඒවාට පිළිතුරු නොදී සිටින්නේ?

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

මහජන බැංකුවේ පොළිය වැඩියි නේද? [බාධාකිරීම්]

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

මම පසුව විස්තර දෙන්නම්. හැම දිස්ත්‍රික්කයටම ණය හුඟක් ගොස් තිබෙන බවයි, කියන්නට තිබෙන්නේ. දොම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් කටයුතු කරද්දී මා සිතනවා, ණය පහසුකම් පුළුල් කළාය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රසායන පෝර නොමිලයේ බෙදා දීම

ඒ කාලයේ මුළු අවුරුද්දටම කෝටි තුන හමාරක් විතර යනවාට ඇති. මාස් කන්නයට සහ යල් කන්නයට කෝටි 3.4 ක් පමණ යන්නට ඇති. ඒ ක්‍රමයට ලබා ගන්නා ලද ණය නොගෙවා ඉදලා අන්තිමේ හැත්තෑ දහසට විතර බැස්සාය කියා සිතනවා. ඒ ක්‍රමය තමයි, අමුතු අන්දමකට සකස් කරන්නට අපි බලා පොරොත්තු වුණේ.

අනුමත කර තිබෙන ණය මුදල් ගොවීන්ට නොලැබී යාමට හේතුවක් නැහැ. ඒ මුදල කෝටි හතත් පැනලාය කියන්නට පුළුවනි. කෝටි හතහමාරක් විතර වේවිය කියන එකයි, මගේ කල්පනාව. දෙගුණය කටත් වඩා මුදලක් අනුමත වී තිබෙනවා. එයින් බාගයක් දැනටමත් ගිහින් තියෙනවා. තමුන්නාන්සේලා මොන විධියේ ප්‍රකාශන කළත් ගොවීන් ණය අරගෙන පාවිච්චි කරන බව එයින් පෙනෙනවා.

පෝර ගැන කිව්ව. වෙනදා පාවිච්චි කරන පෝර ප්‍රමාණය මෙන් දෙගුණයක් නැත්නම් තුන් ගුණයක් මේ මාස් කන්නයේ පාවිච්චි කර තිබෙනවා. මේ තරම් පෝර සැපයීම එක වරම කිරීම අපහසු දෙයක් වුණත්, හැම දිස්ත්‍රික්කයකටම පෝර පුළුවන් තරම් සපයා තිබෙනවා. විරුද්ධ පාර්ශ්වයේ ආධාරයත් ගොවීන්ට ලැබෙනවා නම් වැඩය තව පහසු වෙනවා. පෝර පටවන තැන්වල මෑතදී ඇති කර තිබෙන වැඩවර්ජන නිසා අපට පෝර දෙන්නට බැරි වී තිබෙනවා. ගොවීන් කෙරෙහි තමුන්නාන්සේලා තුළ අනුකම්පාවක් තිබෙනවා නම්, කළ යුත්තේ පෝර නිකම් දෙන්නට ඕනෑය කියා යෝජනා කිරීම නොව, වර්ෂාව තියෙන විට ගොවීන්ට පෝර ඕනෑ නේද කියා කල්පනා කර, තිබෙන පෝර ටික ඔවුන්ට ලබා ගැනීමට පුළුවන් වන අන්දමට කටයුතු කිරීම බව මතක් කරන්නට කැමතියි.

මේ රජය ගොවීන්ට දෙන්නට පුළුවන් සෑම ආධාරයක්ම දී, සෑම උපදේශයක්ම දී, ගොවිතැන සම්බන්ධ සෑම දේකටම ඔවුන් සම්බන්ධ කරගෙන කටයුතු කරනවා. ගොවීන් තමයි, ආහාර නිෂ්පාදනය මගින් රට ස්වයංපෝෂිත කරන ප්‍රධාන කොටස. අපේ සම්පූර්ණ බලාපොරොත්තුව තියෙන්නේ ගොවීන් කෙරෙහියි. නොයෙක් නොයෙක් තැන්වල නොයෙක් නොයෙක් උපදේශක මණ්ඩලවලට අප ගොවීන්ගේ නියෝජිතයන් පත් කර ගෙන ඒ අයගේ උපදෙස් ලබා ගන්නවා. නොයෙක් විධියේ තරඟ ඇති කර වටිනා තෑගි ආදිය දෙමින් කටයුතු කරනවා. ගොවි ජනතාවට දෙන්නට පුළුවන් සෑම ආධාරයක්ම දීමට අප වෑයම් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොයි තරම් පෝර ප්‍රමාණයක් ලංකාවට ගෙන්වනවාය කියා තමුන්නාන්සේ කල්පනා කරනවද? බද්දේගම ගරු මන්ත්‍රීතුමාගේ (නීල් ද අල්විස් මයා.) කථාවේදී පෝර ගෙන්වීමට වියදම් වූ විදේශ විනිමය පිළිබඳව ගණන් වගයක් ඉදිරිපත් කළා. 1964 දී කෝටි 5 කට කිට්ටු ගණනක්, 66 දී කෝටි 6 කට කිට්ටු ගණනක්, වියදම් වී තිබෙනවාය කියා ප්‍රකාශ කළා. ඒ ප්‍රමාණය එන්ට එන්ට වැඩි වෙනවා. පෝර භාවිත කිරීමත් එන්ට එන්ටම වැඩි වේගන එනවා. කුඹුරුවලටත්, තේ, රබර්, පොල්, වැවිලිවලටත් අද පෝර හුඟක් පාවිච්චි කරනවා. පසුගිය අවුරුද්දේ කෝටි 10.5 ක පෝර ගෙන්නුවා. කලින් කෝටි 4 ක් නැත්නම් 5 ක් පමණයි වියදම් වුණේ. දැන් ඒ වගේ දෙගුණයක් වියදම් කරනවා. ගෙන්වන පෝර ප්‍රමාණයත් ශීඝ්‍රයෙන් වැඩි වේගන එනවා. සහනදායක ක්‍රමයට කුඹුරු ගොවිතැන්වලට සියයට 50 ක් අඩු වුණාම, මගේ කල්පනාවේ හැටියට පසුගිය අවුරුද්දේ ලක්ෂ 80 ක, 90 ක පමණ සහනයක් තියෙනවා. මේ අවුරුද්දේ ඒ ප්‍රමාණය කෝටියක් පමණ වන්නට පුළුවන්. ඔය සහනය සඳහන් කළේ කුඹුරුවලට දෙන පෝර සම්බන්ධයෙන් පමණයි.

බද්දේගම ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේ තේ, රබර්, පොල් ගැනත් කියා තිබෙනවා.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)
වෙනත් ක්‍රමයක් ඇති කරන්න.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ඒ කියන්නෙත් නිකම් දෙන්නට ඕනෑය කියා නේද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]

මේ යෝජනාවේ මූලික අදහස පෝර නොමිලයේ දීමයි. යෝජනාවේ තිබෙන්නේ මෙහෙමයි :

මෙරට ආහාර වගාකිරීමේ ව්‍යාපාරය දියුණු කිරීමවස්, ආහාර නිෂ්පාදනයෙහි නිරතව සිටින සියලු දෙනාටම නොමිලයේ රසායන පෝර බෙදා දීම අත්‍යවශ්‍යයයිද, තේ, රබර් හා පොල් වතු සම්බන්ධයෙන් ඒ හා සමාන යෝග්‍ය වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතුයයිද, මෙම මන්ත්‍රී මණ්ඩයල අදහස් කරයි."

මේ පාඨයේ තිබෙන හැටියට නොමිලයේ බෙදා දීමයි මුඛ්‍ය පරමාර්ථය වශයෙන් පැහැදිලිව පෙනෙන්නට තිබෙන්නේ.

That is the governing idea, that we should supply, in the first place, to the cultivators and there should be a similar scheme for tea, rubber and coconut. Now, there, we are up against a big problem.

බද්දේගම ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කරමින් කළ කථාව ඕනෑකමින් අසා සිටිද්දී මා තුළ එක්තරා සැකයක් පහළ වූ බව මගේ කථාවේ මුලදීම මා සඳහන් කළ බව තමුන්නාන්සේට මතක ඇති. මෙය ගොවීන්ට ආධාර කරන්නට ගත් උත්සාහයක්ද, එසේ නැත්නම් දැනට ගොවීන් විසින් කරගෙන යනු ලබන වැඩ කටයුතු ටිකවත් හරියාකාර නොකෙරෙන තැනට එහෙම නැත්නම් අඩපණ වන තැනට අමුණා දැමූ කෙක්කක්වත්දැයි සැක හිතුණා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඒ සැකය අත්හැර දමන්න.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
මට ඇති වූ සැකයක් ගැනයි මා සඳහන් කළේ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
අප අවිශ්වාස කරන්නට එපා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
කුඹුරුවලටත් අනෙක් ඒවාටත් කියන ඔය හැම දෙයකටම නොමිලයේ පෝර දෙන්නටයි කියන්නේ. එහෙම කරන් නැයි කියන්නේ දැනට කරගෙන යන වැඩ ටිකත් අවුල් කරන්නටවත්දෝයි සැකයක් මා තුළ ඇති වුණා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ජාතික ධනය වැඩි කරන්නටයි.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා (අගලවත්ත)**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்த)*
(Dr. Colvin R. de Silva—Agalawatta)
තමන්ගේ කෝදුවෙන් අනුන් මනින්නට හදන්න හොඳ නැහැ. දෙපැත්තේම ගරු මන්ත්‍රීන් අවංකව වැඩ කරනවාය, සාකච්ඡා කරනවාය, යනුවෙන් හිතා ගත්තොත් බොහොම ලෙහෙසියි වැඩේ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
මට ඇති වූ සැකයක් ගැනයි මා සඳහන් කළේ. තමුන්නාන්සේ එහෙම සැක කරන්නට එපා කියනවා.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)
ඒක අස්කර ගන්න.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
දැන් අර මුලින් ඇති වූ සැකය තව දුරටත් ටිකක් තහවුරු කර ගන්නට සිද්ධ වෙලා තියෙනවා, මේ යෝජනාවේ ඉතිරි හරිය කියවා බලන විට. අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා මා සමග එකඟ වේවි, ගරු මන්ත්‍රීතුමා කල්පනා කරනවාලු අරක හිම්හිට පිංගවලා ඊට පස්සේ තේ, රබර් සහ පොල් වතුවලටත් නොමිලයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පෝර දීමට වැඩ පිළිවෙළක් ඇති කරන්නට අදහස් ඉදිරිපත් කරන්නට. ඒ සඳහා වැඩ පිළිවෙළක්—"ස්කීම්" එකක්—හදන්නට බලාපොරොත්තු වෙනවා.

එතකොට ඒ අදහස පිළිගත්තා. ඒක තමයි වෙන්නේ. උන්නැහේ කියන්නේ එතකොට නිෂ්පාදනය වැඩි වන බවයි. උන්නැහේ කියන්නේ ඒක නොවෙයිද? එතකොට අපි දැන් කල්පනා කර බලමු, තේ, රබර් සහ පොල් ගැන. තේවලට යම් සහනයක් ලැබී තිබෙනවා. අක්කර 100න් පහළ තේ ඉඩම්වලට සහනාධාර ක්‍රමයක් යටතේ පෝර දෙනවා.

At present fertilizer is issued at a 50 per cent subsidy to all owners of tea land under 100 acres in extent. In the case of tea, a smallholder is reckoned as one who owns 100 acres and less while in the case of coconut, under 20 acres. Approximately 12,000 tons of fertilizer was issued annually under this scheme which is called the Tea Fertilizer Subsidy Scheme. The annual expenditure under this scheme runs to about Rs. 4 million and is met out of the cess levied on tea exports.

In the case of coconut, fertilizer is issued at a 50 per cent subsidy to owners of coconut land under 20 acres in extent and at a 33 1/3 per cent subsidy to owners of coconut land over 20 acres in extent. Approximately 50,000 tons of fertilizer was issued under the Coconut Fertilizer Subsidy Scheme annually at a total cost to Government of approximately Rs. 11 million.

Then, it will be noted that Government already incurs an annual expenditure of Rs. 15 million on subsidies for fertilizer used in the plantation industry. If fertilizer is to be issued free of charge for use in tea, rubber and coconut plantations, then the Government will have to find a further Rs. 70 million annually to finance a scheme of assistance as suggested by the hon. Member.—[*Interruption.*]

අක්කර 100යේ ප්‍රමාණය දක්වා වූ කුඩා තේ වතු හිමියන්ට සියයට 50 ක පෝර සහනාධාරයක් ලැබෙනවා. ඒ සඳහා වියදම් වන මුදල් ප්‍රමාණය මා දැන් කියෙව්වා. පොල්වලටත් ඒ විධියයි. රබර් සම්බන්ධව මෙතැන සඳහන් කර නැහැ. එහෙත් ලැබෙන ප්‍රමාණය මා කිව්වා. පොල්වලට තවත් යම් ප්‍රමාණයක් දෙන්නට පුළුවන්ද යන වග සොයා බැලීමට දැන් රජය පරීක්ෂා කරගෙන යනවා. [බාධා කිරීමක්] ඔව්, "සෙස්" එකක් තමයි. ධනපතින්ගෙන් අරගෙන අනෙක් අයට දෙනවා. ඒකේ වරදක් නැහැනේ. දැන් අපේ බද්දේගම ගරු මන්ත්‍රීතුමා (නීල් ද අල්විස් මයා.) ගොවියෙක් නොවෙයි, වතු හිමියෙක්. [බාධා කිරීම්] මේ දෙක මිශ්‍ර කරන්නට ගොස් එතුමා දැන් විශාල කරදරයකට වැටී සිටිනවා. තමුන්නාන්සේ බොහොම ලක්ෂණයට—සීනි බෝල පෙන්වා බබ්බුන් නළවන්නා වගේ—"මේක බොහොම හොඳයි, ගොවියාට විශාල ආධාරයක්" ආදී වශයෙන් නොයෙක් දේ කියා මේ අදහස් ඉදිරිපත් කළත් ඊට පිටුපසින් තිබෙන්නේ තමුන්නාන්සේට පුරුදු සාමාන්‍ය පරිසරයයි. තමුන්නාන්සේ කල්පනා කරන හැටියට මේ රටේ ආර්ථික පදනම පවත්වාගෙන යන්නේ තේ අනුවයි. තව ටික කලක් ඒ තත්ත්වය පවතිනවා ඇතැයි අපත් කල්පනා කරනවා. මේ යෝජනාව මාතර ගරු මන්ත්‍රීතුමාත් (තුඩාවේ මයා.) බොහෝම සන්තෝෂයෙන් අනුමත කළා. මෙයින් කියැවෙන්නේ කුමක්දැයි දැන් අපි බලමු. තේ, පොල් හා රබර් වතු සම්බන්ධයෙන් මෙහි සඳහන් වන නමුත් කුඩා වතුහිමියන් මෙහි වෙන් කර දක්වා නැහැ. එහෙමවත් තිබුණා නම්, අක්කරය හමාරේ, අක්කර දෙකේ තුනේ කුඩා වතු ගැන කල්පනා කරන්නවත් ඉඩක් අපට ලැබෙනවා. එහෙත්, එවැනි වෙන් කිරීමක් මේ යෝජනාවේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please!—[*Interruption*]. Hon. Members must please note that we have not finished one item yet.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

Sir, the Hon. Minister is filibustering. Now he is going into the history of the tea industry.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

යෝජනාවේ සිංහලයෙන් සඳහන් වී තිබෙන්නේ, "තේ, රබර් හා පොල් වතු සම්බන්ධයෙන්" කියායි. [බාධා කිරීම්] බද්දේගම ගරු මන්ත්‍රීතුමා, රජය විසින් ආහාර නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශයට ඉඩම් දීමේදී නොයෙක් විධියේ අකටයුතුකම් සිදු වී තිබෙනවාය ආදි වශයෙන් නොයෙක් දේ කියමින් බෙරිහන් දීගෙන කෑ ගහනවා. හොඳට පැලපදියම් වූ වතුවලටත් නොමිලයේ පෝර දෙන්ටලු. ආණ්ඩුවෙන් ඉඩම් ලබා ගන්න මිනිස්සු නම් තමන්ගේ මුදලක් වියදම් කරල කැලේ එක්කවත් ඔට්ටු වෙනව. මොනව හරි කරනව. [බාධා කිරීමක්]

**නීල් ද අල්විස් මයා.**
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)

මම උත්තර දෙන්නම්. [බාධාකිරීම්]

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

මේක ගොවි රටක්. [බාධාකිරීම්]

**නීල් ද අල්විස් මයා.**
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)

ඉලෙක්ෂන් කාලෙ ඇපල් දෙනව කිව්ව. [බාධාකිරීමක්]

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

ඇපල් දෙනව කිව්වෙ නැහැ. [බාධා කිරීම්] ගොවි ජනතාවට සහනයක් දෙන ගමන්ම තේ, රබර්, පොල් වතුවලටත් නොමිලයේ පෝර දෙන්නලු. මොන විධියේ වතුවලටද, මොන ප්‍රමාණයේ වතු වලටද, මොන විධියේ අයිතිවාසිකම් ඇති වතුවලටද, කොම්පැණි වතුවලටද ආදි කිසිම විස්තර කිරීමක් මේ යෝජනාවේ නැහැ. තේ, රබර් පොල්වතු [බාධාකිරීම්]

**නීල් ද අල්විස් මයා.**
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)

දැන් වතුවලට ආධාර දෙන්නෙ "සෙස්" වශයෙන් ලබා ගන්න මුදලින් මිස ආණ්ඩුවේ මුදල්වලින් නොවෙයි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

ගරු මන්ත්‍රීතුමා මතක් කළේ බොහොම හොඳ කථාවක්. මොන වැඩකට ගියත් වතුකාර සංගම් නිතරම කරන තර්කයක් තමයි, ඔක. "මේ අපේ සල්ලි; මේක සෙස් එක; මේකට රජය අත පොවන්න එපා" ආදි වශයෙන් වතු හිමියන්ගේ සංගම් නිතරම කියනවා. [බාධා කිරීමක්] මම දවසක් වතුකාර සංගම් රැස්වීමකදී කිව්ව, "තමුන්නාන්සේලා මේ සෙස් එක, සෙස් එක කියා නිතරම කරදර කරනවා; ඔක "ඩියුටි" කියා වෙනස් කරන්ට අමාරුවක් නැහැ" කියා. එතකොට සෙස් කථාව ඉවරයි. තමුන්නාන්සේලාගේ මේ කල්පනාව අනුවත් මගේ ඒ නිගමනය සම්පූර්ණයෙන්ම හරි. වතුකාර සංගමයේ සභාපති කරන කථාව තමයි, බද්දේගම ගරු මන්ත්‍රීතුමාත් දැන් කිව්වෙ.

**නීල් ද අල්විස් මයා.**
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)

වතු ජනසතු කරන්න. [බාධාකිරීමක්]

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

තමුන්නාන්සේ මන්ත්‍රීවරයකු වශයෙන් හොඳ උත්සාහයක් දරනවා. [බාධා කිරීමක්]

**නීල් ද අල්විස් මයා.**
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)

ගැමි ජනතාවගේ ඉඩම්—[බාධාකිරීමක්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Will the Hon. Minister take long? I have to leave at 6 o'clock.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

I have now come to a very relevant part of the hon. Member's Motion. I am only pointing out to him how all these things are caught up in the same Motion. I was rather surprised at the heat generated by the hon. Member for Matara (Mr. Tudawe) when he supported this Motion.

තේ වත්තක් පාලනය කරනව නම්, එයින් ආදායම ලබා ගන්නව නම් තමුන්නාන්සේ මෙහෙම කල්පනා නොකර බැහැ. ඒකයි, වෙලා තිබෙන්නෙ. ඒක මන්ත්‍රීතුමාගේ වරදක් නොවෙයි.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති වගේ නොවෙයි, අපේ ප්‍රතිපත්ති. වතු ජනසතු කරන්න.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

වතු ජනසතු කරන්ට කියා මේ යෝජනාවේ නැහැ. [බාධාකිරීම්] අනම් මනම් ප්‍රශ්න දාන්ට වුවමනා නැහැ. [බාධාකිරීම්] දැනටත් පෝර සහනාධාරයක් තිබෙන බව මම තමුන්නාන්සේට කිව්ව. අක්කර 20 ට අඩු කුඩා පොල්වතු හිමියන්ට පෝර සහනය තිබෙනව. ඒ වගේම අක්කර සියයට අඩු කුඩා තේ වතුවලට පෝර සහනය තිබෙනව. තමුන්නාන්සේ කියන හැටියට තේ වතුවලටයි, රබර් වතුවලටයි, පොල් වතුවලටයි නොමිලයේ පෝර දෙන්ට රුපියල් කෝටි 7 ක් වුවමනා කරනව.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඉතින් ඇයි ජනසතු නොකරන්නෙ?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

මෙතැන නැහැ නොවැ ජනසතු කරන්නටය කියා. තමුන්නාන්සේලා යන යන තැන අපට දෝෂාරෝපනය කරමින් හෙමිහිට වැඩේ කරවා ගන්නට උත්සාහ කරන බවයි මේ යෝජනාවෙන් පෙනෙන්නෙ. බලන්න මේ යෝජනාව.

> මෙරට ආහාර වගා කිරීමේ ව්‍යාපාරය දියුණු කිරීම වස්, ආහාර නිෂ්පාදනයෙහි නිරතව සිටින සියලු දෙනාටම නොමිලයේ රසායන පෝර බෙදාදීම අත්‍යවශ්‍යයයිද,......................... "

ඉතින් අර කොම්පැනිකාරයොත් දැන් ආහාර වගා කරනවා. ඒ අයටත් මේ යෝජනාව අනුව පෝර නොමිලයේ දෙන්නට වෙනවා. [බාධා කිරීම්]

> "...............තේ, රබර් හා පොල් වතු සම්බන්ධයෙන් ඒ හා සමාන යෝග්‍ය වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතුයයිද, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

අප කොහොමද එහෙම අදහස් කරන්නෙ? ඒක කරන්නට ගියොත් වෙන මොනම සහනයක්වත් දෙන්නට නොලැබෙන බව මා ගරු මන්ත්‍රීතුමාට පෙන්වා දුන්නා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

යෝග්‍ය ක්‍රමයක්.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

නොමිලයේ දීම අයෝග්‍යය කියා අප කියනවා. [බාධා කිරීම්]

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

Only the small holdings are entitled to the subsidy.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

Tea estates under 100 acres get a 50 per cent subsidy. Coconut estates

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]
under 20 acres get a 50 per cent subsidy and over 20 acres get a one-third subsidy.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)
Who is financing the subsidy ?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
You are still confirming my observation that you are talking as if you are the chairman of a planters' association.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)
I am not.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
That is so.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)
It is not so.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
මට ප්‍රශ්නයක් අසන්නට තිබෙනවා. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
ප්‍රශ්න අසන්නට බැහැ නොවැ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
තමන්නාන්සේලාගේ ප්‍රශ්නවලට තමයි මා මේ උත්තර දෙන්නෙ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඇමතිතුමා වැරදි විධියට මේ යෝජනාව හඳුන්වා දී තිබෙනවා. පළමුවන කොටසේ තිබෙන්නේ නොමිළයේ සපයන්නය කියායි. නමුත් දෙවන කොටසේ තිබෙන්නේ "ඒ හා සමාන යෝග්‍ය වැඩ පිළිවෙළක්" කියායි.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)
ඔව්, ඉතින් මොකක්ද වෙනස ? [බාධා කිරීම්]

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
මම දන්නවා. තමුන්නාන්සේලා නුපුරුදු ගමන් ගියාම මේ විධියට වල්ගෙ පැගෙනවා. [බාධා කිරීම්] තමුන්නාන්සේට පුරුදු ගමන තමයි තුන් වන පේළියේ තිබෙන්නෙ; තේ වතුවලට. මාතර ගරු මන්ත්‍රීතුමා කීවාක් මෙන් මේ යෝජනාවේ කොටස් දෙකක් නැහැ. මූලික වශයෙන් මෙතැන තිබෙන්නේ එක අදහසයි. නැවත මේ යෝජනාව කියවා බලන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
වෙනසක් තිබෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
"රසායන පෝර නොමිළයේ බෙදාදීම." ඒක තමයි මූලික අදහස.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඒක මේ යෝජනාවට ඇතුළු කළ එකක් නොවෙයි. ඒක මාතෘකාවයි. මාතෘකාව යොදන්නෙ මෙහෙන්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

දුවන්නන් වාලෙ දුවන්න ගියාම ඔක තමයි වෙන්නෙ. දැන් කොමියුනිස්ට් ධර්මයවත් මොකවත් නැහැ මෙතැන.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

ඔය මාතෘකාව යොදන්නෙ යෝජනාව මෙහෙ කාර්යාලයට එවුවාට පසුවයි.

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

මා කථා කරන තුරු තමුන්නාන්සේලා කවුරුවත් මාතෘකාව ගැන කථා කළේ නැහැ. පෝර ටොන් ගණන් තේ වතුවලට නොමිලයේ දෙන විට ගොවියෝ බොහොම සන්තෝෂ වෙයි.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

He is the deputy leader of the L.S.S.P.!

නීල් ද අල්විස් මයා.
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)

You talk bigger than the Hon. Minister at times!

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

අප දන්නවා [බාධාකිරීම්] වත්ත ගත්ත හැටි. වතුකාරයන් සමඟ තිබෙන සම්බන්ධකම් අප දන්නවා. [බාධාකිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please!

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

මේ යෝජනාව මා සිංහලයෙන් කියෙව්වා. එය ඉංග්‍රීසියෙන් තිබෙන්නේ කොහොමදැයි බලමු:

"That this House is of opinion that it is essential that fertilizers should be issued free, to all those persons engaged in producing food, in order to step up the food drive in the country and an appropriate similar scheme should also be evolved for the Tea, Rubber and Coconut plantations forthwith."

ඒක තමයි, තමුන්නාන්සේගේ අදහස. [බාධාකිරීම්] "සෙස්" එකෙන් ගන්න කීමෙන් තමුන්නාන්සේගේ ඒ අදහස පැහැදිලිවම පෙනෙනවා. [බාධාකිරීම්]

මිළඟ යෝජනාවත් බලන්නට ඕනෑ, බොහොම පරෙස්සමෙන්. ඒකෙ ඇතුළේ මොනවා තිබෙනවාද දන්නේ නැහැ. එක් අතකින් කල්පනා කර බලන විට, තේ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා රජය දැනට මත් නොයෙක් පියවර ගෙන තිබෙනවා. එහෙත් තේ වතු සම්බන්ධයෙන් මෙවැනි පියවරක් ගන්නට රජය කල්පනා කරන්නේ නැහැ.

නීල් ද අල්විස් මයා.
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)

තේ වතු ගැන ඕනෑ නැතැයි කියමු. අනෙක් හරිය කරනවා ද? [බාධාකිරීම්]

අ. භා. 6

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please! Will the Hon. Minister of Industries and Fisheries move that the hon. Member for Kopai do take the Chair now?

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන
(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன)
(The Hon. D. P. R. Gunawardena)

I move,

"That the Member for Kopai [Mr. S. Kathiravelupillai] do take the Chair."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, එස්. කතිරවේලුපිල්ලෙ මයා. (කෝපායි) මූලාසනාරූඪ විය.

அதன்பிறகு, உபசபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, திரு. எஸ். கதிரவேலுப்பிள்ளை (கோப்பாய் பிரதிநிதி) தலைமைதாங்கினார்.

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. S. KATHIRAVELUPILLAI [*Member for Kopai*] *took the Chair.*

ගරු එම්. ඩී. බණ්ඩා
*(கௌரவ எம். டி. பண்டா)*
(The Hon. M. D. Banda)

In the course of this Debate, the hon. Member for Baddegama, particularly, ranged about a whole series of ideas in support of his Motion although they were not pertinent to it. He spoke of the cost of living, the prices of various food items, and so on. He accused the Hon. Prime Minister and the Government of creating all sorts of shortages—shortages of food items, consumer articles—as a result of certain policies followed by this Government. In the course of my remarks earlier I said that my hon. Friend is carrying in his mind some of the undigested afterthoughts arising out of what they expressed at the last by-election. There was no need for him to go into all those questions; nevertheless since he has mentioned them it is necessary for me to give a reply from the Government Benches.

He made mention of the fact that so much of foreign exchange was allocated to the private sector. He spoke of the allocation of foreign exchange in respect of so many acres in Moneragala. He mentioned Moneragala and other areas and said that for the development of so many acres in such and such an area so much of foreign exchange had been allocated. He said that this Government has been trying to help the private sector, the estate owners whom he referred to as the *vathukara dhanapathiyo.*

නීල් ද අල්විස් මයා.
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

That is your imagination. I said you are wasting this money. I never mentioned all that.

ගරු එම්. ඩී. බණ්ඩා
*(கௌரவ எம். டி. பண்டா)*
(The Hon. M. D. Banda)

If the hon. Member reads his speech in HANSARD he will not challenge me.

නීල් ද අල්විස් මයා.
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

I challenge the Hon. Minister on that. I never said what he is attributing to me.

ගරු එම්. ඩී. බණ්ඩා
*(கௌரவ எம். டி. பண்டா)*
(The Hon. M. D. Banda)

The hon. Member said the allocations have been made in this manner and that, therefore, these insufficiencies have occurred in the importation of food and other requirements.

නීල් ද අල්විස් මයා.
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

What I said was that your food bill has been cut, on your own admission, for the purpose of development.

ගරු එම්. ඩී. බණ්ඩා
*(கௌரவ எம். டி. பண்டா)*
(The Hon. M. D. Banda)

He spoke as if in the years that he thinks constituted the golden age of Ceylon people had ample quantities of consumer articles. He spoke in that strain.

නීල් ද අල්විස් මයා.
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

I never did.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

That was the purport of his speech. My hon. Friend remembers, and it is good for this House also to remember, what has been often repeated in this House, namely, that when the Bandaranaike Government was formed there was ample foreign exchange available to the country. If I were to mention the figure again, he will say that I am repeating it over and over again. Rs. 120 million in foreign exchange was available.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

You can collect foreign exchange by not having industries, by not having any development, and so on.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

That was in 1956. In 1960-61 it became necessary for the Government of the day to introduce licensing and exchange control. When did we have licensing and exchange control for the first time? In 1960.

I ask my hon. Friends there who are singing the praises of the previous Government—

**තුඩාවේ මයා.**
*(திரு. தூடாவ)*
(Mr. Tudawe)

තමුන්නාන්සේට සිංහල මතක නැති වෙලා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

සිංහලෙන් කියන්නම්. සිංහල මතක නැත්තේ නැහැ.

—why licensing and exchange control became necessary. They have to admit that the country's foreign exchange resources had been run down to such an extent that these measures became necessary.

දැනට අවුරුදු දෙක හමාරකට නැත්නම් තුනකට උඩදී පාරිභෝගිකයන්ට වුවමනා කරන ආහාර හා වෙනත් ද්‍රව්‍ය බොහොම පහසුවෙන් ගන්න පුළුවන්කමක් තිබුණු බවට විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් දැන් උඩ පැන පැන ඝෝෂා කර ගෙන යනවා.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

එදා තිබුණු තත්ත්වයත්, අද තිබෙන තත්ත්වයත් ගැන අප කියන්නට වුවමනා නැහැ. මහජනයා ඒ ගැන දන්නවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

මෙම ආණ්ඩුව හෙළා දකිමින් කථා කළ බද්දේගම ගරු මන්ත්‍රීතුමා (නීල් ද අල්විස් මයා.) "දැන් මිනිසුන්ට කන්නට නැහැ. වුවමනා කරන පාරිභෝගික ද්‍රව්‍ය ගන්නට නැහැ" යනාදී වශයෙන් ඝෝෂාවක් කළා. මට වුවමනා කරන්නේ ඒ තත්ත්වය ගැන පැහැදිලි කර දෙන්නටයි. පිටරටින් ට්‍රැක්ටර් හෝ යන්ත්‍රෝපකරණ හෝ ගෙන්වීමට කටයුතු කර තිබෙනවා නම්, පෞද්ගලික අංශය විසින් ඒවා ගෙන්වනු ලැබුවත්, රජය විසින් ඒවා ගෙන්වනු ලැබුවත් ඒ සියල්ලම යොදවන්නේ ආහාර වගා ව්‍යාපාරය සඳහායි. අප අද මේ තත්ත්වයට වැටී සිටින්නේ ඇයි? 1956 දී බණ්ඩාරනායක මහතාගේ ආණ්ඩුව පිහිටුවන විට පිටරට තිබුණු අපේ විදේශ විනිමය ප්‍රමාණය රුපියල් කෝටි 120 කටත් වැඩියි. ඒ කාලයේ විනිමය පාලනයක් තිබුණේ නැහැ. බලපත්‍ර ක්‍රමයක් යටතේ බඩු ගෙන්වීමට කටයුතු යොදා තිබුණේත් නැහැ. විනිමය වුවමනා තරම් තිබුණු නිසා රටේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය වන බඩු වුවමනා තරම් ගෙන්වීමට පුළුවන්කම තිබුණා. එදා 1956 දී තිබුණු විනිමය ප්‍රමාණය සකසුරුවම් අන්දමින් පාවිච්චි කළා නම් 1960 වන විට විනිමය පාලනයක් ඇති කරන්නටවත්, බලපත්‍ර ක්‍රමයක් යටතේ බඩු ගෙන්වීමට වෙළෙන්දන්ට ඉඩ දීමට නැත්නම් බඩු ගෙන්වීම පිළිබඳ සීමාවන් ඇති කිරීමටවත් වුවමනාවක් වන්නේ නැහැ. එදා විදේශ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]
විනිමය ප්‍රමාණය රුපියල් 120 කෝටිය ඉක්මවා තිබුණු හෙයින් එක්තරා ප්‍රමාණයක බඩු කොටසක් ලංකාවට ආවා. ඒ නිසා එදා පෝලිම් නොතිබුණු බව තමුන්නාන්සේලා දන්නවා ඇති. කාටත් ඉතා පහසුවෙන් බඩු මිළයට ගන්නට එදා පුළුවන් වුණා. හැබැයි, වුවමනාවට වඩා වැඩි බඩු ප්‍රමාණයක් එදා ගෙන්වා ගත්තා.

එදා විදේශ විනිමය තත්ත්වය ඉතාමත්ම හොඳ අඩියක තිබුණු හෙයින් විදේශීය කොම්පැණි හත් අට මාසයකට බඩු ණයට දෙන සවභාවක් පැවතුණා. ඒ අය තුළ කිසි භයක් තිබුණේ නැහැ. කෙටි කාලීන ණයට බඩු දීම වෙළෙඳ ක්‍රමයක්. සමහර උදවිය බඩු විකුණා ඉවර වුණායින් පසුවයි, මුදල් ගෙවන්නේ. ඒ විධියේ පහසුවක් එදා තිබුණා. එහෙත් 1960 වන විට සිදු වුණේ මොකක්ද? ඒ කාලයේ මුදල් ඇමතිවරයා වශයෙන් සිටියේ දෙම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) බව මගේ කල්පනාවයි. ඒ කාලයේදී එතුමා මෙම ගරු සභාවේදී පවත්වන ලද කථා කියවා බලන්නැයි මා විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. ඒ කාලයේ අපේ විදේශ විනිමය වශයෙන් තිබුණේ රුපියල් කෝටි 20 වත් 30 වත් අතර ප්‍රමාණයකුයි. ඒ තරම් තත්ත්වයකට අපේ විදේශ විනිමය ප්‍රමාණය පහළ බැස තිබුණා. එසේ හෙයින් ඉකුත් අවුරුදු තුන තුළ බඩු ගෙන්වන ලද වෙළෙන්දන්ගේ ලැයිස්තුවක් ගෙන ඔවුන් කොතරම් බඩු ප්‍රමාණයක් ගෙන්වා තිබෙනවාදැයි සලකා බලපත්‍ර ක්‍රමයක් ඇති කිරීමට එතුමා පෙළඹුණා. පිටරටින් බඩු ගෙන්වීම සඳහා බලපත්‍ර ක්‍රමයක් ඇතිකිරීමට එතුමාට සිදු වුණා. එසේ ගෙන්වූ බඩුවලින් යම්කිසි ප්‍රමාණයක් අඩුවෙන් ගෙන්වීමටයි අවසරය දුන්නේ. ඒ කියන්නේ විනිමය දුන්නේ යම්කිසි ප්‍රමාණයක් අඩුවෙනුයි. සියයක් දුන් තැනට දුන්නේ 60 යි. එසේ කළේ දෙන්නට විනිමය නැති වූ නිසයි. විනිමය ප්‍රශ්නය බැරෑරුම් වූ නිසා ඔය ක්‍රමය ඇති කළා. එදා තත්ත්වය අනුව ඔය විධියේ තද බැම්මකින් විනිමය ආරක්ෂා කර ගැනීමට අවශ්‍යතාවක් තිබුණේ නැත කියා මා කියන්නේ නැහැ. එහෙත් තමුන්නාන්සේලා නැගිට මේ ගරු සභාවේදීත් පිටත දීත් ඇඟිල්ල දික්කර අවුරුදු 2½ ක් තිස්සේ කළේ මොකක්ද කියා අහන විට පසුගිය කාලසීමාව තුළ සිදු වුණේ කුමක්ද කියන එකත් තමුන්නාන්සේලා හිතන්නට ඕනෑ. 1961 දී විනිමය අඩු වේගෙන ගිය නිසා බැම්ම තද කළාට පසුව, එනම් විනිමය පාලන ක්‍රමයක් ගෙනැවිත් ඒ ඒ ද්‍රව්‍ය අනුව සියයක් ගෙන්වූ තැනට 40, 50, 60 යනාදී වශයෙන් සීමා කළාට පසුව—ඒ හේතුව නිසා—මේ රටට ආවේ අඩු බඩු ප්‍රමාණයක්. ඒ අවස්ථාවේ හැටියට ඒ පියවර ගැනීම හොඳයි. එසේ නොකළා නම් කවුරුත් අමාරුවේ වැටෙනවා. එහෙත් සිද්ධිය ඒකයි. මේ රටේ කඩ සාප්පුවල, ගුදම්වල හා ස්ටෝරුවල රැස්කරගෙන තිබුණු පාරිභෝගික ද්‍රව්‍ය 1961, 1962, 1963, 1964 වන විට ක්‍රම ක්‍රමයෙන් එළියට එන්නට පටන් ගත්තා. කලින් විනිමය පාලන ක්‍රමයක් නැතිව ඕ. ජී. එල්. ලයිසන්ස් ක්‍රමයක් යටතේ ගෙන්වා බඩු ඒ අවුරුද්දේම ඉවර වුණේ නැහැ. ඒවායින් කොටසක් ඉතිරි වුණා. තමුන්නාන්සේලා දන්නා පරිදි "ඇනුවල් සේල්ස්" කියා අවුරුද්දක් පාසා අඩු මිලට බඩු විකුණන ක්‍රමයක් තිබුණා. එහෙත් දැන් ඒවා නැහැ. ඒ කාලයේ ඉතිරිව තිබෙන බඩු අඩු මිලට විකුණා නැවත අලුත් බඩු ගෙන්වනවා.

**නීල් ද අල්විස් මයා.**
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)
සේල්ස් නැද්ද කියා පත්තරය කියවා බලන්න.

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டி. பண்டா)
(The Hon. M. D. Banda)
ඉඩම් සේල්ස් නම් තිබෙනවා.

**නීල් ද අල්විස් මයා.**
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)
සාප්පුවල සේල් ඕන තරම් තිබෙනවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டி. பண்டா)
(The Hon. M. D. Banda)
එහෙනම් විකුණන්නට බැරි පරණ කසිකබල් ඒවා වෙන්න ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විනිමය පාලන ක්‍රමය තදකළ පළමු වැනි අවුරුද්දේම කලින් ගෙනැවිත් තිබුණු බඩු ඉවර වුණේ නැහැ. නොයෙක් නොයෙක් නගරවලත් නොයෙකුත් වෙළඳුන් ළඟත් ගුදම්වල හා ගබඩාවලත් තිබී ටික ටික එළියට එන්නට පටන් ගත්තා. ඒ නිසා විනිමය පාලන ක්‍රමයක් ඇති කිරීම නිසා ඇති වූ ගෙන්වීමේ අඩුව අර ඉතිරිව තිබී ටිකින් ටික එළියට ආ බඩුවලින් පිරිමසා ගත්තා. ඒ අතරම ඒ ඒ ද්‍රව්‍යවල මිල ක්‍රම ක්‍රමයෙන් වැඩිවන්නට පටන් ගත්තා. 1964/65 වන විට තත්ත්වය හුඟක්ම අවදානම් වුණා. දැන් අපි ආපසු හැරී බලමු. බොහෝ දෙනකුගේ කල්පනාව පස්සට යන්නේ නැහැ. එහෙත් එදා පැනනැඟී තිබුණු තත්ත්වය ඒකයි. ඒ විධියට අවුරුදු දෙක තුනක් ගතවන විට, අර ඉතිරිව තිබුණු බඩු ඉවර වන විට, විනිමය පාලන ක්‍රමය යටතේ අඩුවෙන් ගෙන්වන බඩුවලින් ඒ ප්‍රමාණය අනුව අඩුවෙන් පාවිච්චියට ගැනීමටයි අපට සිදු වී තිබෙන්නේ. ඊට පසුව පරණ බඩුවක් කියා එකක් ගන්නට අපට ලැබෙන්නේ නැහැ. ඉතිරිව තිබුණු ඒවා විකිණී ඉවරයි. එතකොට තරමක තදබදයක් එනවා. First half-year and the second half-year යනුවෙන් කියන පිළිවෙළ ගැන තමුන්නාන්සේලා දන්නවා ඇති. එකවරට මුළු අවුරුද්දටම බඩු ගැනීමට විනිමය තිබෙනවා නම් පහසුවක් තිබෙනවා. සමහර විට එහෙම වෙන්නෙත් නැහැ, තේ මිල බැසීම වැනි කරුණු නිසා. එසේ හෙයින් පළමුවන හය මාසයේ විනිමය දීලා ඒක ගෙවෙන්න පෙර දෙවන හය මාසයට දෙනවා. 1967 ජනවාරි වන විට කෝටි 120 කෝටි 20ට විතර බැස්සා. එදා ඉඳලාම උත්සාහ දරන්නේ එම තත්ත්වය සතුටුදායක කර ගන්නටයි. ඒ සඳහා පාරිභෝගික ද්‍රව්‍ය හැකි පමණින් මේ රටේ නිපදවන්නට මහන්සි ගත්තා. ආහාර ද්‍රව්‍ය වේවා, වෙනත් පාරිභෝගික ද්‍රව්‍ය වේවා මේ රටේම නිපදවීම සඳහා වහාම ක්‍රියා කළ යුතුය කියන අවබෝධය අපට තිබෙනවා. එවැනි තත්ත්වයක් පවතිද්දී විනිමය ටික නාස්ති කළාය කියා ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කරනවා නම්, මේ රටේ පාරිභෝගික ද්‍රව්‍ය සොයා ගන්නට ඇති දුෂ්කරතාව ගැන මේ අන්දමට ප්‍රකාශ කරනවා නම්, එය උගුරට හොරා බෙහෙත් කෑමක් වාගෙයි. එක්කෝ ඒ උදවිය තිබෙන තත්ත්වය හරියාකාර අවබෝධ කර ගෙන නැහැ. නැතිනම් එම තත්ත්වය සම්පූර්ණයෙන්ම අමතක කර දමලා. විනිමය තත්ත්වය අසතුටුදායක වන්නට පටන් ගත්තේ අද ඊයේ පටන් නොවෙයි. බොහොම දරුණු අන්දමට විනිමය තත්ත්වය පහත බැස ගෙන ආවා. කොතරම් කරදර සිදු වුණත් ආහාර නිෂ්පාදනය අතින් හා වෙනත් දේ නිෂ්පාදනය අතින් හැකිතරම් දුරට රට ස්වයංපොෂිත කරන්නටයි, අප කල්පනා කරන්නේ. 1960, 1961 දී පටන් ගත් විනිමය පාලන ක්‍රමය අද වන තුරු කර ගෙන යන්නට සිදු වී තිබෙනවා. එම පියවර නොගත්තා නම් තවත් අමාරුවේ වැටෙන්නට තිබුණා. විනිමය බොහෝදුරට පහත බැස තිබිලා නැවතත් නැගගෙන ආවා. දැන් තත්ත්වය සතුටුදායක වීගෙන එන බව පෙනෙනවා. එවැනි තත්ත්වයක් පවතින අතර මේ රටේ නිෂ්පාදන කටයුතු සඳහා ගොවි ජනතාවට දියහැකි හැම රුකුලක්ම දෙන්නට මෙම රජය උත්සාහ දරනවා. ගොවි ජනතාව එම පණිවුඩය භාරගෙන තිබෙනවා. මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවේ මයා.) කීවා ගොවි ජනතාව මේ නිෂ්පාදන කටයුතු කරගෙන යන්නේ රටට තිබෙන ආදරය නිසාය කියා. අපි ඒක පිළිගන්නවා. බද්දේගම ගරු මන්ත්‍රීතුමා (නීල් ද අල්විස් මයා.) මෙම යෝජනාව ඉදිරිපත් කළේ එම පිරිසිදු චේතනාව ඇතුවද යන්න තරමක් සැක සහිත බව සඳහන් කරන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]

සිදු වී තිබෙනවා. තේ, රබර් සහ පොල්වල තත්ත්වය අප දන්නවා. කුඹුරුවල තත්ත්වය අප දන්නවා. ඒවාට නිකම් පෝර දෙන්නට තරම් හැකියාවක් තිබෙනවාද නැද්ද කියන කාරණය එතුමා හොඳාකාර දන්නවා. ගොවි ජනතාවට දෙන්නට පුළුවන් සෑම සහනයක්ම අප දීගෙන එනවා. ගොවි ජනතාව අද ඒ සහනවලින් ප්‍රයෝජන ගෙන කටයුතු කරනවා. රජය රුපියල් 12 ට ගත් වී බුසල දැන් රුපියල් 14 ට ගන්නේ ගොවියාට වැඩි ආදායමක් ලැබෙන්නට වුවමනා නිසයි. තමුන්නාන්සේලා කියන ඔය සෑම සහනයක්ම ගොවීන්ට ලැබෙන්නේ කොයි රටේද කියා මා අහනවා. එවැනි එක රටක්වත් පෙන්වන්නට පුළුවන්කමක් නැහැ. එහෙම රටක් නැහැ.

රාජාසන කථාව පිළිබඳ ස්තුති යෝජනාවට තමුන්නාන්සේලා අතුරු යෝජනාවක් ඉදිරිපත් කළා. ජනපදවල ඉඩම් බද්ද අස් කළ යුතුය, නොමිලයේ ඉඩම් දිය යුතුය, ජනපදවල වතුර සඳහා අය කරන බද්ද අස් කළ යුතුය කියා ඒ සංශෝධනයේ කියා තිබුණා. ගම්පහ මන්ත්‍රීතුමත් (එස්. ඩී. බණ්ඩාරනායක මයා.) ඔළුව වනනවා. ඒ මන්ත්‍රීතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්ති අනුගමනය කරනවාද, නැද්ද කියා මා දන්නෙ නැහැ. එදා තමුන්නාන්සේලා ඒ විධියේ අතුරු යෝජනාවක් ඉදිරිපත් කළා. අද තමුන්නාන්සේලා මේ විධියේ යෝජනාවක් ඉදිරිපත් කරනවා. එහෙත් විරුද්ධ පාර්ශ්වයේ නායිකාව මේ පැත්තේ සිටිද්දී, දොම්පේ ගරු මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) මුදල් ඇමති වශයෙන් සිටිද්දී ඉදිරිපත් කළ තුන් අවුරුදු කෙටි කාලීන වාර්තාවේ මොනවද තියෙන්නෙ? ක්‍රම සම්පාදක මණ්ඩලයේ සාමාජිකයන් හැටියට එදා ඒ වාර්තාවට



අත්සන් කර තිබෙනවා. පෙරවදනකුත් ලියා තිබෙනවා. ලෝකයේ කොයි රටකවත් මේ තරම් අඩු දිය බද්දක් ගන්නෙ නැත, ඉන්දියාවේ තත්ත්වය මෙසේය, දැන් තිබෙන දිය බද්ද මීට වඩා වැඩි කළ යුතුය කියා එහි සඳහන් කර තිබෙනවා. ඒ රජය පිළිගත් ප්‍රතිපත්තිය ඒකයි. අපේ රටේ දිය බද්ද වශයෙන් අය කරන මුදල, වියදම් වන මුදල කැපෙන්නටවත් ප්‍රමාණවත් වන්නෙ නැහැ. ඒක ඇත්තයි. ඒ බද්ද වැඩි කළ යුතු බව ඒ අයම නිකුත් කළ ඒ පොතේ තිබෙනවා.

ඉඩම් බද්ද සම්බන්ධවත් ඒ විධියට තිබෙනවා. ඒ බද්දත් මදිය, ඒකත් හරියාකාර ගෙවන්නෙ නැත, ඒ බද්දෙන් ලැබෙන මුදල යන වියදම කැපෙන්නටවත් ප්‍රමාණවත් නැත කියා ඒ තුන් අවුරුදු කෙටි කාලීන වාර්තාවේ සඳහන් කර තිබෙනවා. මේවා මා ඉදිරිපත් කරන අදහස් නොවෙයි. තමුන්නාන්සේලාගේම වාර්තාවෙන් ඉදිරිපත් කරන අදහස්. මුදල් හදල් තිබෙන කොම්පැනි ආදියට ඉඩම් දී ඒ මාර්ගයෙන් ඉඩම් දියුණු කළ යුතුය කියන අදහසත් ඒ වාර්තාවේ තිබෙනවා. එපමණක් නොවෙයි. අප දී තිබෙන්නේ ආහාර වගාව සඳහා අවුරුදු 25 ක තාවකාලික බද්දක්. එහෙත් ඒ අයගේ කෙටි කාලීන වැඩ පිළිවෙළේ ඒ ඉඩම් දීම සම්බන්ධයෙන් කාල සීමාවක් නියම කර නැහැ. එසේම ඉඩම්වලට පාරවල් සහ වාරි මාර්ග ක්‍රමත් රජය මගින්ම සාදා දිය යුතු බව එහි කියා තිබෙනවා. රාජාසන කථා විවාදයේදී මා මේ කරුණු මතක් කළා. මෙතැනදී මා එය මතක් කරන්නට අදහස් කළේ මේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව ගැන කල්පනා කරලයි. ජනතාව ගැන බොහොම කැක්කුමක් ඇතිව පපුව පලාලේ දෙන්නට ලෑස්ති බවක් පෙන්වා කථා කරමින් රජයට ඉතා සුළු ආදායමක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලැබෙන්නට ක්‍රමයක් තිබෙනවා නම් ඒකත් නැති වන අන්දමින් මේ විධියට යෝජනා ඉදිරිපත් කරනවා.

මේ රටේ වැඩි දියුණුව සඳහා වැඩ කටයුතු සලසා ගැනීම දේශපාලනඥයන්ට හෝ දේශපාලන පක්ෂවලට පමණක් සීමා වූ දෙයක් නොවන බව අවංකවම කල්පනා කර ක්‍රියා කරන්නට කාලය දැන් පැමිණ ඇතැයි මා අදහස් කරනවා. රටේ දියුණුව සඳහා වැඩ කටයුතු කිරීම කාටත් අයිති දෙයක්. මේ ඉදිරිපත් කරන යම් යම් අදහස් ඇත්ත වශයෙන්ම හිතට එකඟව අවංක භාවයෙන් අනූනව ඉදිරිපත් කර මේ රටට යම් පිළිසරණක් දෙන්නට කරන්නක්ද එසේ නැත්නම් අද කෙරෙන වැඩ කටයුතු ටික—රට කෙරෙහි ඇති ආලයෙන්, ඇල්මෙන් හෝ මිල මුදල් අතින් අද තම තමන්ට තිබෙන හොඳ තත්ත්වය නිසා හෝ ගොවි ජනතාවට අත හිත දී ඉදිරියට පැමිණ මේ රටේ නිෂ්පාදන වැඩි කරන්නට කර ගෙන යන වැඩ කටයුතු ටික—තරමක් සාර්ථක ලෙස කෙරෙන මේ කාල සීමාවේදී මේ යෝජනාව ඉදිරිපත් කළේ අවංකවම ඒ ගොවි ජනතාවට ආධාරයක් කිරීමටද, එසේත් නැත්නම් ගොවි ජනතාව සමග ලොකු මිත්‍රත්වයකින් පෙනී සිට, "අපි ඔන්න උඹලාට නොමිලයේ පෝර සැපයීමට යෝජනාවක් ගෙනාවා, ඒක දුන්නෙත් නැහැ ; වතුර දෙන්නැයි කිව්වා, ඒක දුන්නෙත් නැහැ", ආදි වශයෙන් කියන්නටදැයි දන්නේ නැහැ. රජය දෙන ආධාර ගැන තරමක අවබෝධයක් ඇතිව, රටේ සංවර්ධනය, රටේ දියුණුව සඳහා ජාතික ඇල්මකින් සහ ඕනෑකමකින් ඉදිරියට නැඟිටගෙන පැමිණෙන උදවියගේ උනන්දුව මොට කරන්නට ගත් ව්‍යාපාරයක්දැයි කියන්නටත් බැහැ. මේ විධියේ යෝජනාවක් ගෙනැවින් තිබෙන්නේ උනන්දුව වැඩි කරන්නටද එහෙම නැත්නම් තිබෙන ටිකත් අඩපණ කරන්නටදැයි අහන්නට කැමතියි.

මහජන මන්ත්‍රීවරුන් ගෙන එන එක් එක් යෝජනා සහ අදහස් අනුව තම තමන් පසුපස උඩ පැන පැන එන්නට මහජනතාව හැමදාම ලෑස්තියෙන් ඇතැයි තමුන්නාන්සේලා කල්පනා කළොත් තමුන්නාන්සේලාත් අපත් මුළාවේ වැටෙනවා. ඒ කාලය දැන් නම් තරමක් දුරට ඉවර වෙගන එනවා.

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.** (ගම්පහ)
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹா)
(Mr. S. D. Bandaranayake—Gampaha)
ඒක මාත් පිළිගන්නවා.

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
එතකොට අප කරන්නේත්, සෙස්සන් කරන්නේත් මොකක්ද කියන එක මහජනයා කල්පනා කරාවි. ලොකු මිත්‍රත්වයක් ප්‍රකාශ කරන්නට, ලොකු ආධාරයක් කරන්නටයි මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කර හේත්තු කළාම මහජනයා එය විශ්වාස කරාවිද නැද්දැයි කල්පනා කරන්නට ඕනෑ. මගේ අවංක අදහසයි මා ඉදිරිපත් කරන්නේ.

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
ඒක ගරු ඇමතිවරුන්ටත් අවබෝධ වූ එක විශාල දෙයක්.

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
කාටත් අවබෝධ වෙලයි තිබෙන්නේ ඒ කාරණය. දැන් ඒ කට්ටියෙන් පැනලයි මිනිසුන් ජීවත් වන්නේ. මිනිසුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රසායන පෝර නොමිළයේ බෙදා දීම

[ගරු එම්. ඩී. බණ්ඩා]

ගේ අවබෝධය ක්‍රම ක්‍රමයෙන් වැඩි දියුණු වේගන එනවා. මෙහෙම කුමක් නිසා කෙක්කක් ඇඳන්නට කල්පනා කර ඇද්දැයි මහජනයා තේරුම් ගන්නවා.

මෙතැන වතුකාරයින් ගැනත් තිබෙනවා. ලොකු වතුකාරයෝ කවුරුද, සුළු වතුකාරයෝ කවුරුද, අධිරාජ්‍යවාදියෝ කවුරුද ආදි වශයෙන් කියාවි. කොයි රට කවත් නැති ඒවා ඒ විධියට දෙන්නට බැහැ. ගම්පහ ගරු මන්ත්‍රීතුමා මොනවා කියන්නට බලාපොරොත්තුවෙන් බලාගෙන ඉන්නවාදැයි මා දන්නේ නැහැ. එතුමා කථා කරන්නේ නැතැයි කිව්වා. නොයෙක් නොයෙක් රටවල නොයෙක් නොයෙක් විධියේ සහන දෙනවා. අපේ රටේත් නොයෙක් විධියේ සහන දෙනවා. "ප්‍රජාතන්ත්‍රවාදය, ප්‍රජාතන්ත්‍රවාදය, කියමින් බෙරිහන් දුන්නත් තමුන්නාන්සේලා අනුගමනය කරන්නේ මොන ප්‍රජාතන්ත්‍රවාදයක්ද මා දන්නේ නැහැ"යි ඒ ගරු මන්ත්‍රීතුමා කිව්වා. ප්‍රජාතන්ත්‍රවාදී අදහස් අනුව ගොවි ජනතාවගේත් කම්කරු ජනතාවගේත් සහයෝගයත් සම්බන්ධයත් කැමැත්තත් ඇතිව ක්‍රියාත්මක කරගෙන යන නිෂ්පාදන ක්‍රමයක් උඩයි අප දැන් ගමන් කරන්නේ. ගම්පහ ගරු මන්ත්‍රීතුමා නම් සමහර විට ඊට එකඟ නොවෙනවා ඇති. එහෙත් අප ගෙන යන ව්‍යාපාරය එයයි, අපේ ප්‍රතිපත්තිය ඒකයි. එම නිසා, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමය ආරක්ෂා කරන ගමන්ම නිෂ්පාදන කටයුතු සඳහා ගොවි ජනතාවට දෙන්නට පුළුවන් සෑම සහනයක්ම අප දෙනවා. නොමිළයේ හැම දේම දෙන රටක් ලෝකයේ කොහේවත් තිබෙනවාද? තිබෙනවා නම් කියන්න.

**නීල් ද අල්විස් මයා.**
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)

කියන්න, තමුන්නාන්සේ වාඩි වෙන්න.

**ගරු එම්. ඩී. බණ්ඩා**
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)

එක් පැත්තකින් තමුන්නාන්සේලා, "ගොවීන්ගෙන් දිය බද්ද ගන්න එපා, අරක ගන්න එපා, මේක ගන්න එපා," කියනවා. අනෙක් පැත්තෙන්, පෝර නොමිළයේ දෙන්න කියනවා. දැනටමත් මේ රටේ ගොවි ජනතාවට බොහෝ පහසුකම් ලැබී තිබෙනවා. ගොවීන්ගේ ආදායම් තත්ත්වය බොහෝ දුරට සතුටුදායක වී තිබෙනවා. තව ඉදිරියට ඊටත් වඩා සතුටුදායක වෙනවා ඇති. ගොවි ජනතාවගේ සහයෝගය අපට ලැබෙනවා. ඔවුන්ගේ උනන්දුවත් රට කෙරෙහි ඔවුන් තුළ ඇති ලැදිකමත්, ඔවුන් නිසාම මේ රට ස්වයංපෝෂිත වන තෙක් පමණක් නොව ඊට පසුත් දිගටම පවතිනවා ඇතැයි අප කල්පනා කරනවා.

මේ යෝජනාව තිබෙන්නේ අපට පිළිගන්නට පුළුවන් තත්ත්වයක නොවෙයි. මුදල් අතින් මේ රටේ සරුසාර ගතියක් තිබුණා නම් මෙවැනි සහනයන් අප හැම විටම ගොවි ජනතාවට දෙනවා. එහෙත්, එවැනි තත්ත්වයක් අද මේ රටේ නැති බව තමුන්නාන්සේලා පිළිගත යුතුයි. 1956 තත්ත්වයෙන් අප දියුණු වුණා නම් ගොවි ජනතාවට නොයෙක් විධියේ සහනයන් දෙන්නට තිබුණා. අතේ මිටේ කාසි තිබෙන අවස්ථාවේදී තමුන්නාන්සේලා කිසිම දෙයක් ගොවි ජනතාවට දුන්නේ නැහැ. අප මේ අමාරු තත්ත්වයෙන් යන්තම් දනිපනි ගසා නැගිටින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නට හදන විට තමුන්නාන්සේලා "අරක දීපන්, මේක දීපන්", කියනවා. ගොවි ජනතාවගේ සහයෝගය නිසා වැඩි කල් නොගොස්ම මෙවැනි යෝජනා ගැන කල්පනා කර බලන්නට අපට පුළුවන් වන කාලයක් එයි. ඒ කාලය ළඟා කර ගන්නට අප බොහෝම උත්සාහ දරනවා. ඒ සඳහා ගොවි ජනතාවගේ සම්පූර්ණ සහයෝගය අපට ලැබෙනවා. ඒ ගැන සැකයක් නැහැ. එහෙත්, දෙපැත්තටම ඇදෙන විධියට ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාව ගොවි ජනතාවගේ ප්‍රශ්න විසදීමට ගෙනාවාද වතු හිමියන්ගේ ප්‍රශ්න විසඳීමට ගෙනාවාද යන වග මා දන්නේ නැහැ. මේ තත්ත්වය අනුව අපට මේ යෝජනාව බාර ගන්නට බැරි බව පමණක් මා ප්‍රකාශ කරනවා.

අ. භා. 6.35

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කෘෂිකර්ම ඇමතිතුමා පැය ගණනක් මේ යෝජනාව ගැන කථා කළා. ඒ කථාව මෙම ගරු සභාවෙන් පිටතදීත් එතුමන්ලාගෙන් අපට අසන්නට ලැබෙන විධියේ එකක්. මේ යෝජනාවෙන් මා කියා සිටින්නේ ගොවි ජනතාවට නොමිලයේ පෝර බෙදා දීම අවශ්‍ය බවයි. ඒ පිළිබඳව කරුණු මා මුලදී ඉදිරිපත් කළා. ඒ වාගේම, තේ, පොල් රබර්; වතු සම්බන්ධයෙනුත් යෝග්‍ය වැඩ පිළිවෙළක් කල්පනා කර බලා යොදන ලෙසයි මා ඉල්ලා තිබෙන්නේ. එක්තරා අක්කර ගණනකින් පහළ තේ, පොල්, රබර් කුඩා වතු හිමියන්ට පෝර සහනාධාරයක් ලැබෙන බව ගරු ඇමතිතුමාගේ පිළිතුරු කථාවෙන් ප්‍රකාශ වුණා. ඒ වාගේම, ඒ සහනය ආණ්ඩුවෙන් ලැබෙන එකක් නොවන බවත්, ඒ ද්‍රව්‍යයන් යම් කිසි බර ප්‍රමාණයක් පිටරට පැටවීමේදී එයින් ආණ්ඩුව ලබා ගන්නා මුදලින් දෙන සහනයක් බවත් එතුමාගේ කථාවෙන් කියැවුණා. එය "ඩියුටි" එකක් වෙන්න පුළුවනි, "සෙස්", එකක් වෙන්න පුළුවනි. [බාධාකිරීම්] යෝග්‍ය වැඩ පිළිවෙලක් යොදන්න කියා මම මේ යෝජනාවේ සඳහන් කළේ ලොකු අදහසක් අනුවයි. අද තමුන්නාන්සේලා "සෙස්" වශයෙන් අය කර ගන්න සත හතරෙන් පහෙන් කුඩා වතුවලට සහන මිලට පෝර දුන්නත් එයින් ප්‍රයෝජන ගන්නේ ලොකු වතු බව මතක් කරන්ට ඕනෑ. [බාධාකිරීමක්] කරුණාකර මට කථා කරන්ට ඉඩ දෙන්න. තමුන්නාන්සේලාට මේක නොතේරුණාට මේක විහිළුවකට භාර ගන්ට එපා. අපේ රටේ තේ පොල් රබර් වගාව ගැන කල්පනා කරන විට අපට පෙනී යන කරුණක් තමයි, අවුරුදු ගණන් පෝර නොදැමීම නිසා මේ රටේ වතු අක්කර විශාල ගණනකින් ප්‍රයෝජන නොලැබී යන තත්ත්වයක් ඇති වී තිබෙන බව. මේ සඳහා වියදම් වන මුදල ආණ්ඩුවට "ඩියුටි" එකක් හෝ "සෙස්" එකක් මඟින් සොයා ගන්න පුළුවන්. නොමිලයේ පෝර දුන්නාම ඒක හොරකම් කරන්නෙ නැහැ. පෝර කන්නෙ නැහැ. ඒක යන්නෙ වගාවටයි. එයින් ප්‍රයෝජන ලැබෙන්නෙ රටට බව මතක් කරන්ට කැමතියි. [බාධාකිරීමක්] මම කියන්නෙ පෝර නොමිලයේ දුන්නට ඩියුටි එකක් මාර්ගයෙන් ඒ වියදම් වන මුදල අය කර ගන්න පුළුවන් බවයි. යෝග්‍ය වැඩ පිළිවෙලක් කියා මා යෝජනාවෙ සඳහන් කළේ ඒ නිසයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

ඒ හා සමාන යෝග්‍ය.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

දැන් ආහාර ඇමතිතුමා මෙපමණ වේලාවක් කථා කරමින් පෙන්වා දුන්නෙ කුඩා තේවතුවලටත්, කුඩා රබර්වතුවලටත්, කුඩා පොල්වතුවලටත් ආණ්ඩුව සහන ක්‍රමයට දැනටත් පෝර දෙනවාය කියායි. එහෙත් සහනය සඳහා යන වියදම ලබා ගන්නෙ "සෙස්" එකෙන්. කාටත් නොමිලයේ පෝර දුන්නාම මොන ක්‍රමයකින් හරි ඒ සඳහා වියදම් වන මුදල එකතු කර ගන්න පුළුවනි. පෝර වැඩිපුර යෙදීමෙන් අපේ වගාවන්ගෙන් ඉදිරියට නියම ප්‍රයෝජන ලබා ගන්ට පුළුවන්ය කියන අදහසින් තමයි, මම මේ යෝජනාව ඉදිරිපත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කළේ. අපි අවංකව යෝජනාවක් ඉදිරිපත් කළාම පැය දෙක-තුනක් කථා කරල නරක අදහසකින් වැරදි අදහසකින් එය ඉදිරිපත් කර තිබෙනවා යයි මේ ගරු සභාවට පෙන්වා දෙන්ට තැත් කිරීම ඉතාමත් කණගාටුදායක කාරණයක් බව මතක් කරන්ට ඕනෑ.

අපේ ගොවි මහත්වරුන්ට සහනයක් ලබා දෙන අදහසින් මම මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නෙ. අද මුදල් ණයට ගන්ට කොයිතරම් ක්‍රම තිබුණත් මුදල් නැති උදවිය ගම්බදව ඕනෑතරම් සිටිනව. පෝර යොදන්න මුදල් නැතිකම නිසා පෝර නොයොදා වැඩ කරන විශාල බිම් ප්‍රමාණයක් රටේ තිබෙනව. නොමිළයේ පෝර සපයා දෙනව නම් සාර්ථක අන්දමට වගා කටයුතු කරගෙන යන්ට පුළුවන් යයි මා කල්පනා කරනව.

තේ පොල් රබර් අපේ ජාතික වස්තූන් බව ගරු අගමැතිතුමාටත්, ඇමතිතුමාටත් මතක් කරන්ට ඕනෑ. වතුවලට පෝර දමා ඒවා ප්‍රවේසම් කර ගත්තොත් මේ රටට යහපත් අනාගතයක් ඇති වෙනව. නොමිළයේ පෝර දෙන්ට යෝග්‍ය වැඩ පිළිවෙලක් යොදන්ට යයි යෝජනාවේ සඳහන් කළාම තමුන්නාන්සේලාට පුළුවන් කම ලැබෙනව, නොමිළයේ පෝර දීල ඒ සඳහා යන වියදම ධනපති වතුකාරයින්ගෙන් බද්දක් හැටියට අය කර ගන්න ක්‍රමයක් සකස් කරන්න. අද පෝර නොදමන විශාල වතු තිබෙනව. පෝර නොමිළයේ දෙනවා නම් ඒවාටත් පෝර වැටෙනව. ඒ අදහස අනුවයි මම මේ යෝජනාව ඉදිරිපත් කළේ. යෝග්‍ය කියන වචනය මේ යෝජනාවට මම ඇතුළත් කළෙත් ඒ නිසයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
නොමිළයේ—

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

යෝග්‍ය ක්‍රමයකට නොමිළයේ. ගරු ආහාර ඇමතිතුමා පැය ගණනක් තිස්සේ කථා කරමින් කීවේ මොනවාද? කුඩා තේ පොල් රබර් වතුවලට අද අපි ඒ වැඩ පිළිවෙල යොදා තිබෙනව යයි එතුමා කිව්ව. ඒක ඇත්ත. එහෙත් ඒ සඳහා වියදම් වෙන්නෙ ආණ්ඩුවේ මුදල් නොවෙයි. තේ පොල් රබර් මේ රටෙන් පිටරට පටවන විට "සෙස්" එකක් අය කරල තමයි, ඒ සහනය සලසා තිබෙන්නෙ. ඒ වගේම නොමිළයේ පෝර දුන්නාම කවුරුත් වතුවලට පෝර දාන්න පටන් ගන්නව. එවිට ඉදිරියට මේ වතු ටික අපි ජනසතු කළත් අපේ රටට එයින් ප්‍රයෝජනයක් ලැබෙනව.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

නොමිළයේ පෝර දීල වතු ජනසතු කරන්ටද කියන්නෙ?

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல். டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

තමුන්නාන්සේලාට අප කියන දේ නොතේරුණ පලියට මේව නිකම් විහිළු හැටියට සළකන්ට එපා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මගේ යෝජනාව දැන් මා ඉදිරිපත් කර තිබෙනවා. මා ඉදිරිපත් කර ඇති එම යෝජනාව ගැන ආණ්ඩු පක්ෂයෙන් ගරු ඇමතිවරයකු කථා කළා. එතුමා මෙය විහිළුවට කාරණයක් බව ඇඟවෙන විධියට කථා කිරීම ගැන මා කනගාටු වෙනවා. යම් කිසි වැඩක් ගැන අප අවංක ලෙස යෝජනාවක් ඉදිරිපත් කළ අවස්ථාවේදී අප නරක අදහ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සින් මෙවැන්නක් ඉදිරිපත් කළාය යන හැඟීම පළ වන සේ එතුමා කථා කළා. ඒ ගැන රටට අවබෝධ කර දීමට අපටත් පුළුවනි. අපේ මතය අනුව අප එය රටට අවබෝධ කර දීමට උත්සාහ කරනවා. අපේ රටේ ධනය ආරක්ෂා කිරීම සඳහා, අපේ වගාව දියුණු කර ගැනීම සඳහා, මේ කාරණය බොහෝ සෙයින්ම උපයෝගී වන බව අපගේ අවබෝධය නිසයි මා මෙම යෝජනාව මෙම ගරු සභාවට ඉදිරිපත් කෙළේ.

ප්‍රශ්නය විමසන ලදී.

කටහඬවල් අනුව විරුඬ මන්ත්‍රීන්ට ජය බව මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

வினா விடுக்கப்பெற்றது.

குரல்களின்படி இல்லை என்றவர்களுக்கு வெற்றியென தலைமை தாங்கிய அங்கத்தவரால் பிரகடனப் படுத்தப்பட்டது.

*Question put.*

MR. PRESIDING MEMBER, *having collected the Voices, declared that the Noes had it.*

**ලක්ෂ්මන් ජයකොඩි මයා.** (දිවුලපිටිය)
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலப்பிட்டிய)*
(Mr. Lakshman Jayakody—Divulapitiya)

Divide !

**මන්ත්‍රී මණ්ඩලය 48 වන ස්ථාවර නියෝගය යටතේ—පක්ෂව 7 ; විරුද්ධව 21 ; යනුවෙන්—බෙදුණේ ය.**

சபை, 48 ஆம் நிலையற் கட்டளையின் கீழ் பிரிந்தது. சார்பாக 7 ; எதிராக 21.

*The House divided (under Standing Order No. 48) : Ayes 7 ; Noes 21.*

## ට්‍රැක්ටර් හා ගොවි උපකරණ ලබා දීම

### உழவு இயந்திரங்களும் கமத்தொழிற் கருவிகளும் வழங்குதல்

### ISSUE OF TRACTORS AND AGRICULTURAL IMPLEMENTS

අ. භා. 6.45

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මගේ නමින් තිබෙන දෙවැනි යෝජනාව මා දැන් ගරු සභාව ඉදිරියේ යෝජනා කරන්නට බලාපොරොත්තු වෙනවා :

"ට්‍රැක්ටර් සහ සියලුම ගොවි උපකරණ රජයේ ප්‍රයෝජනය සඳහා, රජය මගින් ආනයන කළ යුතු අතර—

(i) එම ට්‍රැක්ටර්වල ක්ෂය පිරිවැය හා නඩත්තු පිරිවැය පමණක් ලැබෙන පරිදි සාධාරණ හා යුක්ති සහගත මිළකට එම ට්‍රැක්ටර් කෘෂිකාර්මිකයින්ට කුලියට දීමට ; හා

(ii) ගොවි උපකරණ ගත් මිළට ලබා දීමට, රජය විධිවිධාන යෙදිය යුතුයයි, මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරයි."

මගේ පළමු යෝජනාවේදීද මේ සම්බන්ධයෙන් කරුණු කීපයක් ඉදිරිපත් කළා. ගොවීන්ට වුවමනා ගොවි උපකරණ, ට්‍රැක්ටර් ආදිය දැනට සාධාරණ මිලකට ගාස්තුවකට ලබාගැනීමට නොහැකි නිසා ඒවා ලබාදීමේ මාර්ගයක් සලසා දීමේ අදහසිනුයි මෙම යෝජනාව ඉදිරිපත් කරන්නෙ. ගොවි මහතුන් කොපමණ මහන්සි වී වැඩ කළත්, අස්වැන්න වැඩි කළත් එයින් ප්‍රයෝජන ලබන්නෙ පිට සිටින ජාවාරම් කාරයින් බව විශේෂයෙන් මතක් කර දෙන්න ඕනෑ. ඒ හැරෙන්නට, අපට ඊයෙ පෙරේදා පත්‍ර මාර්ගයෙන් දැනගන්න ලැබුණා මේ ආණ්ඩුවම ට්‍රැක්ටර් කොමිෂන් එකක් පත් කරන්න යන බව. මේ රටට ට්‍රැක්ටර් ගෙන්වන සමාගමක "සබ් ඒජන්ට්" කෙනෙකුට රුපියල් දාහක් එක් ට්‍රැක්ටරයකින් ලැබෙනවා නම් ට්‍රැක්ටර් ගෙන්වන්නන්ට කොපමණ මුදලක් ලැබෙනවාද ? සාධාරණ මිලකට ට්‍රැක්ටර් ලබාගන්න බැරි නම්, ගොවීන්ට වැඩි කුලියක් ට්‍රැක්ටර් සඳහා ගෙවන්න සිදු වෙනවා නම් කොහොමද ගොවිතැන දියුණු කරන්නෙ ? එමනිසා ජාවාරම් කාරයින් ගෙන යන මේ වැඩ පිළිවෙළ නිසයි මෙබඳු යෝජ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නීල් ද අල්විස් මයා.]
නාවක් අප ඉදිරිපත් කරන්නෙ. අද ආණ්ඩුවේ මේ වැඩ පිළිවෙළ නිසා වවන්නෝ හිඟන්නෝ වී තිබෙනවා; ආණ්ඩුව ජාවාරම් කාරයින්ට ඉඩ දීම නිසා අද වවන්නෝ හිඟන්නෝ වී සිටිනවා.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

විසින් ස්ථිර කරන ලදී.
*அனுவதித்தார்.*
*seconded.*

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.** (මීගමුව)
*(திரு. என். டென்சில் பெர்னண்டோ—நீர்கொழும்பு)*
(Mr. N. Denzil Fernando—Negombo)
There is no Quorum, Sir.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන් බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

*சபை கணிக்கப்பட்டு நிறைவெண் இன்மையால், பிரிவு மணி அடிக்கப் பணிக்கப்பட்டது.*

*House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

## කල් තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

**පසුව ගණපූරණයක් නොතුබූයෙන්, මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් 11 වන ස්ථාවර නියෝගය යටතේ, ප්‍රශ්නය නො විමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.**

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අ. භා. 6.50 ට 1968 ජනවාරි 11 වන බ්‍රහස්පතින්දා අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.**

*பின்னர் நிறைவெண் சேராததனால் தலைமை தாங்கும் அங்கத்தவர் அவர்கள், நிலையற் கட்டளை இல. 11 இன்படி வினவின்றிச் சபையை ஒத்திவைத்தார்கள்.*

*இதன்பின் பி. ப. 6.50 க்கு 1968, ஜனவரி 11, வியாழக்கிழமை பி. ப. 2 மணிவரை சபை ஒத்திவைக்கப்பட்டது.*

*Later, a Quorum not being present,* MR. PRESIDING MEMBER *adjourned the House, without Question put, under Standing Order No. 11.*

*Adjourned accordingly at 6.50* P.M. *until 2* P.M. *on Thursday, 11th January, 1968.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

## வினுக்களுக்கு எழுத்துமூல விடைகள்

## WRITTEN ANSWERS TO QUESTIONS

### පොතුපිටියට හා වැද්දාගලට ටෙලිෆෝන් පහසුකම්

### பொத்துப்பிட்டியவுக்கும் வெத்தாகலவுக்கும் தொலேபேசி வசதிகள்

### TELEPHONE FACILITIES FOR POTHUPITIYA AND VEDDAGALA

411/67

ඒ. පිලපිටිය මයා. (කලවාන)

(திரு. ஏ. பிலப்பிற்றிய—கலவான)

(Mr. A. Pilapitiya—Kalawana)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සන්දේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කලවාන ආසනයේ පිහිටි පොතුපිටිය හා වැද්දාගල යන තැපැල් කාර්යාලයනට ටෙලිෆෝන් පහසුකම් ඉල්ලා අවුරුදු කීපයක් ගතවූ බව එතුමා දන්නවාද ? (ආ) "ඒ" ශ්‍රේණියේ තැපැල් කාර්යාලයක් සහ රජයේ රෝහලක් ඇති පොතුපිටිය ප්‍රදේශයට ටෙලිෆෝන් පහසුකම් නොමැතිවීමෙන් ඒ අවට වෙසෙන විසි දහසක ජනතාවට ඇති අවහිරය එතුමා දන්නවාද ? (ඉ) ජාතික රජය බලයට පත්වුනදා සිට මේ වනතුරු කලවාන ආසනයේ කිසිදු ස්ථානයකට ටෙලිෆෝන් පහසුකම් ලබාදී නැති බවත් එතුමා දන්නේද ? (ඊ) එබැවින් වහාම වැද්දාගල හා පොතුපිටිය තැපැල් කාර්යාලයන්ට ටෙලිෆෝන් පහසුකම් ලබාදීමට කටයුතු කරනවාද ? (උ) එසේ නම්, කවදා සිටද ?

—

அரசாங்கக் கட்டுவேலே, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினு: (அ) கலவானேத் தொகுதியிலுள்ள பொத்துப்பிட்டிய, வெத்தாகல ஆகிய தபால் நிலேயங்களுக்கு தொலேபேசி வசதிகோரிப் பல ஆண்டுகள் சென்றுள்ளதை அவர் அறிவாரா? (ஆ) "ஏ" தர தபால் நிலேயமும் அரசாங்க மருத்துவமனேயும் உள்ள பொத்துப்பிட்டிய பகுதிக்குத் தொலேபேசி வசதி இன்மையால் அப்பகுதியில் வாழும் இருபதினுயிரம் மக்களுக்கு ஏற்பட்டுள்ள இடையூறை அவர் அறிவாரா? (இ) தேசிய அரசாங்கம் அதிகாரத்திற்கு வந்த நாட் தொடக்கம் இதுவரை கலவானேத் தேர்தல் தொகுதியில் எந்த இடத்திற்கும் தொலேபேசி வசதி ஏற்படுத்தப்படவில்லே யென்பதையும் அவர் அறிவாரா? (ஈ) எனவே, உடனே வெத்தாகல பொத்துப்பிட்டிய ஆகிய தபால் நிலேயங்களுக்குத் தொலேபேசி வசதியைப் பெற்றுக்கொடுக்க அவர் நடவடிக்கை எடுப்பாரா? (உ) அவ்வாறெனில், எப்போதிருந்து?

asked the Minister of Public Works, Posts and Telecommunications: (a) Is he aware that it is many years since a request was made for telephone facilities for the Pothupitiya and Veddagala Post Offices in the Kalawana Electorate ? (b) Is he aware of the inconvenience caused, due to the lack of telephone facilities, to a population of twenty thousand in the Pothupitiya area where there is an "A" grade post office and a Government hospital ? (c) Is he also aware that up to date no telephone facilities have been provided to any place in the Kalawana Electorate since the National Government came into office ? (d) Therefore, will he take steps to provide telephone facilities immediately to Pothupitiya and Veddagala Post Offices ? (e) If so, from when ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**විජයපාල මෙන්ඩිස් මයා. (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. விஜயபால மெண்டிஸ்—அரசாங்கக் கட்டுவேலை, தபால் தந்திப் போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. Wijayapala Mendis—Parliamentary Secretary to the Minister of Public Works, Posts and Telecommunications)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) නැත. ටෙලිෆෝන් පහසුකම් නිගමනය කරනු ලබන්නේ ඡන්දදායක කොට්ඨාශ අනුව නොවේ. ටෙලිෆෝන් පහසුකම් සැපයීමේදී වෙනත් කරුණු අතර, වැඩ ප්‍රමාණය, වියදම හා ලැබී ඇති අරමුදල් ප්‍රමාණය ගණන් ගනු ලැබේ. (ඊ) නැත. අනෙකුත් මෙවැනි කාර්යාල සමග සලකා බලන අතර, 1966/67 සිට 1969/70 දක්වාවූ සිව් අවුරුදු සැලැස්ම යටතේ ටෙලිෆෝන් හා විදුලි පණිවුඩ පහසුකම් සැලසීම සඳහා කටයුතු කිරීමට බලාපොරොත්තුවනු ලැබේ. (උ) මෙය පැන නොනගී.

(*a*) Yes. (*b*) Yes. (*c*) No. Telephone facilities are not determined on Electoral basis. Traffic demands, cost and availability of funds, amongst others determine the provision of telephone facilities. (*d*) No. These Sub-Post Offices will be considered along with the others and it is expected that these will be taken up for the provision of telegraph and telephone facilities under the four year plan from 1966/67 to 1969/70. (*e*) Does not arise.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපැලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம்; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org